255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ බොරලැස්ගමුව නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2008 වාර්ෂික තක්සේරුව/ සත්‍යෝක්ෂණය 2019 වර්ෂය සඳහා තක්සේරුව/ සත්‍යෝක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත නගර සභා පනතේ 160 වගන්තියෙහි (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් නේවාසික 6%, වානිජ 8% ක වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2019 වර්ෂයේ පළමුවැනි, දෙවැනි, තෙවැනි සහ සිවුවැනි කාර්තුවල වරිපනම් බදු පිළිවෙලින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි හෝ ඊට පෙර අදාළවන පරිදි ගෙවා අවසන් කළ යුතු බවත්, එසේ නොගෙවනු ලබන වරිපනම් බදු වෙනුවෙන් දේපළ ස්වභාවය අනුව පිළිවෙලින් 20% (විස්සක) හා 15% (පහළොවක) අධි ගාස්තුවක් අය කිරීමටත්,

තවද, 2019 ජනවාරි මස 31 වන දින ප. ව. 3.00ට හෝ ඊට පෙර මුලු වර්ෂයටම වරිපනම් ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් 10% (දහයක) වට්ටමක් ද, එම මුදල් කාර්තුව වශයෙන් ගෙවන විට කාර්තුවේ පළමු මස තුළ ගෙවනු ලැබුවහොත් ගෙවනු ලබන මුදලින් 5% (පහක) වට්ටමක් ද ලබා දෙන බවටත් යෝජනා කරමි.

ඉහත කී උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2019 මාර්තු 31 ට පෙර	ජනවාරි මස 31
දෙවන කාර්තුව	2019 ජුනි 30ට පෙර	අප්‍රේල් මස 30
තුන් වන කාර්තුව	2019 සැප්තැම්බර් 30ට පෙර	ජූලි මස 31
හතරවන කාර්තුව	2019 දෙසැම්බර් 31 ට පෙර	ඔක්තෝබර් 31

12-40/9

බොරලැස්ගමුව නගර සභාව

2019 වර්ෂයට අදාළව සේවා සඳහා ගාස්තු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයට අදාළව සේවා සඳහා ගාස්තු පැනවීම 2018 ඔක්තෝබර් මස 23 වැනි දින, යෝජනා අංක 05-05 යටතේ බොරලැස්ගමුව නගර සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශබන්දු කේ. ඩී. අරුණ ප්‍රියශාන්ත,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2018 ඔක්තෝබර් මස 23 වැනි දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

ගලි බවුසරය		මි ල ගණන්
බල ප්‍රදේශය තුළ - නේවාසික	මුදල	2,500 0
	තැන්පත්	450 0
	ඉන්ධන	200 0
	NBT	50 0
		3,200 0
බල ප්‍රදේශය පිටත - නේවාසික	මුදල	3,500 0
	තැන්පත්	450 0
	ඉන්ධන	200 0
	NBT	70 0
		4,220 0
රාජ්‍ය බල ප්‍රදේශය තුළ	මුදල	2,500 0
	තැන්පත්	450 0
	ඉන්ධන	200 0
	NBT	50 0
		3,200 0
රාජ්‍ය බල ප්‍රදේශයෙන් පිටත	මුදල	3,000 0
	තැන්පත්	450 0
	ඉන්ධන	200 0
	NBT	50 0
		3,700 0
කර්මාන්ත බල ප්‍රදේශ තුල	මුදල	4,500 0
	තැන්පත්	450 0
	ඉන්ධන	200 0
	NBT	90 0
		5,240 0
කර්මාන්ත බල ප්‍රදේශයෙන් පිටත	මුදල	5,500 0
	තැන්පත්	450 0
	ඉන්ධන	200 0
	NBT	110 0
		6.260 0

ව්‍යාපාරික බල ප්‍රදේශ තුළ	මූදල	5,000 0
	තැන්පත්	450 0
	ඉන්ධන	200 0
	NBT	110 0
		5,760 0
ව්‍යාපාරික බල ප්‍රදේශයෙන් පිටත	මූදල	5,500 0
	තැන්පත්	450 0
	ඉන්ධන	200 0
	NBT	110 0
		6,260 0

12-40/10

බොරලැස්ගමුව නගර සභාව

2019 වර්ෂයට අදාළව ආදාහනය කිරීම සඳහා ගාස්තු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයට අදළව ආදාහනය කිරීම සඳහා ගාස්තු පැනවීම 2018 ඔක්තෝබර් මස 23 වැනි දින, යෝජනා අංක 05-04 යටතේ බොරලැස්ගමුව නගර සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශබන්දු කේ. ඩී. අරුණ ප්‍රියශාන්ත,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2018 ඔක්තෝබර් මස 23 වැනි දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ආදාහනාගාරය	මිල ගණන්
බල ප්‍රදේශය තුළ	4,500 0
බල ප්‍රදේශය පිටත	7,000 0
සමෘද්ධිලාභීන්ට	3,500 0

12-40/11

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නාගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මහා නගර සභා වෙත කරන ලද නියමය ප්‍රකාර හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම් වශයෙන් 2018 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම්, 2019 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම් වශයෙන් පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමෙන් සියයට දෙළහ (12%) ක වරිපනම් මුදලක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර හම්බන්තොට මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් හම්බන්තොට මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ලබා දීමටත් සහ

ඒ වරිපනම්, එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දිනවලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් හම්බන්තොට මහා නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.

12 -29/1

හම්බන්තොට මහා නගර සභාව

හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමේ ස්ථානයක් සඳහා මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නාගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 1811 දරන 2013 මැයි මස 17 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල XI, XXIV, XXVIII හැර I කොටසේ සිට XXIX කොටස දක්වා වූ සියලු අතුරු ව්‍යවස්ථා ද අංක 541/17 දරන 2011 නොවැම්බර් මස 09 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල XXVII, XXVIII, XL යන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ I වන කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා හම්බන්තොට මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත් එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම වෙනුවෙන් ම, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම ඒ උපලේඛනයේ 2 වන කොටසේ 1 වන තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වන තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (අ) වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

1 වැනි කොටස

1. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
2. මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
4. කොණ්ඩා සැකසීම, බාබර් සාප්පු, සැලුන් හා රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
5. බේකරියක් පවත්වාගෙන යාම
6. කිරිපට්ටියක් පවත්වාගෙන යාම
7. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
8. බත් කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම
9. හෝටලයක් පවත්වාගෙන යාම
10. නවාතැන් පොලක් පවත්වාගෙන යාම
11. ලොන්ඩරියක් පවත්වාගෙන යාම
12. අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
13. ලුණු නිෂ්පාදනය කිරීමේ හා පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. පරණ යකඩ එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

* මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම.
2. මිනිරන් ගබඩාකර තැබීම.
3. පොහොර නිෂ්පාදනය.
4. පොහොර ගබඩාකර තබා ගැනීම
5. හම් ගබඩා කර තැබීම.
6. උම්බලකඩ ගබඩාකර තැබීම.
7. කුකුළු වෙළෙඳපොළක් පවත්වාගෙන යාම.
8. කළුගල් කැඩීම සහ කබොක් කැපීම.
9. බොරලු හැරීම.
10. අශ්වයන් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළෙඳපොළක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම.
11. පශු ගිලන් හලක් පවත්වාගෙන යාම.
12. රබර් සකස් කිරීම, පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ඒවායේ දූලි ඉවත් කිරීම
13. පුවක් සකස් කිරීම.
14. තලාතු මිනිරන් සකස් කිරීම.

15. බැටළුවන් හෝ එළුවන් හෝ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල්කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම
16. උළු කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
17. හුණු ගබඩා කොට තැබීම.
18. බොම්බයි ලූණු , අර්තාපල් හොණ්ඩර 10කට වඩා ගබඩාකොට තැබීම.
19. පොල්කටු අඟුරු ගබඩා කොට තැබීම.
20. කුරුඳු, කරදමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම.
21. පරණ ලෝහ ගබඩා කර තැබීම.
22. සිමෙන්ති හොණ්ඩර 25කට වඩා ගබඩාකර තැබීම.
23. කරවල හොණ්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
24. ලුණු දැමූ මාළු හොණ්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
25. රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම.
26. ට්‍රංක පෙට්ටි නිෂ්පාදනය.
27. මරා සකස් කරන ලද කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම.
28. ගම් වර්ග නිෂ්පාදනය.
29. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය.
30. බැටරි පුරවනු ලබන්නාවූ හෝ බැටරි ගබඩා කොට තබනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම.
31. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම.
32. ටයර් හෝ ට්‍යුබ් වෝල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
33. හිස් බෝතල් 100 කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
34. කොකෝවා හොණ්ඩර 10 කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
35. කුරුඳු පොතු හොණ්ඩරයකට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
36. මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ මිනී පෙට්ටි සෑදීම සහ ගබඩා කොට තැබීම.
37. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ ගෘහ භාණ්ඩ සෑදීම සහ ගබඩා කොට තැබීම.
38. මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔපදැමීම.
39. බලපත්‍ර ලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම.
40. වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ වේවැල් බඩු සෑදීම සහ ගබඩා කොට තැබීම.
41. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම.
42. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
43. පිටි හෝ කුළු බඩු ඇඹරීම.
44. පුන්නක්කු හැර සත්ව ආහාර හොණ්ඩර 20කට වඩා ගබඩාකර තැබීම.
45. සත්ව ආහාර හැර වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම, එහෙත් සමුපකාර සමිතියක් විසින් ගබඩා කොට තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නියමයට යටත් නොවේ.
46. රබර් භාණ්ඩ නිෂ්පාදනය.
47. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම.
48. යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම.
49. පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
50. පොලිතින් සෙලූලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය නිපදවීම සහ ගබඩා කර තැබීම.
51. ඇසිඩ් ගැළුම් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
52. කපුරු නිෂ්පාදනය.
53. බූට් සපත්තු සහ පාවහන් නිෂ්පාදනය.
54. ඉටිපන්දම් නිෂ්පාදනය.

* මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම.
2. සිසිල් බීම නිෂ්පාදනය.
3. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම.
4. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය.
5. යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය.
6. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම.
7. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කොට තැබීම හෝ කෙඳි නිෂ්පාදනය හා ගබඩා කොට තැබීම.

8. ගිනි පෙට්ටි නිෂ්පාදනය.
9. ඉඹුල් පුළුන් ගබඩා කොට තැබීම.
10. පොල් තෙල් ගැලුම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
11. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කොට තැබීම.
12. ඇසිටලීන් නිෂ්පාදනය.
13. උළු 500කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
14. ගඩොල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
15. කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
16. සිගරට් නිෂ්පාදනය.
17. බීඩි නිෂ්පාදනය.
18. තීන්ත හෝ වාර්නිෂ් හොන්ඩර් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
19. ලී පෙට්ටි හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
20. කොහු නිෂ්පාදනය.
21. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
22. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
23. රසකැවිලි නිෂ්පාදනය.
24. පොල් කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
25. බෝට්ටු හෝ බත්තල් සෑදීම.
26. ලී පෙට්ටි සෑදීම.
27. ඔක්සිජන් හා වෑල්ඩිං වැඩ කරනු ලබන්නා වූ ද මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
28. මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
29. මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම.
30. මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
31. යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නා වූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
32. අතින් හෝ පා පොලුවලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
33. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම.
34. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
35. ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
36. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය.
37. 100කට අධික ප්‍රමාණයක් පතොරම් ගබඩාකර තැබීම.
38. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ/හෝ ගබඩාකර තැබීම.
39. අලුත් ටයර් හෝ ටියුබ් 150කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
40. පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
41. ස්ප්‍රේ පේන්ටිං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
42. යාන්ත්‍රික ශීතකරණ සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
43. යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නා වූ ඇඳුම් මැසීම කරනු ලබන්නා වූ ද ආයතයක් පවත්වාගෙන යාම.
44. කමිස කොලර් සහ කමිස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම.

* මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. ඩ්‍රයික්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම.
2. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.
3. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
4. ගල් අඟුරු ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම.
5. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය.
6. අශුද්ධ ලෝහ උණු කිරීම.
7. ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම.

8. කිලෝග්‍රෑම් 2කට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම.
9. ගම්, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම.
10. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය.
11. තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
12. ශීතකරණ අලුත්වැඩියා කිරීම, රිකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
13. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
14. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
15. පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව *වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *බලපත්‍ර ගාස්තුව* *රු. ශත*
1.	රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	2,000 0
2.	රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට	3,000 0
3.	රු. 2,500 ඉක්මවන විට	5,000 0

ඉහත 1 වන කොටසේ සඳහන් කර්මාන්ත අතරින් අංක 2 යටතේ සඳහන් කිසියම් හෝටලයක් හෝ අංක 13 යටතේ සඳහන් කිසියම් ආපන ශාලාවක් හෝ අංක 6 යටතේ සඳහන් වන කිසියම් නවාතැන් පොළක් හෝ ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක ඉහත 2 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පොළෙහි හෝ 2018 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු ය.

12 -29/2

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නාගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (ආ) වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ මෙහි පහත උපලේඛනයේ 1 වන කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ 2 වන කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක් ම එකී කර්මාන්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

1 වන කොටස

1. මුද්‍රණ ආයතනයක් පවත්වාගෙන යාම.
2. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
3. බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
4. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
5. වාස්තු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
6. ලී කැටයම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. වානේ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය හා අළුත්වැඩියාව.
9. ගෘහ භෘණ්ඩ නිෂ්පාදනය.
10. කොඝු, ඉදල්, බුරුසු ආදී නිෂ්පාදනය.
11. පැන්ට්‍රි කබඩ් හා ඇලුමිනියම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
12. වීදුරු ආශ්‍රිත නිෂ්පාදන කටයුත්ත සිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
13. වායු සමීකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
14. විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
15. ජංගම දුරකථන අළුත්වැඩියාව කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16. පරිගණක යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
17. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18. ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. රෙදි විවීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
22. බූට් සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය.
23. ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
24. බීඩි හා සුරුට්ටු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
25. රූපවාහිනී යන්ත්‍ර හා ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
26. පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
27. රෙදි පින්තාරු කිරීමේ හෝ බතික් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28. බ්‍රේක් ලයිනර් ඇලවීමේ හා සවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29. ඡායාරූප, දළ සේයාපට සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. විකිණීම සඳහා බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
31. විදුලි කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම.
32. ගෘහ නිර්මාණ ශිල්පය හෝ සැලසුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
33. සම්ප්‍රේෂණාගාර කුළුණක් පවත්වාගෙන යාම.
34. සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව *වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
1.	රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	2,000 0
2.	රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට	3,000 0
3.	රු. 2,500 ඉක්මවන විට	5,000 0

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නාගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (ඇ) වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී අඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී ආඥාපනතේ 247 (ආ) වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ ද හා වෘත්තියක් නොවන්නා වූ ද මෙහි පහත උපලේඛනයේ 1 වැනි කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 2 වැනි කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක් ම එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

උපලේඛනය

1 වැනි කොටස

1. කිරි පිටි, බිස්කට් වර්ග, රස කැවිලි හා ආහාරයට ගන්නා ද්‍රව්‍ය ගබඩාකර තැබීම, විකිණීම බෙදා හැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරනු ලබන ආයතන.
2. සබන් හා එදිනෙදා භාවිතයට ගන්නා සනීපාරක්ෂක ද්‍රව්‍ය ගබඩා කර තැබීම, විකිණීම, බෙදා හැරීම, හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරන ආයතන.
3. කෘෂි රසායන හා කෘෂි කාර්මික උපකරණ ගබඩාකර තැබීම, විකිණීම, බෙදා හැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරන ආයතන.
4. වෙළෙඳ ප්‍රචාරණ හා පුවත්පත් දැන්වීම් පළ කිරීම සිදුකරන ආයතනයක් පවත්වාගෙන යාම.
5. මෝටර් රථ කුළියට ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
6. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7. දුරකථන ඇමතුම් ලබාදීම, දුරකථන කාඩ්පත් අලෙවිය, ජංගම දුරකතන අලෙවිය හා සන්නිවේදන සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. දුරකථන සමාගම්වල ශාඛා හා නියෝජිත ආයතන පවත්වාගෙන යාම.
9. කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
10. රියැදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම.
11. උත්සව භාණ්ඩ බදුදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
12. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
13. උපස්ථායක සේවා ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
15. ක්‍රීඩා උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16. උත්සව ශාලා බදු දීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
17. පෞද්ගලික ආරක්ෂණ සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
18. ගණකාධිකාරී සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම.

19. විදේශ මුදල් හුවමාරු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
20. බැංකු සේවා හා උකස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
21. ලීසිං හා ෆිනෑන්ස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම, කොටස් වෙළෙඳපොළ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
22. ඉඩම් හා ගොඩනැගිලි විකිණීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
23. විදේශ ගුවන් ප්‍රවේශපත් අලෙවි කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
24. ගොඩනැගිලි ඉදිකිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
25. ගුවන් හෝ නැව් භාණ්ඩ නිෂ්කාශන සේවා සපයනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.
26. රථවාහන තත්ත්ව සහතික ලබාදීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
27. ලුණු පැකට් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28. ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29. ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. විදුලි උපකරණ හා ඉලෙක්ට්‍රෝනික උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
31. නිමි ඇඳුම් හා රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
32. සිල්ලර හා තොග වෙළෙඳාම සිදුකරන ස්ථානයක් පවත්වාගෙන යාම.
33. ෆාමසියක් පවත්වාගෙන යාම.
34. තෑගි භාණ්ඩ, විසිතුරු භාණ්ඩ, ළදරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
35. ගොඩනැගිලි ඉදිකිරීමේ අමුද්‍රව්‍ය හා උපකරණ ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. පුවත්පත් අලෙවි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
37. පොත් පත් හා ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. පාවහන් හා සම්භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. ලියාපදිංචි කළ හා නොකළ වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
40. කෘෂිකාර්මික උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
41. ලිහිසි තෙල් හා ග්‍රීස් ගබඩා කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42. ගෑස් ගබඩා කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
43. කෘෂි රසායන ගබඩා කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
44. දේශීය බෙහෙත් බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
45. යකඩ, ඇළුමිනියම්, පීවීසී, තීන්ත යනාදිය ගබඩා කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

උපලේඛනය

2 වැනි කොටස

1 වැනි තීරුව *බද්ද අදළ වන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලන් ලැබීම් ප්‍රමාණය*		*11 වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
(1)	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
(2)	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
(3)	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
(4)	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
(5)	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1200 0
(6)	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාව විසින් වැළඳගෙන ඇති අංක 541/17 හා 1989 ජනවාරි මස 20 වැනි දින පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ හා 252 අධිකාරය දරන මහා නගර සභා පනතෙන් මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, මාවතකට, ඇළකට, ගොඩනැගිල්ලකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු, බැනර්, කටවුට් හා බිත්තිවල පින්තාරු කර ඇති දැන්වීම් වෙනුවෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් වර්ගයේ ප්‍රදර්ශනයන් වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක ගාස්තු පනවා අයකිරීමටත්, හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය."

1 තීරුව *දැන්වීම් වර්ගය*	*11 තීරුව* *වර්ග අඩියක් සඳහා අයකිරීම*		
	සතියක් *රු. ශත*	*මාසයක්* *රු. ශත*	*වර්ෂයක්* *රු. ශත*
බැනර් (රාමු නොකරන ලද රෙදි දැන්වීම් ලද)	10 0	15 0	80 0
කටවුට් (රාමු කරන ලද රෙදි දැන්වීම් ලද)	10 0	15 0	80 0
ස්ථිර දැන්වීම් පුවරු		20 0	200 0
බිත්ති පින්තාරු		20 0	200 0
ආලෝක විමෝචක දියෝඩ නාම පුවරු			1,600 0

නගර සභාව මගින් ඉවත් කරනු ලබන දැන්වීම් පුවරුවක් නැවත ලබා දීම සඳහා පහත ගාස්තු අය කරනු ලැබේ.

	රු. ශත
එක් බැනරයක් හෝ කටවුටයක් සඳහා	50 0
එක් ස්ථාවර දැන්වීම් පුවරුවක් සඳහා	5,000 0

12 -29/5

හම්බන්තොට මහා නගර සභාව

ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989.01.20 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල XXXI වන කොටසේ ''ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග සහ රඟ දැක්වීම්'' පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, ඒ අතුරු ව්‍යවස්ථාවේ (3) වැනි ඡේදයේ දක්වෙන ගාස්තු පහත පරිදි එනම්,

	බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂිත ස්ථානයේ වර්ග ප්‍රමාණය	*එක් එක් දිනයක් සඳහා රු. ශත*
(අ)	වර්ග මීටර් 93 ක් නොඉක්මවන්නේ නම්	1,000 0
(ආ)	වර්ග මීටර් 93 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 186 ක් නොඉක්මවන විට	1,250 0
(ඇ)	වර්ග මීටර් 186 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 279 ක් නොඉක්මවන විට	1,500 0
(ඈ)	වර්ග මීටර් 279 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 465 ක් නොඉක්මවන විට	1,750 0
(ඉ)	වර්ග මීටර් 465 ක් ඉක්මවන විට	2,000 0

12 -29/6

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාව විසින් වැළඳගෙන ඇති අංක 541/17 හා 1989 ජනවාරි මස 20 වැනි දින පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ හා 252 අධිකාරිය දරන මහා නගර සභා පනත යටතේ මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ සෑම චිත්‍රපට සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක් , මැජික් සංදර්ශනයක්, ගායනයක්, සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක් (චේදිකා නාට්‍ය අදාළ නොවේ) හෝ මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක් වෙනුවෙන් ඒ වෙනුවෙන් නිකුත් කරනු ලබන ටිකට් පත්වල වටිනාකමෙන් 10% ක විනෝද බද්දක් පනවා අයකිරීමටත්, හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය. "

උපලේඛනය

මීට අමතරව චිත්‍රපට සංදර්ශනයක් (චිත්‍රපට ශාලා අයත් නොවේ) සර්කස් සංදර්ශනයක් , මැජික් සංදර්ශනයක්, ගායනයක්, සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක්, චේදිකා නාට්‍යයක් හෝ මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක් වෙනුවෙන් පහත පරිදි සංදර්ශන බලපත්‍ර ගාස්තු අයවිය යුතු අතර, වැඩිවන සෑම දිනක් සඳහාම රු. 100 ක අමතර ගාස්තුවක් අයකරනු ලැබේ.

	රු. ශත
01. චිත්‍රපට සංදර්ශනයක් (චිත්‍රපට ශාලා අයත් නොවේ) සර්කස් සංදර්ශනයක් , මැජික් සංදර්ශනයක්, චේදිකා නාට්‍ය කටයුත්තක්	500 0
02. සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක්, මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක්	1,000 0

12 -29/7

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා හම්බන්තොට මහා නගර සභාව සතු බිම් තාවකාලික වෙළෙඳ කටයුත්තක් සඳහා බදු දීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා මහා නගර සභාව සතු බිම් තාවකාලිකව වෙළෙඳ කටයුතු වෙනුවෙන් බදු දීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 අධිකාරිය දරන මහා නගර සභා පනතෙන් මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ පහත උපලේඛනයේ ඇති පරිදි මහා නගර සභාව සතු භූමිය තාවකාලිකව බදු දීමේ ගාස්තු පනවා අයකිරීමටත්, හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය''.

උපලේඛනය

වර්ග අඩි 01 රු. 10 0

12 -29/8

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"252 අධිකාරය දරන මහා නගර සභා පනතේ 247 ඉ (1) හා (2) වගන්තීන්ගෙන් මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ යම් ඉඩමක් හිමිකරු විසින්, තැරැව්කරුවෙකු විසින්, වෙන්දේසිකරුවෙකු විසින්, ඔවුන්ගේ නියෝජිතයෙකු හෝ සේවකයෙකු විසින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකුණනු ලබන මුදලින් 1% ක මුදලක් ඉඩම විකුණනු ලබන පාර්ශවය විසින් හම්බන්තොට මහා නගර සභාව වෙත ගෙවිය යුතු බව හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය.''

12 -29/9

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 247 ඈ වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක, එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම පහක (0.5%) ක වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු යයි විධාන කිරීමටත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

12 -29/10

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989.01.20 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල XLVII වන කොටසේ ''පුස්තකාල'' පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල 7 වන සහ 12 වන අතුරු ව්‍යවස්ථාවලින් හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී 7 වන අතුරු ව්‍යවස්ථාවේ (1) (ඈ) වන ඡේදයේ සඳහන් තැන්පත් මුදල,

බැහැර දෙන අංශයේ ගාස්තු

	රු. ශත
සාමාජික ඉල්ලුම්පත් ගාස්තු	50 0
සාමාජිකත්වය ලබා ගැනීම	100 0
සාමාජිකත්වය අලුත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තුව	නොමිලේ
සාමාජිකත්වය අළුත් කිරීම	50 0
සාමාජික අනු පිටපත් ලබා ගැනීමේ ඉල්ලුම්පත් ගාස්තු	20 0
සාමාජික අනු පිටපත් ලබා ගැනීම	50 0
එක් දිනක් වෙනුවෙන් දඩ මුදල (එක් පොතක් සඳහා)	1 0

ළමා පුස්තකාල ගාස්තු

ළමා පුස්තකාල සාමාජික ඉල්ලුම්පත් ගාස්තුව	20 0
ළමා සාමාජිකත්වය ලබා ගැනීම	නොමිලේ
ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තුව	10 0
ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව	30 0
ළමා අනුපිටපත් ලබා ගැනීමේ ඉල්ලුම්පත් ගාස්තුව	10 0
ළමා අනුපිටපත් ලබා ගැනීමේ ගාස්තුව	30 0
එක් දිනක් වෙනුවෙන් දඩ මුදල (එක් පොතක් සඳහා)	1 0

වෙනත් සේවාවන්

අන්තර්ජාල මගින් තොරතුරු ගවේෂණය (පැය 1ක් සඳහා)	50 0
(වැඩිවන පැයක් සඳහා)	30 0
අන්තර්ජාල තොරතුරු වර්ණ මුද්‍රිත පිටපත් ලබා ගැනීම (එක් පිටපතක් සඳහා)	30 0
අන්තර්ජාල තොරතුරු සාමාන්‍ය මුද්‍රිත පිටපත් ලබා ගැනීම (එක් පිටපතක් සඳහා)	20 0
ඡායා පිටපත් ලබා ගැනීම (තනි පැත්ත)	2 0
(දෙපැත්ත)	4 0

විය යුතුය යන්න සහ මෙම තීරණය 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නීය.

12 -29/11

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරන පහත සඳහන් සේවා සහ වෙනත් ආනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත් මෙම සේවා ගාස්තු අය කිරීම 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය."

අනු. අංකය	*සේවාව*	*ගාස්තුව රු. ශත*
01.	ඔප්පු සාරාංශ අයදුම්පත්	300 0
02.	ඔප්පු සාරාංශයක් ලියාපදිංචි කිරීම	200 0
03.	අතිරේක තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම	300 0
04.	වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකයක් සහ අයිතිය පිළිබඳ සහතිකයක්	500 0
05.	වරිපනම් සහතිකයක් නිකුත් කිරීම	500 0
06.	ඉඩම් අනුබෙදුම් අයදුම්පතක්	300 0
07.	මෘත දේහයක් භූමදානය සඳහා	10 0
08.	භෂ්මාවශේෂ තැන්පත් කිරීම	50 0
09.	රජයේ ශල්‍යාගාරවලින් ඉවත් කරන මෘතදේහ කොටස් මිහිදන් කිරීම	250 0
10.	ආදාහනාගාරයක් රහිත සුසාන භූමියක සිහිවටන ඵලකයක් සඳහා	3010 0
11.	නගරය තුළ හා පොදු ස්ථානවල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය (දිනකට)	500 0
12.	ගොඩනැගිලි අයදුම්පත්‍රය	500 0

12 -29/12

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා ක්‍රීඩා පිටි සහ ක්‍රීඩා මණ්ඩපය වෙන් කිරීමේ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩා මණ්ඩපය වෙන් කිරීමේ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී හම්බන්තොට මහා නගර සභාව සතු ක්‍රීඩාපිටි හා ක්‍රීඩාංගන වෙන් කිරීමේ ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම වෙන්කිරීමේ ගාස්තු අයකිරීම 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය."

ප්‍රධාන ක්‍රීඩාංගණය :

අංකය	*විස්තරය*	*ආරක්ෂිත ඇප*	*ගාස්තු*	*වැඩිවන එක් දිනක් සඳහා අයකිරීම*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාංගනය මුදල් අයකරනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	5,000 0	5,000 0	2,500 0
02.	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාංගනය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	1,000 0	500 0	250 0
03.	ක්‍රීඩාගාරය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයක් වෙළඳ ප්‍රචාරණය සඳහා යොදවාගනු ලබන්නේ නම් එක් දිනකට	2,000 0	2,500 0	1,000 0
04.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශය පෞද්ගලික ආයතනයක් හෝ රාජ්‍ය නොවන ආයතනයක් මගින් ක්‍රීඩා තරග/ තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	1,000 0	500 0	1,000 0
05.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක්/තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට		300 0	
06.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය මෙම බල ප්‍රදේශයෙන් බැහැර ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක් /තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	2,000 0	1,000 0	1,000 0
07.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය සැණකෙලියක් (කානිවල්) හෝ මුදල් අය කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් මුල් දින 05 සඳහා	20,000 0	10,000 0	2,500 0
08.	ඉහත ගාස්තු වලට අමතරව විදුලි හා ජල ගාස්තු ගෙවීම		500 0	
අනෙකුක් ක්‍රීඩාංගණ				
01.	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාංගනය මුදල් අයකරනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	2,500 0	2,500 0	1,000 0
02.	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාංගනය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	500 0	200 0	100 0
03.	ක්‍රීඩාගාරය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයක් වෙළඳ ප්‍රචාරණය සඳහා යොදවාගනු ලබන්නේ නම් එක් දිනකට	2,000 0	2,000 0	1,000 0
04.	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශය පෞද්ගලික ආයතනයක් හෝ රාජ්‍ය නොවන ආයතනයක් මගින් ක්‍රීඩා තරග/තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	500 0	200 0	100 0

අංකය	*විස්තරය*	*ආරක්ෂිත ඇප*	*ගාස්තු*	*වැඩිවන එක් දිනක් සඳහා අයකිරීම*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
05.	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක්/තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට		200 0	
06.	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය මෙම බල ප්‍රදේශයෙන් බැහැර ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක්/ තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	1,000 0	500 0	300 0
07.	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය සැණකෙලියක් (කානිවල්) හෝ මුදල් අය කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් මුල් දින 05 සඳහා	5,000 0	5,000 0	2,500 0
08.	ඉහත ගාස්තුවලට අමතරව විදුලි හා ජල ගාස්තු ගෙවීම		500 0	

12 -29/13

හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂය සඳහා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා කසළ බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2018 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාව විසින් වැළඳගෙන ඇති 1989 ජනවාරි මස 20 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත XI වැනි අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය අනුව ඉවත් කරනු ලබන කසළ සම්බන්ධයෙන් ගාස්තු අයකිරීමේ බලයක් ඇත. එම බලතල ක්‍රියාත්මක කිරීමේ දී හම්බන්තොට මහා නගර සභාවට හම්බන්තොට මහා නගර සභා සීමා තුළ ඉවත් කරනු ලබන කසළ වෙනුවෙන් පහත ගාස්තු උපලේඛනයේ සඳහන් ආකාරයට අයවිය යුතු බවත් මෙම ගාස්තු අයකිරීම 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.

කසළ වර්ගය	*කිලෝ ග්‍රෑම් 1ක් සඳහා අය කිරීම (දිනකට)* *රු. ශත*
දිරන කසළ	1.00 (කිලෝ ග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
නොදිරන කසළ	3.00 (කිලෝ ග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
කර්මාන්තන ශාලා අපද්‍රව්‍ය	10 0 (කිලෝ ග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි සුන්බුන් (උළු කැබලි, ගඩොල් කැබලි, බදම කැබලි)	
වෙනත් අපද්‍රව්‍ය	15 0 (කියුබ් 1ක් සඳහා)

වෙනත් අපද්‍රව්‍ය - විද්‍යුත් හා ඉහත වර්ගීකරණයන්ට අයත් නොවන දෑ.

12-29/14

පානදුර නගර සභාව

2019 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 164(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 162 වන වගන්තිය යටතේ පානදුර නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද පානදුර නගර සභාවේ මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සභාපති,
පානදුර නගර සභාව.

2018 නොවැම්බර් මස 09 වැනි දින,
පානදුර නගර සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 164 (1) වැනි වගන්තිය සමග කියවියයුතු 162 වගන්තිය යටතේ පානදුර නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පානදුර නගර සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

තව ද එකී ස්ථානයේ එම හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන එසේම සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, "ආපන ශාලාවක්" නවාතැන් පොලක් වන විට දී ඊට අදළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2018 වර්ෂයේ එකී ස්ථානයේ ලැබීම්වලින් සියයට එකක් (1%) බලපත්‍ර ගාස්තුව ලෙස 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම යෝජනා කරමි.

උපලේඛනය I

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලය දෙනු ලබන කාර්යය	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු.1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු.1,500 ට වැඩි රු. ශත*
බේකරි	500 0	750 0	1,000 0
බත් කඩ	500 0	750 0	1,000 0
තේ/කෝපි	500 0	750 0	1,000 0
භෝජනාගාරයක්/රෙස්ටුරන්ට්	500 0	750 0	1,000 0
ලැගුම්හල්	500 0	750 0	1,000 0
සිසිල් බීම හල්/කර්මාන්ත ශාලා/ගබඩා	500 0	750 0	1,000 0
අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
කිරි පට්ටි/ කිරි පැණි /කිරිහල්	500 0	750 0	1,000 0
බාබර් සාප්පු	500 0	750 0	1,000 0
මාළු, මස්	500 0	750 0	1,000 0
හරක් ගාල්	500 0	750 0	1,000 0
අයිස්ක්‍රීම් /අයිස් පැකට් අලෙවිය	500 0	750 0	1,000 0
ඇඹරුම්හල්	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*	
බලය දෙනු ලබන කාර්යය	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු.1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු.1,500 ට වැඩි රු. ශත*
කුකුලන් ඇති කිරීම හා බිත්තර අලෙවිය	500 0	750 0	1,000 0
රසායනික පොහොර පලිබෝධ විකිණීම	500 0	750 0	1,000 0
දියලුණු අයඩින් කර විකිණීම	500 0	750 0	1,000 0
විනාකිරි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
ශීතකළ ආහාර ගබඩාව	500 0	750 0	1,000 0
ලොන්ඩ්‍රි	500 0	750 0	1,000 0
වාහන සේදීම	500 0	750 0	1,000 0
පරිසරයට අපද්‍රව්‍ය නිකුත් කරන කර්මාන්ත	500 0	750 0	1,000 0
ආපනශාලාව	500 0	750 0	1,000 0
කෑඳ අලෙවිය	500 0	750 0	1,000 0
පේස්ට්‍රි ෂොප් රසකැවිලි	500 0	750 0	1,000 0
හෝටල්	500 0	750 0	1,000 0

උපලේඛනය II

ජීඩාකාරී ව්‍යාපාර :

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු.1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු.1,500 ට වැඩි රු. ශත*
1.	පොහොර හා රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
2.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
3.	සම් විකිණීම	500 0	750 0	1,000 0
4.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
5.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබාගැනීම	500 0	750 0	1,000 0
8.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කි. ග්‍රෑ. 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
9.	පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	පුන්නක්කු නිපදවීම හෝ කි. ග්‍රෑ. 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
15.	අළුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු.1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු.1,500 ට වැඩි රු. ශත*
16.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21.	රස කැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22.	පොල්ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
23.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 1001 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
29.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32.	මිරිස් , කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග කුළුබඩු, කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
33.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
34.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
35.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
36.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	සුවඳ විලවුන් නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
38.	පාසල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0
39.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
40.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
41.	ටයර්, ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
42.	සිමෙන්ති කි. ග්‍රෑ. 1000ට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
43.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
44.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
45.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
46.	පොහොර, කුණු පිටි වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
47.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
48.	ධාන්‍ය හෝ මාංශ භෝග කි. ග්‍රෑ. 250ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
49.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0

උපලේඛනය III

අන්තරාදයක ව්‍යාපාර

අනු. අංකය	බලය දෙනු ලබන කාර්යය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු.1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු.1,500 ට වැඩි රු. ශත*
1.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කි. ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
2.	මැසූ ඇඳුම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
7.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	කළුගල් කැනීම හෝ කැඩීම - යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
9.	සිසිල්බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	පාපැදි හෝ යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	පාවිච්චි කරන ලද කඩදසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම.	500 0	750 0	1,000 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
25.	දූව ගබඩා කිරීම	500 0	750 0	1,000 0

උපලේඛනය IV

පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර

අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු.1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු.1,500 ට වැඩි රු. ශත*
1.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
2.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
3.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
4.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අළුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
6.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
9.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15.	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	වැල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	පැට්‍රොල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ග ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20.	වායු සමනය යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
21.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

12 - 17/1

පානදුර නගර සභාව

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 (ආ) (I) වැනි වගන්තිය යටතේ පානදුර නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද පානදුර නගර සභාවේ මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සභාපති,
පානදුර නගර සභාව.

2018 නොවැම්බර් මස 09 වැනි දින,
පානදුර නගර සභා කාර්යාලය.
පානදුර.

ඉහත කී යෝජනාව

255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 165 ආ (1) වගන්තියෙන් පානදුර නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම ආඥාපනතේ 165 'අ' වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ යම් ව්‍යාපාරයක් පානදුර නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂය ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පානදුර නගර සභාවට ගෙවිය යුතු බව යෝජනා කරමි.

උපලේඛනය

I තීරුව *2018 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම*	*II තීරුව* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	රු. 90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	රු. 180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	රු. 300 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	රු. 1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	රු. 3,000 0

12-17/2

පානදුර නගර සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 අ වැනි වගන්තිය යටතේ පානදුර නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද පානදුර නගර සභාවේ මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සභාපති,
පානදුර නගර සභාව.

2018 නොවැම්බර් මස 09 වැනි දින,
පානදුර නගර සභා කාර්යාලය,
පානදුර.

ඉහත කී යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ සඳහන් සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2018 වර්ෂයේ පැවති වාර්ෂික තක්සේරු වටිනාකම් 2019 වර්ෂය සඳහා ද පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකම්වල,

(1) උපලේඛන අංක 01 හි සඳහන් කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපළක් මත සියයට හයක (6%) ක වරිපනම් බද්දක් ද,
(2) උපලේඛන අංක 02 හි සඳහන් කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපළක් මත සියයට හතක (7%) ක වරිපනම් බද්දක් ද,
(3) උපලේඛන අංක 03 හි සඳහන් කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපළක් මත සියයට තුනක (3%) ක වරිපනම් බද්දක් ද,

2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන් වන කාර්තු 4 තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් යෝජනා කරමි.

මෙහි පහත උපලේඛන අංක 01, 02 සහ 03 හි විස්තර කර ඇති වරිපනම් බද්දට අයත් වන මාර්ගවල මධ්‍ය රේඛාවේ සිට මීටර් 100ක් දෙපස පිහිටි සියලු දේපළ වරිපනම් ගෙවීම සඳහා යටත් වන්නේ ය. එසේ ම තවදුරටත් වරිපනම් සීමාව තුළ පිහිටි යම් ඉඩමක්, ගොඩනැගිල්ලක්, නිවසක් හෝ ගෙපලක් මීටර් 100 සීමාවේ රේඛාව තුළ පිහිටන්නේ නම් එම නිවස, ගොඩනැගිල්ල, ගෙපල හෝ ඉඩම සම්පූර්ණයෙන් ම වරිපනම් ගෙවීම සඳහා යටත් වන්නේ ය.

උපලේඛන අංක 01

	වරිපනම් බද්දට අයත්වන ප්‍රදේශ	*අයකරනු ලබන ප්‍රතිශතය*
01.	කහල්ල පන්සල පාර - කහල්ල පුරාණ විහාර මාවත නාගරික සීමාව සිට ඉහළ ගම පාර දක්වා මාර්ගය දෙපස	6%
02.	කහල්ල පහළ ගම පාර - කටුගස්තොට ඉහළ ගම නාගරික ක්‍රීඩාංගනයේ සිට පහළ ගම පාරේ කහල්ල මහජන පුස්තකාලය දක්වා මාර්ගය දෙපස	6%
03.	කහල්ල ඉහළගම පාර - කටුගස්තොට ඉහළ ගම නාගරික ක්‍රීඩාංගනයේ සිට ඉහළ ගම පාරේ කහල්ල මහජන පුස්තකාලය දක්වා මාර්ගය දෙපස	6%
04.	දෙමටගොල්ල පාර - කටුගස්තොට මඩවල පාරේ දෙමටගොල්ල හන්දියේ සිට දෙමටගොල්ල පාරේ ජම්බුගහපිටිය මන්සන්ධිය දක්වා මාර්ගය දෙපස	6%
05.	ජම්බුගහපිටිය පාර - කටුගස්තොට මඩවල පාරේ නවයාලතැන්න හන්දියේ සිට පල්ලේතලවින්න ආදර්ශ විද්‍යාලය දක්වා මාර්ගය දෙපස	6%
06.	පල්ලේතලවින්න උඩතලවින්න - පල්ලේතලවින්න උඩතලවින්න අතුරු මාර්ගය දෙපස	6%
07.	බංගලාගෙදර පාර - මඩවල වත්තේගම පාරේ රේන්දපොළ හන්දියේ සිට බංගලාගෙදර හරහා මඩවල මුස්ලිම් මහ පල්ලිය දක්වා මාර්ගය දෙපස	6%
08.	පට්ටියතැන්න පාර - තෙල්දෙණිය පාරේ 8 කණුව හන්දිය සිට පට්ටියතැන්න මුදුන කඩේ හන්දිය දක්වා මාර්ගය දෙපස	6%
09.	වලල වාවින්න පාර - තෙල්දෙණිය පාරේ වලල හන්දියේ සිට වාවින්න පාරේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාව දක්වා මාර්ගය දෙපස	6%
10.	දොරගමුව පාර - පොල්ගොල්ල දොරගමුව හන්දිය සිට දොරගමුව පාරේ මීගම්මන හන්දිය දක්වා මාර්ගය දෙපස	6%
11.	සරසවි මාවත - පොල්ගොල්ල විවෘත විශ්වවිද්‍යාල අසල සිට දොරගමුව පාර හමුවන පොඩිඅම්බලම හන්දිය දක්වා මාර්ගය දෙපස	6%
12.	ගංගා මාවත - නවාලතැන්න පාතදුම්බර කාර්මික විද්‍යාලය අසලින් ආරම්භ වී දොරගමුව පාර හමුවන මන්සන්ධිය දක්වා මාර්ගය දෙපස	6%
13.	බලනගල පාර- දෙමටගොල්ල පාරේ මන්සන්ධියේ සිට මහවැලි මහා විද්‍යාලය දක්වා මාර්ගය දෙපස	6%
14.	අටමන් හන්දිය වත්තේගෙදර පාර - පොල්ගොල්ල අටමන්හන්දියේ සිට දොරගමුව පාර හමුවන වත්තේගෙදර දක්වා මාර්ගය දෙපස	6%

උපලේඛන අංක 02

	වරිපනම් බද්දට අයත්වන ප්‍රදේශ	
1.	නුවර පාර, අඹතැන්න - අඹතැන්න පූජාපිටියේ හන්දියේ සිට කටුගස්තොට පොලිසිය අසළ මහනුවර මහ නගර සීමාව දක්වා මාර්ගය දෙපස	7%
2.	මාතලේ පාර, අඹතැන්න -අඹතැන්න පූජාපිටියේ හන්දියේ සිට මාතලේ දෙසට අකුරණ ප්‍රාදේශීය සභා සීමාව දක්වා මාර්ගය දෙපස	7%
3.	පූජාපිටිය පාර - අඹතැන්න පූජාපිටියේ හන්දියේ සිට පූජාපිටිය දෙසට පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාව දක්වා මාර්ගය දෙපස	7%
4.	නාපාන පාර - මඩවල හන්දියේ සිට තෙල්දෙණිය පාරේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාව දක්වා මාර්ගය දෙපස	7%
5.	වත්තේගම පාර - මඩවල හන්දියේ සිට වත්තේගම පාරේ පිටියේගෙදර හන්දිය දක්වා මාර්ගය දෙපස	7%
6.	කටුගස්තොට පාර - මඩවල හන්දියේ සිට වංගුව කඩේ දක්වා මාර්ගය දෙපස	7%
7.	අමුණුගම පාර - මඩවල සිරිමල්වත්ත හන්දියේ සිට අමුණුගම හන්දිය දක්වා මාර්ගය දෙපස	7%

උපලේඛනය අංක 03

	වරිපනම් බද්දට අයත්වන ප්‍රදේශ	*අයකරනු ලබන ප්‍රතිශතය*
1.	හපුගස්තැන්න පාර - හපුගස්තැන්න පාරේ සිට යහංගල දක්වා මාර්ගයේ දෙපස මාර්ගයේ මැද සිට අඩි 300ක් දක්වා කිලෝමීටර් 01	3%
2.	ගලදෙනිය පාර - උඩතලවින්න ගලදෙණිය මාර්ගයේ දෙපස මාර්ගයේ මැද සිට අඩි 300ක් දක්වා (දොරගමුව මාර්ගයේ සිට ගලදෙනිය ජුම්මා පල්ලිය දක්වා)	3%
3.	කටුගස්තොට-නවයාලතැන්න පොල්ගොල්ල විශ්වවිද්‍යාලයේ ලග සිට නවයාලතැන්න ඔරලෝසු කණුව දක්වා පාරේ මැද සිට අඩි 300ක් දක්වා මාර්ගය	3%
4.	ජම්බුගහමඩිත්ත පාර - නාපාන ජම්බුගහමඩිත්ත මාර්ගය දෙපස මාර්ගයේ මැද සිට අඩි 300ක් දක්වා (නාපාන සැමන් ෆැක්ටරිය (නවරත්න ගරාජය) අසල සිට නාපාන සොහොන්පිටිය දක්වා මීටර් 1.4	3%
5.	වලල හන්දියේ සිට කයිවඩන්තැන්න හන්දිය හරහා කිරිමැටිය හන්දිය දක්වා පාරේ මැද සිට අඩි 300 දෙපස	3%
6.	අලෝක මාවත - නාපාන අලෝක මාවත දෙපස මාර්ගයේ මැද සිට අඩි 300 (නාපාන පාසල අසල සිට අමුණුගම මැණික්හින්න මාර්ගය දක්වා දුර කිලෝමීටර් 0.12)	3%
7.	යටිරාවන-බංගලාමලේ පාර - වත්තේගම පාරේ යටිරාවන ලීමෝල අසල සිට වත්තේගම පාර බංගලාමලේ හන්දිය දක්වා මාර්ගයේ මැද සිට අඩි 300 ක් දක්වා	3%
8.	කහල්ල කලුගල (වටරවුම්) පාර-කලුගලවත්ත හරහා ඉහල ගම්මැද්ද මාර්ගය දෙපස මාර්ගයේ මැද සිට අඩි 300 දක්වා (කටුගස්තොට තැපැල් කාර්යාලය අසල සිට කහල්ල පුස්තකාලය දක්වා මාර්ගය දුර කිලෝමීටර් 01)	3%
9.	බ්‍රෝමෝ ගාර්ඩන් පාර-අඹතැන්න මැග්සිටි ආයතනය අසලින් බ්‍රෝමෝ ගාර්ඩන් පාරේ මැද සිට දෙපස අඩි 300 දක්වා,	3%
10.	බොල්ලේගොඩ - මොරගස්කොටුව පාර - අඹතැන්න බොල්ලේගොඩ හරහා මොරගස්කොටුව දක්වා මාර්ගයේ දෙපස මාර්ගයේ මැද සිට අඩි 300 දක්වා (අඹතැන්න මාර්ගයේ සිට මොරගස්කොටුව හන්දිය දක්වා කිලෝමීටර් 01)	3%
11.	බොල්ලේගොඩ - මහසෙන් විද්‍යාල පාර-බොල්ලේගොඩ ප්‍රධාන මාර්ගයේ සිට වෑකඩ හරහා මහසෙන් විද්‍යාලය දක්වා ඇති මාර්ගයේ දෙපස මාර්ගයේ මැද සිට අඩි 300 දක්වා (අඹතැන්න බොකලවල හන්දියේ සිට බෝගස්ගොඩ පාර වෑකඩේ හරහා මහසෙන් විද්‍යාලය දක්වා කිලෝමීටර් 01)	3%
12.	වත්තේගෙදර - දුන්කොලවත්ත පාර වත්තේගෙදර හන්දියේ සිට දුන්කොලවත්ත පල්ලිය දක්වා මාර්ගයේ මැදසිට අඩි 300 දක්වා	3%

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01) 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කීර්ති බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙහි ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පාතදුම්බර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් පාතදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	වාහන එංජින් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
2.	ත්‍රිරෝද රථ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
3.	ඇලුමිනියම්, පිත්තල ආශ්‍රිත පිත්තල වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	වාහන කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	කාබනික පොහොර නිපදවීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
6.	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
7.	බීරළු/කැටයම් ලියවීමේ/කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	පාවහන් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	ඡායා පිටපත් කිරීම, රෝනියෝ කිරීම, ලැමිනේටින් කිරීම, යතුරු ලියනය කරදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	සී.ඩී., වී.සී.ඩී. වීඩියේ කැසට් ගීත පටිගත කිරීම හා විකිණීම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	බීඩි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ඔරලෝසු අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
13.	රංගායතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	මදුරුදැල් මහන ස්ථානයක් හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බෝට්ටු/ඔරු සේවාවන් පවත්වාගෙන යාම (තොටුපළක්)	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
17.	සෙල්ලම් ක්‍රීඩා භාණ්ඩ වෙළෙඳාම	500 0	750 0	1,000 0
18.	ජූකී මැෂින් අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
19.	මදුරුදැල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පැල තවානක් පවත්වාගෙන යාමඩ			
22.	අක් යන්ත්‍ර රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	යාන්ත්‍රික යතු ගෑමේ ස්ථානයක් පවත්වගෙන යාම	500 0	750 0	1,000 0
24.	දුනු වැඩපල	500 0	750 0	1,000 0
25.	මැණික් ඔපදැමීම	500 0	750 0	1,000 0
26.	ගල් ඇඹරීමේ නිෂ්පාදන	500 0	750 0	1,000 0
27.	ආනයන කරන ලද පලුදු රථවාහන යථා තත්ත්වයට පත් කිරීම (අලුත්වැඩියා කිරීමේ ස්ථාන/රීකන්ඩිෂන් කිරීම)	500 0	750 0	1,000 0
28.	ගල් ඇඹරීම ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ලොරි බොඩි සැකසීම	500 0	750 0	1,000 0
31.	වෙස් මුහුණු නිපදවීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0

12 - 93/2

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01) 03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කීර්ති බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛන අංක I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පාතදුම්බර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් පාතදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය I

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක ගෙවිය යුතු බද්ද	නැත
02. රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03. රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04. රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05. රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06. රු. 1,50,000 වැඩි වන විට ගාස්තුව	3,000 0

උපලේඛනය II

1. කොමිස් ඒජන්තවරුන්.
2. වෙන්දේසිකරුවන්.
3. බ්‍රෝකර්වරුන්.
4. මුදල් ආයෝජකයින් (මෙරට).
5. මුදල් ආයෝජකයින් (අපනයන ව්‍යාපාරිකයින්).
6. කොන්ත්‍රාත්කරුවන්.
7. සැපයුම්කරුවන් (ගොඩනැගිලි, නිමි ඇඟළුම්, ලිපිද්‍රව්‍ය, සුඛෝපභෝගී භාණ්ඩ සහ වෙනත්).
8. රියැදුරු පුහුණු ආයතන.
9. පෞද්ගලික පංති පවත්වන්නන්,
10. හජ්ජී/දඹදිව/යාත්‍රා යන ආගමිකයන් හා විදේශ සංචාර ගෙනයාමේ නියෝජිත කාර්යාලයක් පවත්වාගෙන යාම
11. විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
12. ලොතරැයි නියෝජිතයින්
13. රේස් ඔට්ටු පොලවල්
14. රක්ෂණ නියෝජිත කාර්යාල
15. මෝටර් රථ වාහන වෙළඳාම් කරන්නන්
16. ඒජන්සි තැපැල්හල්/ඒජන්සි වෙළඳසැල්
17. රන් ආභරණ වෙළඳසැල්
18. කළු ගල් විකිණීම
19. සුඛෝපභෝගී ගොඩනැගිලි උපකරණ ආනයනය කිරීම/විකිණීම
20. ආගන්තුක නිවාස පවත්වාගෙන යාම
21. ශාලා කුළියට දීම (උත්සව ශාලා)
22. රා/රට බීම/අරක්කු/බීම හල් (තැබෑරුම්)
23. රූපවාහිනී සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම

24. දුරකතන සේවා මධ්‍යස්ථාන (කොමියුනිකේෂන්)
25. පාසල් වෑන් රථ
26. යන්ත්‍රෝපකරණ අලෙවිය
27. අලෙවි නියෝජිත ආයතන
28. දේශීය/බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන
29. යාන්ත්‍රික තහඩු නැවීමේ වැඩපලවල්
30. ලී වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31. උළු, ගල්, වැලි ගඩොල් සැපයීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. මෙඩි ලැබ් (ලේ හා මුත්‍රා පරීක්ෂා කිරීම) ඒකකයක් පවත්වාගෙන යාම
33. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
34. සමාජ ශාලාවක් පවත්වාගෙන යාම
35. බටහිර ඖෂධ අලෙවිය
36. ජලය බෝතල් කර විකිණීම
37. රථවාහන අංගනයක් පවත්වාගෙන යාම
38. සැලසුම් ශිල්පි ආයතනයක් පවත්වාගෙන යාම
39. විදුලි හා ගෘහ උපකරණ
40. පරිගණක පන්තියක් පවත්වාගෙන යාම
41. සුළු අපනයන භෝග එකතු කිරීම
42. කේටරින් සේවා සැපයීම
43. විදේශ චෙක්පත්/මුදල් මාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
44. නිවාඩු නිකේතනය
45. පැස්ටල් හා ලිපිද්‍රව්‍ය නිෂ්පාදනය
46. හෙද සේවා ආයතනයක් පවත්වාගෙන යාම
47. අන්තර්ජාල පහසුකම් සැපයීම
48. පෞද්ගලික/රජයේ බැංකු සේවා ස්ථාන
49. පොත් ප්‍රකාශන ආයතනයක් පවත්වාගෙන යාම
50. පෞද්ගලික (ජාත්‍යන්තර) පාසල්
51. සංචාරක සේවා සැපයීම
52. ප්‍රවාහන සේවා ආයතනයක් පවත්වාගෙන යාම (කැබ් සර්විස්)
53. ලිහිසි තෙල් වෙළෙඳාම
54. පෞද්ගලික ආරක්ෂක සේවා
55. මධ්‍යසාර ගබඩාව
56. සාප්පු බඩු වෙළඳාම
57. වැඩසටහන් නිෂ්පාදනය සහ ප්‍රචාරනය
58. ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු ගබඩා කර විකිණීම
59. ක්‍රීඩා සමාජයක් පවත්වාගෙන යාම
60. විසිතුරු මසුන් අලෙවිය
61. රෙදි කැබලි ගබඩා කර විකිණීම
62. විදුලි රැහැන් ඇදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම
64. පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. රථවාහන අමතර කොටස් අලෙවිය
66. අටපිරිකර පූජා භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. ජංගම ලොතරැයි කුටි
68. පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. අවමංගල්‍ය උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. මංගල උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්ගෙන යාම
71. උද්‍යාන සැලසුම් ස්ථානයක් පවත්වාගෙන යාම
72. ලෝහ අත්කම් භාණ්ඩ අලෙවිය
73. පොල් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම

74. ඇස් කණ්නාඩි අලෙවි කිරීම
75. මැටි භාණ්ඩ අලෙවිය
76. පැල වර්ග අලෙවිය
77. විදුලි මෝටර් එතීම
78. සනීපාරක්ෂක භාණ්ඩ අලෙවිය
79. සයිලන්සර් වැඩපල
80. වාහන බැටරි විකිණීම
81. ජ්‍යෝතිෂ්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. ස්ථාවර හා ජංගම දුරකතන සම්බන්ධතා නිකුත් කිරීමේ තාවකාලික වෙළඳ කුටියක් පවත්ගෙන යාම (දිනකට)
83. සෙලියුලර් දුරකතන හා දුරකතන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84. දේශීය ආයුර්වේද ඖෂධ අලෙවිය
85. කුකුල් කෑම අලෙවිය
86. රතිඤ්ඤු වෙළඳාම
87. ළදරු සනීපාරක්ෂක භාණ්ඩ වෙළඳාම
88. ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීම (සෝයා සහ ධාන්‍ය වර්ග)
89. මඩ පුවක් වළක් පවත්වාගෙන යාම
90. පාසල් උපකරණ හා ලිපිද්‍රව්‍ය අලෙවිය
91. සිල්ලර වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
92. ග්‍රොසරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
93. සුපිරි වෙළඳ සැලක් පවත්වාගෙන යාම
94. එළවළු හා පළතුරු වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
95. සහල් තොග හෝ සිල්ලරට විකිණීමේ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
96. බුලත්, පුවක්, කොහු, ඉදල් විකිණීම
97. දැව සැපයුම්කරු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

* 2019 බලපත්‍ර හා බදු පැනවීම අනුව බලපත්‍රයකට හා කර්මාන්ත බද්දකට හෝ ව්‍යාපාර බද්දට යටත් නොවන නව ව්‍යාපාර වේ නම් එම සියලුම ව්‍යාපාර, ව්‍යාපාර බදුවලට යටත් වේ.

11 - 93/3

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2019 වර්ෂයේ දී පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කීර්ති බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්.

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පළක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන්පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එක (1%) ක සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් පාතදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

පළමුවන උපලේඛනය - පීඩාකාරී ව්‍යාපාර

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
1.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
2.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
3.	සම් විකිණීම	500 0	750 0	1,000 0
4.	සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර)	500 0	750 0	1,000 0
5.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
7.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග, ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0
8.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0"
9.	පොල් කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	රස කැවැලි නිපදවීම	500 0	750 0	1,000 0
12.	අයිස්ක්‍රීම්/නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13.	සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
14.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
16.	සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
17.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
18.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
19.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
20.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
21.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
23.	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
24.	පොල් ලෙලි පෙගවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
25.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
26.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
27.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
28.	විනාකිරි නිපදවීම හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
29.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දූව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
30.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
31.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
32.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
33.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
34.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
35.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
36.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
37.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
38.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
39.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
40.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
41.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
42.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
43.	ටයර් නැවත නිපදවීම	500 0	750 0	1,000 0
44.	ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
45.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
46.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් රෙදිවිවීම	500 0	750 0	1,000 0
49.	පොහොර හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
50.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
51.	ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

දෙවන උපලේඛනය - අන්තරාදායක ව්‍යාපාර

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
1.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
2.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
3.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	කුකුළන් 50ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
7.	දර ගබඩාවත් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
9.	සිසිල්බීම නිෂ්පාදනය හෝ ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0"
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලත්වැඩියාව	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රානුසාරයෙන් පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලත් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
25.	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0

දෙවන උපලේඛනය - පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
01.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනාසල් හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
02.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
03.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම	500 0	750 0	1,000 0
04.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
05.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
06.	බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
08.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගෑස් සිලින්ඩර ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
12.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
14.	කිලෝග්‍රෑම් 100 වැඩියනේ තේ කුඩු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
15.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
16.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	පැට්‍රොල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල්වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
19.	වායුසමනය යන්ත්‍ර, ශීතකරණ හෝ අදි ශීතකරණ සේවා කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0 500 0	750 0 750 0	1,000 0 1,000 0
20.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වගෙන යාම	500 0	750 0	1,000 0
21.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

12 - 93/4

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01)05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත්වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන 30 සම්පූර්ණ වූ වහාම 2019 වර්ෂය සඳහා වන මෙම බද්ද, පාතදුම්බර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරමි.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුම මත ම එහි II තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට පාතදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
(1) 1.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
2.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
3.	සෑම කරත්තයක් සඳහා	20 0
4.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
5.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
6.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
7.	සෑම ඇතෙකු සඳහා	50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 93/5

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී තිරණ අංක ඉ(01)06 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් බත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙරප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටක; හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 5:1ට වඩා අඩු වන්නේ නම්

.

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට බිංදුවයි දශම දෙකයි පහයි (0.25%) වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පාතදුම්බර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි පාතදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

11 - 93/6

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් සඳහා ප්‍රචාරන ගාස්තු - 2019 වර්ෂය

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන සභා රැස්වීමේදී තිරණ අංක ඉ(01)07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රචාරක දැන්වීමේ ගාස්තු පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවා අවසර ලබාගත යුතු බව මෙයින් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xxx) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 38A-38A වැනි කොටසේ ප්‍රචාරක/දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාව යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂය සඳහා අය කිරීමට පාතදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක් සඳහා*
			රු.	රු.	රු.
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3ට අඩු	250.00	350.00	500.00
		3ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500.00	750.00	1000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500.00	750.00	1000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	150.00	150.00	200.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	750.00	850.00	1000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.500.00 බැගින්		

පාතදුම්බර ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක හෝ පරිශ්‍රයක රජයේ රක්ෂිත ඉඩමක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කරන විට ඉහත ගාස්තුවලට අමතරව මාසිකව බිම් කුලිය වශයෙන් නාගරික ප්‍රදේශයක් සඳහා රු. 1,000 ක් ද ග්‍රාමීය ප්‍රදේශයක් සඳහා රු. 250 ක් ද ගෙවිය යුතුය.

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

සේවා සඳහා ගාස්තු - 2019 වර්ෂය

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01)08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xiv) වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පාතදුම්බර ප්‍රාදේශීය සභාව 2019 වර්ෂයේ දී පහත උපලේඛනය යටතේ වූ සේවා ගාස්තු පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

උපලේඛනය

		රු. ශත
1.	වීථිරේඛා සහ නොපවරාගැනීමේ සහතික ගාස්තු	700 0
2.	අනුකූලතා සහතික ගාස්තු (වරිපනම් අය නොකරන ප්‍රදේශ සඳහා)	
	1. වර්ග අඩි 3,000 අඩු	3,000 0
	2. වර්ග අඩි 3,000ට වැඩි සෑම වර්ග මීටර් 1 සඳහා රු. 10 බැගින්	
3.	අනුබෙදුම් පෝරම ගාස්තු	250 0
4.	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	750 0
5.	ගොඩනැගිලි සැලසුම් කාලය දීර්ඝ කිරීම සඳහා එක් වර්ෂයකට	600 0
6.	(i) ඉඩම් අනුබෙදුම් සඳහා	
	පර්චස් 1 - 11.25-	500 0
	පර්චස් 11.25 -23.75-	400 0
	පර්චස් 23.75-35.50-	300 0
	පර්චස් 35.50 ට වැඩි	200 0

7. (i) *වරිපනම් අය නොකරන ප්‍රදේශවල ගොඩනැගිලි සැලසුම සඳහා පෙරසැරි ගාස්තු :*

වර්ග මීටර්	*නේවාසික ගොඩනැගිලි* *රු. ශත*	*නේවාසික නොවන* *රු. ශත*
45 ට අඩු	500 0	1,000 0
46 - 90ත් අතර	1,500 0	2,000 0
91 - 180ත් අතර	2,500 0	3,000 0
181 - 270 ත් අතර	3,500 0	4,000 0
271 - 450 ත් අතර	4,500 0	6,000 0
451 - 675 ත් අතර	5,500 0	8,000 0
676 - 900 අතර	6,500 0	10,000 0
901-1225ත් අතර	7,500 0	12,000 0
1226 ඉක්මවීමෙන් පසු වැඩිවන සෑම වර්ග මීටර 90 සඳහාම		1,000 0

(ii) මායිම් තාප්පයක් සඳහා		
ගොඩනැගිලි සීමාව තුළ	දික් මීටර් 1 ක් සඳහා	500 0
ගොඩනැගිලි සීමාවෙන් පිට	දික් මීටර් 1 ක් සඳහා	300 0

8.	ජල බවුසර් ගාස්තු :	*රු. ශත*
	ලීටර් 6,000	4,000 0
	1. බල ප්‍රදේශය තුළ කි.මී. 15 දක්වා	2,000 0
	2. වැඩිවන සෑම කි.මී. 1ක් රු. 100 බැගින් අයකරනු ලැබේ.	
9.	ජල ටැංකි කුළියට දීම ලීටර් 500 දිනකට	150 0
	ජල ටැංකි කුළියට දීම ලීටර් 1,000 දිනකට	250 0
	ජල ටැංකි කුළියට දීම ලීටර් 2,000 දිනකට	500 0
10.	නාපාන ශ්‍රවණාගාරය කුළියට දීම (දිනකට) -	
	මංගල උත්සව සඳහා	7,000 0
	පෙරපාසල් උත්සව සඳහා	2,000 0
	බාහිර ආයතන හා වෙනත් උත්සව කටයුතු සඳහා	4,000 0
	බල ප්‍රදේශයෙන් පිටත පෙර පාසල් සඳහා	4,000 0
11.	ස්කැවේටර් යන්ත්‍රය කුළියට දීම (එන්ජින් පැයකට)	1,200 0
	J.C.B. යන්ත්‍රය කුළියට දීම (එන්ජින් පැයකට)	2,400 0
12.	ජල සේවාවක් හෝ වෙනත් අවශ්‍යතාවයක් සඳහා ප්‍රාදේශීය සභා මාර්ග පළුදු කිරීමට අනුමත ලිපි නිකුත්කිරීම	400 0
13.	ගලි රථය ලබා දීම සඳහා අවසර ලිපි නිකුත්කිරීම	250 0
14.	තාවකාලික ගෝ ඝාතක බලපත්‍ර ගාස්තු	500 0
15.	කර්මාන්ත ලිපිද්‍රව්‍ය ගාස්තු	500 0
16.	ඔප්පු උදෘත පෝරම ගාස්තු (වරිපනම් ලේඛනයේ නම හා දේපළ වෙනස් කිරීම සඳහා)	350 0
17.	පරිසර බලපත්‍ර අයදුම්පත් ගාස්තු	250 0
18.	පරිසර බලපත්‍ර අළුත් කිරීමේ අයදුම්පත් ගාස්තු	250 0
10.	නව වරිපනම් ඒකකවල ඔප්පු උදෘත ලියාපදිංචි කිරීමේ ගාස්තු	600 0
20.	ප්‍රාදේශීය සභාවේ ගලි සේවය සැපයීම සඳහා (බැහැර කිරීමේ ස්ථාන සපයා ගැනීමට යටත්ව)	6,500 0
21.	අනතුරුදායක ගස් සම්බන්ධ අයදුම්පත්‍ර ගාස්තු	500 0
22.	නිදන් කරන ලද තක්සේරු නිවේදනය සනාථ කරන සහතික	250 0
23.	වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික	250 0
24.	කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ වාර්තා ගාස්තු (පොයින්ට් 1ට)	900 0
25.	මාර්ග ගැසට් පත්‍රයේ පිටපතක් සඳහා	50 0
26.	කොඩි කණුවක් සඳහා දිනකට ගාස්තු	20 0
27.	කාබනික පොහොර කිලෝ 1ක් සඳහා	20 0
28.	සැලසුම් ශිල්පී ලියාපදිංචි කිරීමේ ගාස්තු	7,500 0

ඊ නැණ පියස සේවා ගාස්තු

පාඨමාලාව	*පාඨමාලා ගාස්තු* *රු.*
මූලික පරිගණක පාඨමාලාව	3,500 0
ග්‍රැෆික්ඩිසයින් පාඨමාලාව	7,600 0
දෘඩාංග හා ජාලකරණ පාඨමාලාව	5,600 0
ඉංග්‍රීසි පාඨමාලාව	6.600 0

ඡායා පිටපත් ගාස්තු

වර්ගය	*ගාස්තුව (රු.)*
A4 තනි පිටුව	5 0
A4 දෙපිට	7 0
B4 තනි පිට	8 0
B4 දෙපිට	10 0
B5 තනිපිට	5 0
B5 දෙපිට	6 0
A3 තනිපිට	10 0
A3 දෙපිට	12 0

මහජන පුස්තකාල සේවා ගාස්තු

	විස්තරය	*ගාස්තු රු. ශත*
1	සාමාජික ඉල්ලුම්පත්‍ර ගාස්තුව	25 0
2	සාමාජිකත්වය අලුත්කිරීමේ ගාස්තුව	50 0
3	වැඩිහිටියන් සඳහා සාමාජික ගාස්තුව	100 0
4	ළමුන් සඳහා සාමාජික ගාස්තුව	50 0
5	(වයස අවුරුද්ද 14ට අඩු පාසල් ළමුන්) පොතක් නැති වූ විට ගෙවන ගාස්තුව	පොතක මිළ මෙන් දෙගුණයක් හා 25% දෙපාර්තමේන්තු ගාස්තුව
6	ජංගම පුස්තකාල සඳහා තැන්පතු මුදල	1,000 0
7	ජංගම පුස්තකාල සඳහා පොතක් නැති වූ විට ගිවිසුමේ සඳහන් මුදල	පොතක මිළ මෙන් දෙගුණයක් හා 25% දෙපාර්තමේන්තු ගාස්තුව
8	නියමිත කාලය තුළ පොතක් නැතිවූ විට ගිවිසුමේ සඳහන් මුදල	පොතක මිළ වෙන් දෙගුණයක් හා 25% දෙපාර්තමේන්තු ගාස්තුව
9	බල ප්‍රදේශයෙන් බැහැර ළමා හා වැඩිහිටි අය සඳහා සාමාජිකත්වය ලබාදීමට තැන්පතු ගාස්තු	වැඩිහිටියන් සඳහා රු. 250 0 හා ළමා රු. 100 0ක්
10	සාමාජිකත්වය ලියාපදිංචි ගාස්තුව	100 0

පාතදුම්බර ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක වන ජල යෝජනා ක්‍රම සඳහා පහත සඳහන් ගාස්තු චක්‍රය අනුව ගාස්තු අයකරනු ලැබේ.

ජල අයදුම්පත් ගාස්තුව රු. 250 0

අනු. අංකය	*ඒකක ප්‍රමාණය*	*වෙහෙරගල, උඟරාකොටේ, පුංචි බෝධිය, රටකහවත්ත හුන්නස්ගිරිය, දීගහවතුර, වල්අරඹ*
1.	මුල් ඒකක 05	රු. 15 0 බැගින්
2.	දෙවන ඒකක 05	රු 20 0 බැගින්
3.	තෙවැනි ඒකක 05	රු. 30 0 බැගින්
4.	සිව්වැනි ඒකක 05	රු. 40 0 බැගින්
5.	පස්වැනි ඒකක 05	රු. 50 0 බැගින්
6.	ඒකක 25න් පසු වැඩිවන ඒකකයක්	රු. 50 0 බැගින්
7.	ස්ථාවර තැන්පතු	රු. 100 0

මීට අමතරව පහත සඳහන් පරිදි විදුලි ගැලපුම් ගාස්තුවක් අයකරනු ලැබේ :

අනු. අංකය	ඒකක ප්‍රමාණය	වල් අරඹ	ගාස්තු උෆරාකොටේ, වෙහෙරගල දීගහවතුර, රටකහවත්ත
		රු. ශත	රු. ශත
1.	1-5	60 0	75 0
2.	6-10	100 0	125 0
3.	11-15	125 0	175 0
4.	16-20	150 0	225 0
5.	21-25	200 0	275 0
6.	25ට වැඩි	250 0	300 0

121 - 93/8

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(01)16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා අතුරු ව්‍යවස්ථාව අනුව 2019 වර්ෂය සඳහා ප්‍රාදේශිය සභාව මගින් පනවනු ලබන කසල ගාස්තුව සඳහා උපලේඛනයෙහි දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් අයකිරීමට යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*ව්‍යාපාරය/කර්මාන්තය*	*වර්ග අඩි 200ට අඩු*	*වර්ග අඩි 200ට වැඩි*
		රු. ශත	*රු. ශත*
01	හෝටල්/ආපන ශාලා/බේකරි	500 0	1,000 0
02	සිල්ලර කඩ	300 0	750 0
03	සාප්පු	300 0	1,000 0
04	පළතුරු කඩ	500 0	1.000 0
05	ඉන්ධන පිරවුම්හල් (දිරන කසළ පමණි)	500 0	500 0
06	ඇඟලුම් කර්මාන්ත (රෙදි කැබලි හා දිරන කසළ පමණි)	1,000 0	1,000 0
07	සුපර් මාර්කට්	1,000 0	1,000 0
08	ස.තො.ස	1.000 0	1,000 0
09	බැංකු	500 0	500 0
10	වෙනත්	500 0	500 0

අනු. අංකය	*ව්‍යාපාරය/කර්මාන්තය*	*මිළ රු. ශත*
01	එළවළු තොග කඩ (දිනකට කි.ග්‍රෑ. 50 උර 10) වැඩිවන සෑම උරයකටම රු. 100 0 බැගින් අයකරනු ලැබේ.	10,000 0
02	සිල්ලර කඩ	500 0

12 - 93/9

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2019 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක ඉ (02) යටතේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2018 ඔක්තෝබර් මස 16 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලය,
විජයපුර,
අනුරාධපුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ පනතේ විධිවිධාන යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වන තීරුවෙහි නිරූපිත යම් කාර්යයක් සඳහා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට දෙමින් ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතුයැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

උපලේඛනය

2019 වර්ෂයට වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
03. බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. ආපනශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. කිරි විකිණීම	500 0	750 0	1,000 0
10. මාළු විකිණීම	500 0	750 0	1,000 0
11. මස් විකිණීම	500 0	750 0	1,000 0
12. සිසිල්බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	700 0	1,000 0
13. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. ගවගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. පෞද්ගලික වෙළඳපොලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. කොන්ඩා කැපීමේ සැළුන්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. ගෝසාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

එසේ වුවද යම් පරිශ්‍රයක් හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නා වුවද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද අනුමත කර හෝ පිළිගත්තා වූ ද අවස්ථාවක බලපත්‍ර ගාස්තු 2019 වර්ෂයේ ඒ හෝටලයේ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි ආදායමෙන් 1%ක් විය යුතු ය.

12 - 128/1

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක ඉ (02) යටතේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2018 ඔක්තෝබර් මස 16 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලය,
විජයපුර,
අනුරාධපුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයේ බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතුයැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

උපලේඛනය

2019 වර්ෂයට කර්මාන්ත බදු අය කිරීම

I වැනි තීරුව	*II වැනි තීරුව*		
කර්මාන්තයේ ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු. 500 සීමාව)	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු. 750 සීමාව)*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු. 1,000 සීමාව)*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. සම් භාණ්ඩ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
02. ටේලර් සාප්පු	500 0	750 0	1,000 0
03. චිත්කලය	500 0	750 0	1,000 0
04. සබන් නිෂ්පාදන	500 0	750 0	1,000 0
05. පපඩම් නිෂ්පාදන	500 0	750 0	1,000 0
06. යෝගට් නිෂ්පාදන	500 0	750 0	1,000 0
07. නූඩ්ල්ස් නිෂ්පාදන	500 0	750 0	1,000 0
08. ගඩොල් නිෂ්පාදන	500 0	750 0	1,000 0
09. කොහු ඉදල් ලණු නිෂ්පාදන	500 0	750 0	1,000 0
10. බෑග් නිෂ්පාදන	500 0	750 0	1,000 0
11. අයිස්ක්‍රීම් නිෂ්පාදන	500 0	750 0	1,000 0
12. කුළු බඩු නිෂ්පාදන	500 0	750 0	1,000 0
13. රස කැවිලි, මුරුක්කු නිෂ්පාදන	500 0	750 0	1,000 0
14. නිමි ඇඳුම් නිෂ්පාදන	500 0	750 0	1,000 0
15. සම් භාණ්ඩ නිෂ්පාදන	500 0	750 0	1,000 0
16. බිම් මල් නිෂ්පාදන	500 0	750 0	1,000 0
17. වඩු මඩුව	500 0	750 0	1,000 0
18. හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19. රන්, රිදී, පිත්තල සකස් කිරීම හා ඔප දැමීම	500 0	750 0	1,000 0
20. යකඩ කම්හල්	500 0	750 0	1,000 0

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

අන්තරාදායක ව්‍යාපාර හා අප්‍රසන්න ව්‍යාපාර සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක ඉ (02) යටතේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2018 ඔක්තෝබර් මස 16 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලය,
විජයපුර,
අනුරාධපුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් සැලසී ඇති ප්‍රතිපාදන අනුව පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් 1988.08.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ අංක 21 දරන අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර වශයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතුයැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
කර්මාන්තයේ ස්වභාවය හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු. 500 සීමාව)	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු. 750 සීමාව)*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු. 1,000 සීමාව)*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. ඉන්ධන පිරවුම්හල්	500 0	750 0	1,000 0
02. පොල්ලෙලි වලවල් කර්මාන්ත	500 0	750 0	1,000 0
03. කෘමිනාශක නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04. පෑස්සුම් ස්ථාන	500 0	750 0	1,000 0
05. වෙඩි බෙහෙත් ගබඩා කරන ස්ථාන	500 0	750 0	1,000 0
06. ගෑස් සිලින්ඩර ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
07. මෘත ශරීර බෙහෙත් ගැල්වීමේ ස්ථානය	500 0	750 0	1,000 0

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2019 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 147 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් හා සතෙක් වෙනුවෙන් මෙහි උපලේඛනයේ සඳහන් අනු ප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතුයැයි 2018 ඔක්තෝබර් මස 16 වැනි දින පැවති මහා සභාවේදි ගරු සභාපති එස්. බී. කුමාරදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2018 ඔක්තෝබර් මස 16 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලය,
විජයපුර,
අනුරාධපුර.

උපලේඛනය

වාහන හා සත්ත්ව බද්ද	*රු. ශත*
මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක්	25 0
මෝටර් ලොරියක්, රික්ෂෝවක් කරත්තයක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	
සෑම බයිසිකලයක් හෝ කරත්තයක් සඳහා	
කරත්තයක් සඳහා -	
(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් පා පැදි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ සේවා ගාස්තුව	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත්ට්‍රැක්ටරයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ එළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

12 - 128/4

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක ඉ (02) යටතේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2018 ඔක්තෝබර් මස 16 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලය,
විජයපුර,
අනුරාධපුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය වන්නාවූ යම් ව්‍යාපාරයක් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරය 2018 වර්ෂයේ ආදායම මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතුයැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහ සම්මත විය.

I වැනි තීරුව	*II වැනි තීරුව*
වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	*අයකරනු ලබන මුදල රු. ශත*
රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,000.00 ඉක්මවන එහෙත් රු. 12,000.00 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000.00 ඉක්මවන එහෙත් රු. 18,750.00 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750.00 ඉක්මවන එහෙත් රු. 75,000.00 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000.00 ඉක්මවන එහෙත් රු. 1,50,000.00 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000.00 ඉක්මවන අවස්ථාවක	3,000 0

ඉහත උපලේඛනයේ සඳහන් පළමු වන තීරුවේ 2018 වර්ෂයේ ව්‍යාපාර ආදායම දෙවන තීරුවේ සඳහන් අය කිරීම මත වාර්ෂික වෙළෙඳ බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු උපලේඛනයේ සඳහන් ව්‍යාපාර හැර සෙසු සියලු ව්‍යාපාර, ව්‍යාපාර බද්දට 2019 වර්ෂය වෙනුවෙන් ඒ ඒ ආදායම මත ඒ ඒ අය කිරීමට යටත් වන්නේ ය.

12 - 128/5

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2019 වර්ෂයට විනෝද බදු පැනවීම

1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධිත) පනතින් සංශෝධිත 1964 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත සියලු විනෝද කටයුතු සඳහා අයකරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පනවා අය කිරීමට 1964 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ගාස්තු අය කිරීමට 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතුයැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහ සම්මත විය.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2018 ඔක්තෝබර් මස 16 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලය,
විජයපුර,
අනුරාධපුර.

12 - 128/6

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම

ප්‍රචාරක දැන්වීම් පුවරු/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/07 දරන *අති විශෙෂ* ගැසට් පත්‍රයේ පළාත් පාලන, නිවාස හා ඉදි කිරීම් ගරු අමාත්‍යතුමා අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට/පාරකට/ ඇළකට/මුහුදට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීමට 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතුයැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

අනු. අංකය	*විස්තරය*	*එක් වර්ෂයක ගාස්තුව*
		රු. ශත
01	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා වර්ග අඩියකට	75 0
02	සෑම වර්ගයකම ප්‍රචාරක බැනරයක්/කටවුට් සඳහා වර්ග අඩියකට	100 0

අනු. අංකය		නේවාසික රු. ශ.	කෘෂිකාර්මික රු. ශ.	වාණිජ රු. ශ.
1.	පර්චස් 40 දක්වා	200 0	1,000 0	1,000 0
2.	පර්චස් 80 දක්වා	500 0	2,000 0	2,000 0
3.	පර්චස් 160 දක්වා	1,000 0	4,000 0	4,000 0
4.	පර්චස් 160 ට වැඩි	2,000 0	5,000 0	5,000 0

කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යන්හි දී ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු පහත සඳහන් පරිදි 2019 වසර සඳහා අයකරනු ලැබේ.

	රු. ශ.
1. ගොඩනැගිලි අයදුම්පත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තු	500 0
2. අනුකූලතා සහතික සඳහා	1,000 0

ගොඩනැගිලි අනුමත කිරීමේදී වර්ග මීටර් ප්‍රමාණය අනුව ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු අය කරනු ලැබේ.

ගෙබීමේ විශාලත්වය වර්ග මීටර්වලින්	පදිංචිය සඳහා	වාණිජ හෝ වෙනත් භාවිත රු. ශත
45ට අඩු	500 0	1,000 0
45 - 90	1,500 0	2,000 0
91 - 180	2,500 0	3,000 0
181 - 270	3,500 0	4,000 0
271 - 450	4,500 0	6,000 0
451 - 675	5,500 0	8,000 0
676 - 900	6,500 0	10,000 0
901 - 1225	7,500 0	12,000 0
1225 ට වැඩි	7,500 0	12,000 0
	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 1,000 බැගින්	ව. මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 1,250 බැගින්

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 20 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

නාඋල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට වරිපනම් බදු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 1(VI) *අ* යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(*අ*) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශට පත් කරන ලද්ද වූ ද, බල ප්‍රදේශ තුළ පිහිටි නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා පෙර වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව 2019 වර්ෂයටත් පිළිගනු ලැබේ.

(*ආ*) එම තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට පහ (5%) ක වරිපනම් බද්දක් පනවා අයකිරීමට ; සහ

(*ඇ*) එම බද්ද 134 වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර 2019 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් නාඋල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවටත් නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

වර්ෂයට අදාළ වරිපනම් බදු මුදල් ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ගෙවන්නේ නම් සියයට දහය (10%) ක වට්ටමක් ද කාර්තු ලෙස ගෙවන්නේ නම් කාර්තුවේ මුල් මාසය තුළ හෝ ඊට පෙර මුදල් ගෙවන විට සියයට පහ (5%) ක වට්ටමක් ද හිමි වනු ඇත.

නියමිත දිනට බදු නොගෙවන විට මුඩු ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් අයවිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහළොව (15%) ක් ද, ව්‍යාපාර සඳහා සියයට විස්ස (20%) ක් ද ආදී ලෙස වරෙන්තු ගාස්තු අය කරනු ලැබේ.

12-82/1

නාඋල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 1(VI) *ආ* යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ බලපත්‍ර ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 (1) *ආ* ඡේදයෙන් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි (1) වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ (2) තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

I වන උපලේඛනය

බලපත්‍ර ගාස්තු

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	බත් කඩ, ආපන ශාලා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	තේ සහ කෝපි කඩ පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කිරිපට්ටි සහ කිරි වෙළඳාම සිදු කිරීම	500 0	750 0	1,000 0
06.	අයිස් කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	කෘත්‍රිම පොහොර සෑදීම සඳහා හුණු, ගම් ඇට ආදිය ගෝනියකට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
08.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
10.	ගවගාල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	සැලුන්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සිල්ලර කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	තොග කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	බාබර් සැලුන් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	මස් පිණිස කුකුළන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බිත්තර පිණිස කුකුළන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	බැටළුවන්, ඌරන් හෝ එළුවන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	මෝටර් වාහන බෝඩි සාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	යතුරු පැදි හෝ ත්‍රිරෝද රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	මෝටර් රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	මිරිදිය හෝ කරදිය මාළු සිල්ලර වෙළඳාම	500 0	750 0	1,000 0
23.	මිරිදිය හෝ කරදිය මාළු තොග වෙළඳාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
24.	පුද්ගලික ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	යාන්ත්‍රික වඩු වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	යාන්ත්‍රික නොවන වඩු වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	යන්ත්‍ර භාවිතා කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ලෑලි පදම් කිරීමේ හෝ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	දර මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	බෙලෙක් වැඩපළක් හෝ වාස්තු වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ශීතකරණ, අධි ශීතකරණ හෝ වායු සමනය කිරීමේ යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	බලවේග යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දමන යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	සත්ව ආහාර වර්ග ගබඩා කිරීම හෝ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	වී කෙටීමේ හෝ ධාන්‍ය ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	පෝස්ටර් හෝ දැන්වීම් මුද්‍රණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	තොග වශයෙන් විකිණීම සඳහා ආහාර වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	පුද්ගලික සිංහල බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	ගවමස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	එළු මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	තේ කුඩු ගබඩා කිරීම, නැවත සකස් කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	පුද්ගලික සිංහල බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	ලේත් මැෂින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීම හෝ සිල්ලර අලෙවිය	500 0	750 0	1,000 0
49.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	අයිස් පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	නූඩ්ල්ස් හෝ බිස්කට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	පැරණි යකඩ බඩු මිලට ගෙන අලෙවි කිරීම	500 0	750 0	1,000 0
54.	ගෘහ විදුරු වර්ග අලෙවි කිරීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
55.	බුලත්, පුවක් තොග හෝ සිල්ලර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
56.	සීනි, පිටි, හාල් තොග අලෙවි කිරීම	500 0	750 0	1,000 0
57.	ඇස් කණ්නාඩි, දෘෂ්ටි උපකරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	ස්වර්ණාභරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	විසිතුරු මසුන් ඇති කිරීම, විකිණීම, අපනයනය	500 0	750 0	1,000 0
61.	රූපලාවණ්‍ය කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	වතුර බෝතල් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
63.	ගෑස් භාවිතා කරන උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	ධාන්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	එළ හරක් මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	මී මැසි පාළනය හෝ මී පැණි අලෙවිය	500 0	750 0	1,000 0
67.	කුළු බඩු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
68.	ටයිල් වර්ග අලෙවිය	500 0	750 0	1,000 0
69.	තේ කුඩු පැකට් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
70.	බීජ ඇට පැකට් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
71.	බයිට් වර්ග	500 0	750 0	1,000 0
72.	සිසිල් බීම අලෙවිය	500 0	750 0	1,000 0
73.	පශු වෛද්‍ය ඖෂධ හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	පිඟන් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	සිංහල බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	සිමෙන්ති හෝ ඇස්බැස්ටස් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	ශබ්දවාහිනී යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	මනි බඩු හෝ සුවඳ විලවුන් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	පොහොර වර්ග ගබඩා කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
82.	පදික වේදිකාවල වෙළඳාම	500 0	750 0	1,000 0
83.	මී කිරි අලෙවිය හෝ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
84.	රස කැවිලි අලෙවිය හෝ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	ශීත කළ මස්,මාළු අලෙවිය	500 0	750 0	1,000 0
86.	තෙල් හිදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	මිරිස් ඇඹරීම හෝ මිරිස් කුඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
88.	යකඩ බඩු අලෙවිය	500 0	750 0	1,000 0
89.	මැටි භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
90.	කෘෂි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	ලී බඩු අලෙවිය	500 0	750 0	1,000 0
92.	මස්,මාළු සිල්ලර අලෙවිය	500 0	750 0	1,000 0
93.	විදුලි උපකරණ අලෙවිය හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
94.	ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීම	500 0	750 0	1,000 0
95.	භූමිතෙල් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
96.	ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ වෙළඳාම	500 0	750 0	1,000 0
97.	ලේ, මුත්‍රා හෝ වෙනත් රෝග පිළිබඳ පරීක්ෂා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100.	මිනිරන් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
101.	පොහොර වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102.	පුවක් චේලීම	500 0	750 0	1,000 0
103.	කොහු සායම් කිරීම	500 0	750 0	1,000 0
104.	උම්බලකඩ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105.	ලුණු හෝ කරවල වෙළඳාම	500 0	750 0	1,000 0
106.	හුණු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
107.	කබොක් ගල් ගබඩා කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
108.	අයිස් ක්‍රීම් සෑදීම හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
109.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
110.	මෝටර් රථ වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
111.	ලියවන පට්ටලයක් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
112.	ටයර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
113.	ඇසිටික් ඇසිඩ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
114.	සත්ත්ව ආහාර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
115.	කෘමි නාශක අලෙවිය	500 0	750 0	1,000 0
116.	මිනිරන් ඇසිරීම්, කැනීම් කටයුතු	500 0	750 0	1,000 0
117.	කරවල කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
118.	කිරි ආහාර ද්‍රව්‍ය වෙළඳාම් කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

සැ. යු. - 1986 අංක 14 දරන සංවර්ධන පනතේ කාර්යය සඳහා ලියාපදිංචි කර ඇත්තා වූ ද හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පළක් වන විට අය කළ යුතු බලපත්‍ර ගාස්තුව, අය කළ යුතු වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් (1%)ක් විය යුතු ය.

නාඋල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ව්‍යාපාර/වෘත්තීය බදු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 1(VI) ඇ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර හා වෘත්තීය බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (I) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2019 වර්ෂයේ පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2018 ආදායම මෙහි පහත උපලේඛනයේ 1 වන අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් පනවා අය කිරීමට ද,

(ආ) (3) 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථොක්ත බද්ද 2019 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු යැයි විධානය කිරීමට; සහ

(ඇ) 2019 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධ වූ විට යථොක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස තුනක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ද, නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

ව්‍යාපාර/වෘත්තීය බදු

1 වන උපලේඛනය

01.	උකස් බඩු ගැනුම්කරුවන්
02.	ඒජන්තවරුන් මාර්ගයෙන් බඩු විකිණීම
03.	කොමිස් ඒජන්තවරුන්
04.	අවමංගල්‍ය කටයුතු භාරගන්නන්
05.	ආහාරපාන සපයන්නන්
06.	අල, එෑනු, කරවල තොග වෙළඳාම
07.	කොන්ත්‍රාත්කරුවන්
08.	කුළී රථ හිමියන්
09.	පෙට්ට්‍රල්, ඩීසල්, ඛනිජ තෙල් ගබඩා කිරීම හා විකිණීම
10.	කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
11.	කළු ගල්, බොරළු, කාබොක් ආදී කැනීම්
12.	ගෘහ නිර්මාණ ශිල්පීන්
13.	ගණන් පරීක්ෂකවරුන් හා ගණකාධිකාරීවරුන්

14. තොග ගෑස් වෙළඳාම
15. යන්ත්‍රානුසාරයෙන් ගඩොල්, උළු නිෂ්පාදනය
16. නොතාරිස් හා නීතීඥවරුන්
17. නවාතැන්පොළවල්, ආපනශාලා
18. තොග එළවළු වෙළඳාම
19. විදුලි සංදේශ කුළුණු
20. යතුරු පැදි, ත්‍රිරෝද රථ අලෙවි කිරීම
21. දෘෂ්ටි පරීක්ෂකවරුන්
22. ධාන්‍ය තොග මිලදී ගැනීම
23. ප්‍රවාහන නියෝජිතයින්
24. ප්‍රවාහන අයිතිකරුවන් (පුද්ගලික)
25. පෞද්ගලික අධ්‍යාපන පන්ති පැවැත්වීම
26. බ්‍රෝකර්වරුන්
27. රට බීමහලක්, සැර බීම සාප්පුවක් පවත්වාගෙන යාම
28. බීජ නිෂ්පාදන (වී, එළවළු) ආයතන පවත්වාගෙන යාම
29. මුදල් ආයෝජකයින්
30. මැණික් වෙළඳ ව්‍යාපාරිකයින්
31. මූල්‍ය ආයතන තැන්පතු
32. පෞද්ගලික මිනින්දෝරුවන්
33. මුදල් සපයන්නන් හා මුදල් ණයට දෙන්නන්
34. යන්ත්‍ර උපකරණ, බර වාහන කුළියට දීම
35. රියදුරු පුහුණු ආයතන පවත්වාගෙන යාම
36. රක්ෂණ නියෝජිතයින්
37. රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
38. රේස් ඔට්ටු බාරගන්නන්
39. මෝටර් රථ වෙළඳාම
40. ලොතරැයි නියෝජිතයින්
41. වෙන්දේසිකරුවන්
42. යන්ත්‍රානුසාරයෙන් සහල් සැකසීම
43. පුද්ගලික වනවගා ව්‍යාපාරය
44. සැලසුම්කරුවන්
45. පුද්ගලික සායන හා සාත්තු කරුවන්
46. ඇඟළුම් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම
47. බෝට්ටු සේවයක් පවත්වාගෙන යාම
48. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීම
49. උත්සව ශාලා පවත්වාගෙන යාම
50. පුද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
51. නවාතැන්පළක් පවත්වාගෙන යාම
52. ගල් මෝලක් පවත්වාගෙන යාම
53. දේපළ වෙළඳ සමාගමක් පවත්වාගෙන යාම
54. ශරීර සුවතා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
55. ගල් වැඩපළක් පවත්වාගෙන යාම
56. ගෑස් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. තොග වශයෙන් සිගරට් අලෙවි කිරීම
58. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
59. උපදේශන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
(පරිසර, ආර්ථික, කෘෂි, වෙනත්)
60. වැලි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

2 වන උපලේඛනය

I තීරුව	*II තීරුව*
2019 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
01. රු. 6,000 නොඉක්ම වූ අවස්ථාවක	කිසිවක් නැත
02. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
03. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180.00
04. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360.00
05. රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක	1,200.00
06. රු. 150,000 ඉක්මවන අවස්ථාවක	3,000.00

12-82/3

නාඋල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 14 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 1(VI) ඈ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (I) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වා ගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I තීරුවෙහි නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත යම් කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බව ද,

(ආ) එකී පනතේ 150 (3) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටොක්ත බද්ද 2019 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු යැයි විධානය කිරීමට ; සහ

(ඇ) 2019 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධ වූ විට යටොක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස තුනක් ඇතුළත කර්මාන්ත කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

කර්මාන්ත බදු

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්ත*	*රු. 750.00 දක්වා*	*රු. 750.00 එහෙත් රු. 1,500.00 නොඉක්මවවූ*	*රු. 1,500.00 වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ගඩොල් හෝ උළු ගබඩා කිරීම හෝ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කළුගල් ඇඹරීම, විසිතුරු කිරීම හෝ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ගල් ස්මාරක නිපදවීම හෝ ගල් උපකරණ නෙලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ලෝහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කොන්ක්‍රීට් හෝ මැටි නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ජෝතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	සම්භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කොහු හෝ වෙනත් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	යන්ත්‍ර භාවිතා කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ට්‍රක්ස් හෝ සූට්කේස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගිනි පෙට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	වීදුරු භාණ්ඩ නිපදවීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	සායම්වර්ග නිපදවීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	සෙල්ලම් බඩු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	සුවඳ විලවුන් හෝ හඳුන්කුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ස්වර්ණාභරණ නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	විදුලි උපකරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	විවිධ යන්ත්‍ර උපකරණ නිපදවීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්ත*	*රු. 750.00 දක්වා*	*රු. 750.00 එහෙත් රු. 1,500.00 නොඉක්මවූ*	*රු. 1,500.00 වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
25.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	පළතුරු බීම වර්ග හෝ සිසිල් බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	සත්ත්ව ආහාර වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	පොල්තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	පපඩම් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	බීරළු ලියවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ආහාර සඳහා බිම්මල් නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	මෙට්ට නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	පැළ තවානක් පවත්වාගෙන යාම, අළෙවි කිරීම	500 0	750 0	1,000 0
35.	විවිධ යන්ත්‍ර උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	වාහන ෂීට් නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ලී කැටයම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	ලියුම් කවර සකස් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	සබන්, ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	පැන්ට්‍රි කබඩ්, කාඩ්බෝඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	බීඩ් හෝ සුරුට්ටු එතීමේ, ගබඩා කිරීමේ ස්ථානයක් හෝ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
43.	මැණික් ඔප දැමීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
44.	පාවහන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	පිඟන් බඩු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ඡායාරූප පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	කැසට් පටි හෝ වීඩියෝ පටි කුළියට දීම, පටිගත කිරීම හෝ වෙළෙඳාම	500 0	750 0	1,000 0
48.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	උත්සව භාණ්ඩ කුලියට දීම	500 0	750 0	1,000 0
50.	සුරතල් සතුන් විකිණීම	500 0	750 0	1,000 0
51.	පිත්තල බඩු නිෂ්පාදනය කිරීම හෝ වෙළෙඳාම් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්ත*	*රු. 750.00 දක්වා*	*රු. 750.00 එහෙත් රු. 1,500.00 නොඉක්මවවූ*	*රු. 1,500.00 වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
52.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ වෙළෙඳාම	500 0	750 0	1,000 0
53.	පරණ පුවත්පත් හෝ ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
54.	හිස් බෝතල් හෝ ෂොපින්, යකඩ සුන්බුන් එකතු කිරීම හෝ ගබඩා කිරීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	දුරකථන සේවා හෝ ෆැක්ස් සේවා සැපයීම	500 0	750 0	1,000 0
56.	ව්‍යාපාරයක් වශයෙන් සිමෙන්ති ගල් නිපදවීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
57.	මැණික්, වෙනත් වටිනා ඛනිජ ද්‍රව්‍ය වෙළෙඳාම	500 0	750 0	1,000 0
58.	පොල් පරාල වෙළෙඳාම	500 0	750 0	1,000 0
59.	පිංතූර රාමු කිරීම	500 0	750 0	1,000 0
60.	ටයර් වෙළෙඳාම	500 0	750 0	1,000 0
61.	මෙට්ට වෙළෙඳාම	500 0	750 0	1,000 0
62.	කොප්පරා නිෂ්පාදනය, සකස් කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
63.	තීන්ත වෙළෙඳාම කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	ලොතරැයි අලෙවිහලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	නිමි ඇඳුම් වෙළෙඳාම	500 0	750 0	1,000 0
66.	යතුරු පැදි හෝ පාපැදි අමතර කොටස් වෙළෙඳාම	500 0	750 0	1,000 0
67.	මෝටර් රථ වාහන අමතර කොටස් වෙළෙඳාම	500 0	750 0	1,000 0
68.	ටයර් කට්ට කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	පරිගණක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	අනුමැතිය ලත් ලී ගබඩා කිරීම	500 0	750 0	1,000 0
72.	පරිගණක උපාංග වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	අටපිරිකර භාණ්ඩ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
74.	පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම හෝ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
75.	හඳුන් කුරු නිෂ්පාදනය හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
76.	දුම් කොළ බාම් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	ගොඩනැගිලි ද්‍රව්‍ය කුලියට දීම	500 0	750 0	1,000 0
78.	කොහු ඇඹරුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	පොල් ලෙලි වළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	සම් භාණ්ඩ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
82.	ටෙන්ට් රෙදි මැසීමේ, සවි කිරීමේ හෝ කුෂන් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්ත*	*රු. 750.00 දක්වා*	*රු. 750.00 එහෙත් රු. 1,500.00 නොඉක්මවූ*	*රු. 1,500.00 වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
84.	වාර්නිෂ් ගබඩා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
85.	විදුලි බලයෙන් රන්, රිදී, ක්‍රෝමියන් ආලේප කිරීම	500 0	750 0	1,000 0
86.	බැටරි චාජ් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	නූල් කටින ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	ලැමිනේටින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	ජුකී මැෂින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	රබර් නිළ මුද්‍රා සෑදීම හෝ ප්ලාස්ටික් නාම පුවරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93.	කිරුම් මිනුම් භාණ්ඩ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
94.	අඟුරු ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95.	සුළු අපනයන බෝග ගබඩා කිරීම, මිලදී ගැනීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	බතික් ප්‍රදර්ශනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	සාප්පු බඩු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	මසා නිම කළ ඇඳුම් වෙළඳාම	500 0	750 0	1,000 0
100.	ඇස් කණ්ණාඩි වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
101.	ඔරලෝසු අලුත්වැඩියාව හෝ වෙළඳාම	500 0	750 0	1,000 0
102.	ශීතකරණ හෝ වායු සමීකරණ වෙළඳාම	500 0	750 0	1,000 0
103.	මෝටර් සයිකල් හෝ පාපැදි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104.	බ්‍රේක්ලයිනර් විකිණීම	500 0	750 0	1,000 0
105.	වෛද්‍ය උපදේශන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
106.	සයිලන්සර් නිපදවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
107.	ජංගම දුරකථන අලෙවි කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
108.	කොප්පරා නිෂ්පාදනය කිරීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
109.	ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ නිපදවීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
110.	පරිගණක අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
111.	කට් පීස් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
112.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

නාඋල ප්‍රාදේශීය සභාව

විනෝද බදු ආඥාපනත යටතේ විනෝද බදු පැනවීම - 2019

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වන දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 1(VI) ඉ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(267 අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ පළමු වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ආඥාපනතේ විස්තර කර ඇති විනෝද කටයුත්තකට ඇතුලත් වන ගෙවීම්වලින් බද්දක් පනවා අය කරනු ලැබේ. මෙහි විධිවිධාන යටතේ 2019 වර්ෂය සඳහා විනෝද බද්දක් 2019.01.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි නාඋල සභා බල ප්‍රදේශය ඇතුළත පැවැත්වෙන විනෝද කටයුත්තක් සඳහා මුද්‍රණ ගත ටිකට් පත්වල වටිනාකමින් 10%ක මුදලක් අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-82/5

නාඋල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වන දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 1(VI) ඊ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව,
නාඋල.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.02.23 දිනැති 1955/7 දරන පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ගරු පළාත් පාලන ඇමතිතුමා විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව දෙවන කොටසේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් හෝ බැනර් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සඳහා පහත දෙවන උපලේඛනයේ පරිදි ගාස්තු 2019.01.01 දින සිට අයකරන බවට නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

01 උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධ ඉල්ලුම්පත්‍රය

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..... .
02. ස්ථිර ලිපිනය : ..... .
03. අයදුම්කරුගේ දුරකථන අංකය : ..... . විද්‍යුත් තැපෑල : ..... .
04. දැන්වීම් ප්‍රචාරය කිරීමට අදහස් කරන වෙළෙඳ ව්‍යාපාරය, උත්සවය, ප්‍රදර්ශනය, සැණකෙළිය, රැස්වීම හෝ වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය : ..... .
05. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වන ස්ථානය/ස්ථාන : ..... .
06. අදළ ආකෘතිය අමුණා තිබේ ද? : ..... .
07. ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීම් වර්ගය (බැනර්, පුවරු, කටවුට්, බිත්ති, තාප්ප හෝ ස්ථාවර) : ..... .
08. යම් අයුරකින් තම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසුව ද දැන්වීම් දූර්වර්ණ වීම, ඇලවීම, ගැලවීම, බිමට කඩා වැටීමක් සිදුවුවහොත් යථා පරිදි සකස් කිරීමට එකඟ වන්නේ ද? යන්න : ..... .

ප්‍රාදේශීය සභාවේ පිළිගත් නියමයන්ට එකඟව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට එකඟ වන අතර, ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ද, හොඳාකාරවම මම දනිමි.

දිනය : ..... .

.....
(අයදුම්කරුගේ අත්සන)

02 උපලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග ප්‍රමාණය මීටර්*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250/-	350/-	500/-
		1ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3ට අඩු	250/-	350/-	500/-
		3ට වැඩි	3 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500/-	750/-	1,000/-
		1ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300/- බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500/-	750/-	1,000/-
		1ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300/- බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250/-	350/-	500/-
		1ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250/-	350/-	500/-
		1ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	750/-	850/-	1,000/-
		1ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500/- බැගින්		

නාඋල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට වෙනත් ගාස්තු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 1(VI) උ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 2016.02.23 දිනැති 1955/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ ගරු පළාත් පාලන ඇමතිතුමා විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ පරිදි වෙනත් ගාස්තු පනවා අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

I උපලේඛනය

අනු. අංකය	*පෝරම ගාස්තු හා වෙනත් ගාස්තු*	*මුදල රු. ශත*
01	වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකය සඳහා ගාස්තුව (පරීක්ෂා කිරීමේ රු. 350.00 අවමයකට යටත්ව ඔප්පුවේ සඳහන් වටිනාකමින් 1%ක් රු. 100,000.00 දක්වා සහ එය ඉක්මවන වටිනාකමින් 0.5% බැගින් වූ පරීක්ෂා කිරීමේ ගාස්තුවක් අය කෙරේ. වලංගු කාල සීමාව මාස 06 කි. දීර්ඝ කිරීමේ ගාස්තු රු. 400.00 කි.)	500.00
02	වරිපනම් බදු ලේඛනයේ පිටපතක් සඳහා ඒ.ටී.ඩී. පෝරම ගාස්තු	250.00
03	වරිපනම් බදු තක්සේරු ලේඛනයේ පිටපතක් ලබාගැනීම සඳහා පළමු වසරට (ඊළඟ වර්ෂයේ සිට වසරකට රු. 10.00 බැගින්)	100.00
04	පරිසර බලපත්‍ර, අයදුම් පත්‍ර ගාස්තු	250.00
05	පරිසර බලපත්‍ර අලුත් කිරීම සඳහා ගාස්තු	100.00
06	මස් කඩ හා මස් ප්‍රවාහනය සඳහා ගාස්තු (මසකට)	1,000.00
07	සතිපොළ ගාස්තු අය කිරීම ස්වභාවය, ධාරිතාව, එකතුකළ වටිනාකම හා හානිපූරණය මත	අවමය රු. 50 සිට උපරිමය රු. 250 දක්වා
08	ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගාස්තු * ක්‍රිකට් තරග සඳහා • පුරවැසියන්, පෞද්ගලික ආයතන, රාජ්‍ය ආයතන සඳහා • මැටින් එක නොමැතිව • මැටින් එක සහිතව • නාඋල කලාපයේ පාසල් සඳහා • පිට පාසල් සඳහා	 4,000 0 6,000 0 500 0 2,000 0

අනු. අංකය	*පෝරම ගාස්තු හා වෙනත් ගාස්තු*	*මුදල රු. ශත*
	* විවිධ අවස්ථාවන් සඳහා සංගීත සංදර්ශන, අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, ජාතික උත්සව, විවිධ උත්සව, කානිවල් ඇතුලු විවිධ වැඩසටහන් සඳහා (ස්වභාවය, ධාරිතාවය, එකතු කළ වටිනාකම හා හානිපූරණය සලකා බැලීම මත)	අවමය රු. 2,000 සිට උපරිමය රු. 20,000 දක්වා
09	පුස්තකාල සඳහා ගාස්තු I. ඉල්ලුම්පත්‍ර ගාස්තු II. ඇතුළත්වීමේ ගාස්තු III. අලුත් කිරීම සඳහා ගාස්තු (දඩ ගාස්තු දවස් 14ක් ඉක්මවන විට එක් පොතක් සඳහා ගාස්තු දවසකට රුපියල්)	 20.00 100.00 50.00 1 0
10	ත්‍රීරෝද රථ ගාස්තු හා සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තු I. එක් ත්‍රීරෝද රථයක් සඳහා මාසික ගාස්තු II. ත්‍රීරෝද රථ සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තු III. ත්‍රීරෝද රථ නැවතුම්පළක් සඳහා ත්‍රී රෝද රථයක් ඇතුළත් කිරීමේ ගාස්තු	 75.00 2,000.00 5,000.00
11	අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම (ස්වභාවය, ධාරිතාවය, එකතු කළ වටිනාකම, හානිපූරණය සලකා බැලීම මත)	අවමය රු. 1,000 සිට උපරිමය රු. 5,000 දක්වා

12-82/7

නාඋල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ගොඩනැගිලි ඉදිකිරීම් මත ගාස්තු හා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ගාස්තු අයකිරීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 1(VI) ඌ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
නාඋල.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21.49.78 වගන්තිවලින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2016.02.23 දිනැති අංක 1955/7 දරන පළාත් පාලන *අති විශෙෂ* ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී අති බලතල අනුව, 2019.01.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

I වන උපලේඛනය

ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු	රු. 500

සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කළයුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු*	
(i) ඉඩම් අනු කොටස්වලට බෙදීම සඳහා සංවර්ධන බලපත්‍රය	"අ"	පෙරසැරි ගාස්තු බිම් කට්ටියක ප්‍රමාණය	එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග, කාණු හා පොදු බිම් කොටස් හැර)
		ව.මී. 150 -300 අතර	රු. 500
		ව.මී. 301 - 600 අතර	රු. 400
		ව.මී. 601 - 900 අතර	රු. 300
		ව.මී. 900 ට වැඩි	රු. 200

(ii) ගොඩනැගිලි ඉදිකිරීම/පවත්නා ගොඩනැගිලිවලට කොටසක් එකතු කිරීම/ නැවත ඉදි කිරීම	"ආ"	*ගෙබිමේ විශාලත්වය මීටර් වලින්*	*පදිංචි සඳහා*	*වාණිජ හෝ වෙනත් භාවිත*
		45 ට අඩු	500	1,000
		45 - 90	1,500	2,000
		91 - 180	2,500	3,000
		181 - 270	3,500	4,000
		271 - 450	4,500	6,000
		451 - 675	5,500	8,000
		676 - 900	6,500	10,000
		901 - 1225	7,500	12,000
		1225 ට වැඩි	1,500	12,000
			ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු.1,000 බැගින්	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1,250 බැගින්

II. නීත්‍යානුකූල කිරීමේ දී දඩ මුදල් අය කිරීම.

(*අ*) අත්තිවාරම් අවසානය දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට රු. 5.00 බැගින් ද,
(*ආ*) ජනේල මට්ටමට ඉදිකර ඇත්නම් වර්ග අඩියකට රු. 6.00 බැගින් ද,
(*ඇ*) බිත්ති අවසානය දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට රු. 7.00 බැගින් ද,
(*ඈ*) වහල අවසානය දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට රු. 8.00 බැගින් ද,

III. ගොඩනැගිලි අයදුම් පත්‍ර කාලය දීර්ඝ කිරීමේ ගාස්තු එක් වර්ෂයකට රු. 500.00

IV. අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු පහත පරිදි වේ.

* නේවාසික ඉදි කිරීම් සඳහා ව.මී. 300 ට අඩු රු. 30,00,000.00 සහ ඊට වැඩි වන සෑම ව.මී. එකකට රු. 10.00 බැගින්,
* වාණිජ හා වෙනත් ඉදි කිරීම් සඳහා ව.මී. 100 ට අඩු රු. 3,000.00 සහ ඊට වැඩි වන සෑම ව.මී. එකකට රු. 20.00 බැගින්,

නාඋල ප්‍රාදේශීය සභාව

දුරකතන කුළුණු ගාස්තු 2019

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 1(VI) ඒ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ දුරකතන කුළුණු ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, වෙනත් ව්‍යාපාර මත බදු අය කිරීම යටතේ බලපත්‍ර සඳහා වන උපරිම ගාස්තුවට යටත්ව රු. 3,000.00 ක ගාස්තුවක් දුරකතන කුළුණු සඳහා අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

12-82/9

නාඋල ප්‍රාදේශීය සභාව

ජල ගාස්තු 2019

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වන දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 1(VI) ඒ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, සභාව විසින් නඩත්තුකර පවත්වාගෙන යනු ලබන හාඩුව ජල යෝජනා ක්‍රම මගින් ලබා දෙන ජලය සඳහා පාරිභෝගිකයින්ගෙන් 2013.11.28 දින පැවති සභා තීරණය අනුවද කෝන්ගහවෙල රජාවෙල ජල යෝජනා ක්‍රම මගින් ලබා දෙන ජලය සඳහා පාරිභෝගිකයන්ගෙන් 2018 අගෝස්තු මස 07 වැනි දින සභා තීරණ අංක 23 (xvii) අනුවද පහත උපලේඛනයේ සඳහන් පරිදි නොවෙනස්ව, ගාස්තු අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

හාඩුව ජල යෝජනා ක්‍රමය

ඒකක	**මිල**
0-10	රු. 06.00 බැගින්
11-20	රු. 10.00 බැගින්
21-25	රු. 12.00 බැගින්
26 ට වැඩි	රු. 20.00 බැගින්
ව්‍යාපාර	
ඒකකයකට	රු. 40.00 බැගින්
ස්ථාවර ගාස්තු	
ගෘහස්ථ	රු. 50.00
ව්‍යාපාර	රු. 100.00

කෝන්ගහවෙල-රජාවෙල ජල යෝජනා ක්‍රමය

ගෘහස්ථ	***මිල***
ඒකක	
0-10	රු. 15.00 බැගින්
11-20	රු. 20.00 බැගින්
21-25	රු. 300.00 බැගින්
26 ට වැඩි	රු. 500.00 බැගින්
ව්‍යාපාර	
ඒකකයකට	රු. 60.00 බැගින්
ස්ථාවර ගාස්තු	
ගෘහස්ථ	රු. 60.00
ව්‍යාපාර	රු. 100.00

නව ජල සම්බන්ධතා ලබා දීම සඳහා

ඉල්ලුම් පත්‍ර ගාස්තුව	රු. 150 0
ජල සම්බන්ධතා ගාස්තුව	රු. 18,800 0
විසන්ධි කරන ලද ජල සම්බන්ධතාවය නැවත රු. 1,500+හිඟ මුදල සන්ධි කිරීමේ ගාස්තුව	

* සභාව සතු මාර්ගයක් පළුදු කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා කාර්මික නිලධාරි විසින් ඇස්තමේන්තු කරන ලද පළුදු කරනු ලබන අඩි ප්‍රමාණය අනුව ගාස්තු අය කෙරේ. මෙය තැන්පත් මුදලක් වන අතර, ඉල්ලුම් කරු විසින් මාර්ගය අළුත්වැඩියා කිරීමෙන් පසුව මෙම මුදල නැවත නිදහස් කෙරේ.

*	කොන්ක්‍රීට් හා තාර පාර සඳහා	14' - රු. 4,600 0
		12' - රු. 4,000 0
		10' - රු. 3,300 0
		8' - රු. 2,600 0
*	මාර්ග උරහිස	රු. 500 0
*	පරීක්ෂා කිරීමේ ගාස්තු	රු. 1,000 0

නාඋල ප්‍රාදේශීය සභාව

යන්ත්‍රෝපකරණ කුළියට දීමේ ගාස්තු 2019 වර්ෂය

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 1(VI) ඔ යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, නාඋල ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍රෝපකරණ කුළියට දීමේදී වාර්ෂිකව මාතලේ දිස්ත්‍රික් මිල ගණන් නියම කිරීමේ කමිටුවේ සඳහන් මිල ගණන් හෝ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මිල ගණන් අනුව ගාස්තු අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

12-82/11

දෙවිනුවර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට වරිපනම් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

(අ) 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක්/ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ/ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපළක් 2018 වර්ෂයේ බලපැවැත් වූ වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට,

(ආ) 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක්/ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය/ප්‍රදේශ තුළ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් සියයට අටක් (8%) වටිනා වරිපනමක් 2019 වර්ෂයේ දී පනවා අයකිරීමට සහ ,

(ඇ) 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත වාර්ෂික වරිපනම්, 2019 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උපවගන්තියෙන් දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා හට පැවරී ඇති බලතල පරිදි 2018.09.28 දිනැති සභා තීරණ අංක 01 වන තීරණය යටතේ ක්‍රියාත්මක වන බව මෙයින් දැනුම් දෙමි.

සුජීව වෙදගේ,
සභාපති,
දෙවිනුවර ප්‍රාදේශීය සභාව.
දෙවිනුවර.

12-71/1

දෙවිනුවර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

(අ) 134 වැනි වගන්තියේ (3) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, දෙවිනුවර ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක 2018 වර්ෂයේ දී බලාත්මක වූ සත්‍යෝක්ෂණ 2019 වර්ෂයේ සත්‍යෝක්ෂණය ලෙස පිළිගැනීමට ;

(ආ) 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී උප වගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.10.03 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.0) අනු ප්‍රමාණ අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (10.00) බැගින් වූ අක්කර බද්දක් 2019 වර්ෂයේ දී පනවා අය කිරීමට ; සහ,

(ඇ) 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත වාර්ෂික වරිපනම් 2019 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් සෑම තැනැත්තකුට ම විධාන කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) උපවගන්තියෙන් දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා හට පැවරී ඇති බලතල පරිදි 2018.09.28 දිනැති සභා තීරණ අංක 02 වන තීරණය යටතේ ක්‍රියාත්මක වන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුජීව වෙදගේ,
සභාපති,
දෙවිනුවර ප්‍රාදේශීය සභාව.
දෙවිනුවර.

12 - 71/2

දෙවිනුවර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ ;

(අ) (1) වැනි උපවගන්තිය යටතේ දෙවිනුවර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ උපලේඛන II හි සඳහන් යම් ව්‍යාපාරයක් දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ (1) තීරයේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවතින අවස්ථාවක උපලේඛන I(2) හි II වැනි තීරයට අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට; සහ

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2019 අප්‍රේල් මස 01 වන දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ (3) උපවගන්තියෙන් දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා හට පැවරී ඇති බලතල පරිදි 2018.09.28 දිනැති සභා තීරණ අංක 03 වන තීරණය යටතේ ක්‍රියාත්මක වන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුජීව වෙදගේ,
සභාපති,
දෙවිනුවර ප්‍රාදේශීය සභාව.
දෙවිනුවර.

උපලේඛනය I

I වැනි තීරය	*II වැනි තීරය*
පසුගිය වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
(i) රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
(ii) රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
(iii) රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
(iv) රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
(v) රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
(vi) රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

උපලේඛනය II

ව්‍යාපාර බදු මුදල් සඳහා අදාළ ව්‍යාපාර :

1. කොමිස් ඒජන්තවරයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙනයාම
2. වෙන්දේසි සහ තැරැව්කරුවන් වශයෙන් ක්‍රියා කිරීම
3. බඩු උකස් ගන්නා අයෙකු වශයෙන් ක්‍රියාකිරීම
4. මුදල් ණයට දෙන්නෙකු වශයෙන් ක්‍රියා කිරීම.
5. කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීම.
6. ගණන් පරීක්ෂකයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
7. ගෘහ නිර්මාණ ශිල්පියෙකු වශයෙන් ක්‍රියා කිරීම.
8. රක්ෂණ නියෝජිතයෙක් වශයෙන් ක්‍රියා කිරීම.
9. ප්‍රවාහන සේවා අයිතිකරුවෙකු හෝ ඒජන්තවරයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
10. ආදායම් බදු කම්කරු නීති උපදේශකයකු වශයෙන් ක්‍රියා කිරීම.
11. ප්‍රසිද්ධ මිනින්දෝරුවකු වශයෙන් ක්‍රියා කිරීම.
12. ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
13. බටහිර වෛද්‍යවරයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
14. දේශීය වෛද්‍යවරයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
15. පුද්ගලික දන්ත වෛද්‍යවරයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
16. පුද්ගලික බස්රථ, වෑන් රථ කුළියට දෙන්නෙකු ලෙස ක්‍රියා කිරීම.
17. රියදුරු පුහුණු කරන්නෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
18. සිනමා ශාලා අයිතිකරුවෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
19. රැකියා ඒජන්තවරයෙකු ලෙස ස්ථානයක් පවත්වාගෙන යාම
20. නිවාස හා ගොඩනැගිලි සැලසුම්කරුවෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
21. සැපයුම්කරුවෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
22. රේස් ඔට්ටු භාරගන්නා තැනැත්තකු ලෙස ක්‍රියා කිරීම
23. පුද්ගලික අධ්‍යාපන පන්ති කරන්නෙකු ලෙස ක්‍රියාකිරීම
24. පුද්ගලික පාසැල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාම
25. දුරකතන, ගුවන් විදුලි, රූපවාහිනී සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
26. පශු වෛද්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම
27. ජ්‍යෝතිෂ්‍ය කටයුතු පිළිබඳ ස්ථානයක් පවත්වාගෙන යාම
28. අලෙවි නියෝජිත මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
29. ලහිසි තෙල් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
30. මුහුදු විනෝද ක්‍රීඩා භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
31. සංචාරකයින් සඳහා කුළී රථ සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
32. ලොතරැයි අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
33. නේවාසික පහසුකම් නොමැති ආයුර්වේද ශාලාවක් පවත්වාගෙන යාම

34. මංගල හෝ වෙනත් උත්සව පැවැත්වීම (කේටරින් සර්විස්)
35. පෙර පාසලක් පවත්වාගෙන යාම
36. පුද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
37. බැංකු හෝ මුල්‍යායතනයක් පවත්වාගෙන යාම
38. ධීවර ආම්පන්න අලෙවි කිරීමේ ව්‍යාපාර පවත්වාගෙන යාම
39. විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
40. ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ ද්‍රව්‍ය අලෙවි සැලක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම (හාඩ්වෙයාර්)
41. වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
42. ගොරකා/ගම්මිරිස්/කරුංකා ආදී ද්‍රව්‍ය එක්රැස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
43. වාහන හා කොන්ක්‍රීට් මිශ්‍රණ බදුදීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
44. දේශීය/විදේශීය ලී වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම.
45. රථ වාහන අමතර කොටස් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
46. මෝටර් බයිසිකල් වෙළෙඳපොලත් පවත්වාගෙන යාම
47. පාපැදි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
48. මෙරට හා රට බීම හලක් පවත්වාගෙන යාම
49. විදුලි උපකරණ වෙළෙඳපොලක් පවත්වාගෙන යාම
50. සිංහල බෙහෙත් බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
51. ඉංග්‍රීසි බෙහෙත් බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
52. යතුරු පැදි හෝ ත්‍රිවිලර් අමතර කොටස් විකිණීම
53. ශීතකරණ අධිශීතකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
55. රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම
56. ගෘහ භාණ්ඩ වෙළඳසැලක් පවත්වාගෙන යාම
57. සපත්තු සාප්පුවක් පැවැත්වීම
58. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
59. ස්වභාවික හෝ කෘතිම මල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. නූල්, බොත්තම්, රේන්ද, රිබන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. පාසල් උපකරණ ලිපි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. පුවත්පත්, සඟරා අලෙවිකරණ ස්ථානයක් පවත්වාගෙන යාම
63. සම් හෝ කෘතිම සම්වලින් නිෂ්පාදිත (බෑග් වර්ග) අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
64. කැමරා පද්ධති විකිණීම හා සවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
65. පරිගණක මෘදුකාංග සැපයීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

12 - 71/3

දෙවිනුවර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර :

(අ) දෙවිනුවර ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන්, එම කර්මාන්තය කර ගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උප ලේඛනයේ 11 වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2019 වර්ෂයේ දී පනවා අයකිරීමට ;

(ආ) 2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද 2019 අප්‍රේල් මස පළමුවන දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමට ; සහ

අක්කරේ පාර නුවර පාර මාඋස්සාව පාර නිදහස් පටුමග විහාරතැන්න පාර ගොඩලියද්ද පාර කොහිලඇල්ල පාර මල්පොලයාය පාර රඹුක්කනපාර කවුඩැල්ල සිට මැදගොඩ දක්වා	පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට පහක (05%) ක වරිපනමක් ද,

II. අරඹේකඩේ කොට්ඨාසයේ :

කටුගස්තොට පාර කුරුණෑගල පාර බොක්කාවල පාර හෑදෙනිය මැදවල පාර	පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට පහ (5%) ක වරිපනමක් ද,

III. හතරලියද්ද කොට්ඨාසයේ :

නුවර පාර රඹුක්කන පාර සංඝරාජපුර පාර	පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට පහ (5%) ක වටිනාකමක් ද,

12 - 35/4

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(4) v යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2019 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සැපයීම වෙනුවෙන් ඊට අනුරූපිත තීරුවේ සඳහන් ගාස්තු පනවා අයකිරීමට යෝජනා කරමි.

		රු. ශත
01.	*පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු :*	
	(i) නව ව්‍යාපාරයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තු	500 0
	(ii) පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තු	500 0
02.	නොපවරා ගැනීමේ සහ වීථිරේඛා සහතිකයක් ලබාදීම සඳහා (මෙම සහතිකය මාස හයක (06) කාලයක් වලංගු වේ)	1,000 0
03.	මිනින්දෝරු සැලැස්මක් අනුමත කිරීම සඳහා ගාස්තු/ගොඩනැගිලි සැලැස්මක් අනුමත කිරීම සඳහා ගාස්තු, අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා ගාස්තු (නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් නිවේදනය සහ නාගරික සංවර්ධන අධිකාරි පනත අනුව අය කෙරේ.)	
04.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා	500 0
05.	මිනින්දෝරු සැලැස්මක් අනුමත කිරීම සඳහා ඉල්ලුම්පත් ගාස්තු	300 0
06.	(i) වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා	300 0
07.	අනතුරුදායක ගස් සම්බන්ධ ඉල්ලුම්පතක් සඳහා	300 0

		රු. ශත
08.	*ආදාහනාගාර ගාස්තු :*	
	(i) බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකු සඳහා	7,500 0
	(ii) බල ප්‍රදේශයෙන් පිටත අයෙකු සඳහා	8,500 0
09.	ඉඩම් කට්ටිකර අලෙවි කිරීමේ ගාස්තු විකුණුම් මිලෙන් 1%ක්	
10.	ගලගෙදර සරත් අමුණුගම ක්‍රීඩාංගණය ක්‍රිකට් තරග සඳහා ලබාදීමේ ගාස්තු :	
	පාසල් ක්‍රිකට් තරගයක් සඳහා දිනකට	5,000 0
	රාජ්‍ය ආයතන ක්‍රිකට් තරගයක් සඳහා දිනකට	6,000 0
	ක්‍රීඩා සමාජ ක්‍රිකට් තරගයක් සඳහා දිනකට	7.500 0
	වෙනත් පෞද්ගලික ආයතන ක්‍රිකට් තරගයක් සඳහා දිනකට	10,000 0
11.	සරත් අමුණුගම සම්මන්ත්‍රණ ශාලාව කුළී පදනම මත ලබාදීම :	
	සම්මන්ත්‍රණයක් හා දේශනයක් සඳහා දිනකට	5,000 0
	මංගල උත්සවයක් හෝ වෙනත් දේශනයක් සඳහා	15,000 0
	ආදායම් උත්පාදනය කරන වැඩසටහනක් පැවැත්වීම සඳහා (නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීම වැනි)	7,500 0
12.	බැකෝ යන්ත්‍රය කුළී පදනම මත ලබාදීම (පැයකට)	2,500 0
13.	මෝටර් ග්‍රේඩරය කුළී පදනම මත ලබාදීම (පැයකට)	4,500 0
14.	මාර්ග තලනය කුළී පදනම මත ලබාදීම (දිනකට)	4,000 0
15.	සභාව සතු කොඩි කණු හා පුටු ලබාදීම රාජ්‍ය ආයතන හැර අනෙකුත් උත්සව සඳහා සභාව සතු පුටු හා කොඩි කණු ලබාදීමේ දී පුටුවකට දිනකට රු. 20ක් හා එක් කොඩි කණුවකට දිනකට රු. 20ක මුදලක් අය කෙරේ.	
16.	කසල ගාස්තු	

2016.09.15 අංක 1611 දරන ගැසට් පත්‍රය මගින් සන අපද්‍රව්‍ය කළමණාකරණ අතුරු ව්‍යවස්ථාව වැළඳ ගන්නා ලදී. ඒ අනුව 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 4 වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් ලැයිස්තුවට අනුව කසල බදු ගාස්තු අයකිරීම සිදු කෙරේ.

දිනකට පරිමාණය (මසකට ගාස්තු)

අනු. අංකය	*වර්ගය*	*පරිමාණය කි.ග්‍රෑම් 10 අඩු*	*පරිමාණය කි.ග්‍රෑම් 10-20*	*පරිමාණය කි.ග්‍රෑම් 20ට වැඩි*
1.	සාප්පු කාර්යාලය	300 0	500 0	750 0
2.	හෝටල්	500 0	1,000 0	1,500 0
3.	එළවළු, පළතුරු	500 0	750 0	1,000 0
4.	මාළු, කුකුල් මස්, බිත්තර	500 0	750 0	1,000 0
5.	පදික	300 0	500 0	750 0
6.	කර්මාන්තශාලා	1,000 0	1,500 0	2,000 0
7.	කැණීම්, ඉදිකිරීම් කඩාදැමීම් ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා	3,000 0	-	-
8.	ආරෝග්‍ය ශාලා	1,000 0	1,500 0	2,000 0
9.	වෙනත්	500 0	750 0	1,000 0

		රු.	ශත
17.	සතිපොල ගාස්තු		
	කඩකාමර තුළ භාණ්ඩ අලෙවි කිරීමට	150	0
	බාහිර ප්‍රදේශයේ භාණ්ඩ අලෙවි කිරීමට	100	0
18.	පුස්තකාල ගාස්තු		
	වාර්ෂික සාමාජික ගාස්තු	50	0
	පොත් ප්‍රමාද ගාස්තු එක් පොතක් සඳහා	5	0
	තැන්පතු ගාස්තු	100	0
19.	ප්‍රාදේශීය සභා මාර්ග වල දැව ප්‍රවාහනය කරන ලොරි රථ සඳහා බලපත්‍ර ගාස්තුවක් අය කිරීම	1,000	0

12 - 35/5

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සහ දෘශ්‍ය පරිසරය ප්‍රදර්ශන ගාස්තු

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(4) vi යටතේ 2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සහ දෘෂ්‍ය පරිසරය ප්‍රදර්ශන ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බවත්, පනවන ලද මෙම ගාස්තුව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දින 07කට කලින් ප්‍රාදේශීය සභාවේ ලේකම්/සභාපති වෙතින් බලපත්‍රයක් ලබා ගත යුතු බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමන් විසින් ප්‍රකාශයට පත්කරන ව්‍යවස්ථාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් වීදියකට, පාරකට, ඇලකට, දෙළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක්/ආයතනය දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට දින හතකට (07) කලින් තුම්පනේ ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු බවට යෝජනා කරමි.

		රු.	ශත
(i)	තහඩුවලින් එක් පැත්තක් සඳහා වසරකට වර්ග අඩි එකක් වෙනුවෙන්	200	0
(ii)	තහඩුවලින් දෙපැත්තක් සඳහා වසරකට වර්ග අඩි එකක් වෙනුවෙන්	300	0
(iii)	ජංගම දුරකථන සම්බන්ධ දැන්වීම් පුවරු වර්ග අඩි එකක් වෙනුවෙන්	125	0
(iv)	කිසියම් ව්‍යාපාරයක වෙළෙඳ නාමයකට අමතරව වෙනත් වෙළෙඳ නිෂ්පාදන ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා වර්ග අඩි එකක් වෙනුවෙන්	50	0
(v)	රෙදි බැනර් සඳහා මාසයක කාලයකට වර්ග අඩි එකක් වෙනුවෙන්	50	0

12 - 35/6

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ජල ගාස්තු අයකිරීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(4) vii යටතේ 2019 වර්ෂය සඳහා ජල ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තියෙහි (xiii) (ඈ) ඡේදය යටතේ වූ සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුව 2019 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සම්බන්ධයෙන් ඊට අනුරූපිත තීරුවේ සඳහන් ජල ගාස්තු පනවා අය කිරීමට තීරණය කරනු ලැබේ.

ජල සම්බන්ධතා ගාස්තු රු. 12,500 - (රු. 2,500ක ආරක්ෂක තැන්පත් මුදල ද ඇතුළත්ව)

	රු. ශත
ස්ථාවර ගාස්තු (ගෘහස්ථ/ආගමික)	100 0
ඒකක 01 සිට 10 දක්වා එක් ඒකකයකට	3 50
ඒකක 11 සිට 20 දක්වා එක් ඒකකයකට	7 50
ඒකක 21 සිට 25 දක්වා එක් ඒකකයකට	10 0
ඒකක 26 සිට 30 දක්වා එක් ඒකකයකට	15 0
ඒකක 31 සිට 35 දක්වා එක් ඒකකයකට	22 0
ඒකක 35ට වැඩි එක් ඒකකයකට	30 0
මීට අමතරව විදුලි බිල අනුව ඉන්ධන ගැලපුම් ගාස්තුවක් අය කෙරේ.	
ස්ථාවර තැන්පතු (ව්‍යාපාරික)	150 0
ඒකක 01 සිට 10 දක්වා එක් ඒකකයකට	4 50
ඒකක 11 සිට 20 දක්වා එක් ඒකකයකට	8 50
ඒකක 21 සිට 25 දක්වා එක් ඒකකයකට	12 0
ඒකක 26 සිට 30 දක්වා එක් ඒකකයකට	20 0
ඒකක 31 සිට 35 දක්වා එක් ඒකකයකට	25 0
ඒකක 35ට වැඩි එක් ඒකකයකට	35 0
ජල බවුසරය කුළී පදනම මත ලබාදීම	3,500 0
යළි ඇමිණීම හා ඉල්ලීම පරිදි ජල සේවය විසන්ධි කිරීමේ ගාස්තු	1,500 0
පාරිභෝගික නම වෙනස් කිරීමේ ගාස්තු	500 0
ජල මාපක පරීක්ෂණ ගාස්තුව	750 0
ජල අයදුම්පත් ගාස්තු	300 0

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(4) viii යටතේ 2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බද්දක් පනවා අයකිරීමට තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද සංවර්ධනය නොකළ ඉඩම් බද්ද, වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (03) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් ; හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගාකිරීමට යටත්කර නොමැති විටක ; හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 143 ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2018 වර්ෂය සඳහා එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 0.5 (0.5%)ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට විධානය කළ යුතු යැයි යෝජනා කරමි.

12 - 35/8

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(4) ix යටතේ 2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබාගන්නා සෑම තැනැත්තෙකු ම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබාගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2019 වර්ෂය සඳහා වන මෙම බද්ද තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට තුම්පනේ ප්‍රාදේශීය සභාව තීරණය කරනු ලැබේ.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ කාර්ය නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
03.	සෑම කරත්තයක් සඳහා	20 0
04.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
05.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
06.	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා	15 0
07.	සෑම ඇතෙකු සඳහා	50 0
08.	සුනඛයෙකු සඳහා	5 0

02. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 35/9

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2019 වර්ෂයට කුළී රථ වාහන නවතා තැබීමේ ගාස්තු

2011.05.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1708/10 දරන ගැසට් පත්‍රයේ 4(අ) වැනි කොටසේ පළකරන ලද කුළී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අනුව කුළී රථවාහන නවතා තැබීම සඳහා මසකට ගාස්තු පැනවීම සඳහා 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින පැවැති මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(4) x යටතේ මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

තුම්පනේ ප්‍රාදේශීය සභාව 2011.05.30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1708/10 දරන ගැසට් පත්‍රයේ 15(අ) වැනි කොටසේ පළ කරන ලද කුළී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 03 වැනි වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් කුළී රථවහන නවා තැබීම සඳහා බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*කුළී රථ වර්ගය*	*කාලය*	*ගාස්තුව රු. ශත*
01	ත්‍රීරෝද රථයක් සඳහා	මසකට	125 0
02	ලොරි රථයක් සඳහා	මසකට	100 0
03	වෑන් රථයක් සඳහා	මසකට	100 0
04	ට්ලරය සහිත ට්‍රැක්ටරයක් සඳහා	මසකට	100 0
05	අත්ට්‍රැක්ටරයක් සඳහා	මසකට	100 0
06	කාරයක් සඳහා	මසකට	100 0
07	මෝටර් බයිසිකලයක් සඳහා	මසකට	50 0

12 - 35/10

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2019 වර්ෂයට එළගව මස් වෙළඳසැලක් පවත්වාගෙන යාමට බලපත්‍ර ලබා දීම

1893 අංක 9 දරන ගෝ ඝාතක ආඥාපනත හා සංශෝධන පනත යටතේ එහි අංක 7(1) හි පරිදි එළ හරක් මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම සඳහා පහත සඳහන් අය විසින් 2019 වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බව මින් මහජනයාට නිවේදනය කරනු ලැබේ.

02. එකී ස්ථානයට එබඳු බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කරනු කැමති වූ තුම්පනේ ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පදිංචි තැනැත්තන් විසින් එසේ විරුද්ධත්වයට තිබෙන කරුණු පිළිබඳව ලිඛිත ප්‍රකාශයක් පිටපත් දෙකකින් (2) යුක්තව මෙම නිවේදනය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ දින සිට දින 30 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලබේ. ලිපි එවන විට ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ විරෝධකරු ලෙස සඳහන් කර සභාපති, තුම්පනේ ප්‍රාදේශීය සභාව, ගලගෙදර වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එළගව මස් වෙළඳ සැල පවත්වා ගෙන යාමට ඉල්ලුම් කරන ස්ථානයේ විස්තර ඇතුළත් වගුව

අනු. අංකය	*එළගව මස් වෙළඳ සැල පවත්වාගෙන යාමට ඉල්ලුම් කළ තැනැත්තාගේ නම හා ලිපිනය*	*එළගව මස් ලබා ගන්නා ස්ථානය හා එම අයිතිකරුගේ නම හා ලිපිනය*	*එළගව මස් වෙළඳ සැල පවත්වා ගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තරය*	*ග්‍රාම නිලධාරී වසම*
01	එස්. එම්. රියාස් මයා, අංක 67/1, දෙහිදෙණිය මඩිගේ, හතරලියද්ද (ජා.හැ.අ. 781261432v)	එන්. නසීම් මයා, අංක 67, දෙහිදෙණිය මඩිගේ, හතරලියද්ද	හතරලියද්ද, කොටිකාම්ඹ මංසන්ධියේ ඇති නයිම් හජ්ජියාර් මාවතේ පුම්මා පල්ලිය ඉදිරිපිට දෙහිදෙණිය මඩිගේ එළ ගව මස් වෙළඳ සැල	අංක 386, දෙහිදෙණිය, මඩිගේ

අනු. අංකය	එළගව මස් වෙළෙඳසැල පවත්වාගෙන යාමට ඉල්ලුම් කළ තැනැත්තාගේ නම හා ලිපිනය	එළගව මස් ලබා ගන්නා ස්ථානය හා එම අයිතිකරුගේ නම හා ලිපිනය	එළගව මස් වෙළෙඳසැල පවත්වා ගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තරය	ග්‍රාම නිලධාරී වසම
02	එම්. එස්. එම්. නජීම් මයා, අංක 230/ඒ, මඩිගේ, ගලගෙදර (ජා.හැ.අ. 812332996v)	එම්. එස්. එම්. නජීම් මයා, අංක 230/ඒ, මඩිගේ, ගලගෙදර	ගලගෙදර මඩිගේ පෙතිගෙවෙල මංසන්ධිය ඉදිරිපිට ඇති අංක 319 දරන එළගව මස් අලෙවිසැල	ගලගෙදර, මඩිගේ දකුණ
03	ඒ. කේ. එම්. රිස්වාන් මයා, බෙට්ටියගොඩ, කහපත්වල (ජා.හැ.අ. 683431796x)	ඒ. කේ. එම්. රිස්වාන් මයා, බෙට්ටියගොඩ, කහපත්වල	9 කණුවේ සිට හතරලියද්ද පාරේ කි.මී. 1/2 ක් පැමිණ බෙට්ටියගොඩ, කහපත්වල එළගව මස් වෙළෙඳසැල	අංක 380, මීගහහේන දකුණ
04	එම්. එෆ්. එම්. රිෆාක් මයා, අංක 226, නිදහස් පටුමග, මඩිගේ, ගලගෙදර (ජා.හැ.අ. 721541576v)	එම්. එෆ්. එම්. රිෆාක් මයා, අංක 226, නිදහස් පටුමග, මඩිගේ, ගලගෙදර	ගලගෙදර මඩිගේ ඉන්ධන පිරවුම්හල අසල ඉදිරිපිට ඇති අංක 367 දරන එළගව මස් වෙළෙඳසැල	අංක 369, ගලගෙදර බටහිර

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-35/11

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර ලබාදීම

1975 අංක 17 දරන සමාජශාලා පනතට අනුව 1980 අංක 14 දරන (සංශෝධන) එකී පනතේ බලපත්‍ර ලබාදීමේ 6 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන සමාජ ශාලාව සඳහා 2019 වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බව මින් මහජනයාට නිවේදනය කරනු ලැබේ.

එකී සමාජශාලාව අසළ හෝ එකී සමාජශාලාව සඳහා අපේක්ෂිත ස්ථාන අසළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එකී සමාජශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දිනයේ සිට දින 30ක් ඇතුළත තම විරෝධතාවයට හේතු ලියවිල්ලකින් දක්වමින් පිටපත් දෙකකින් (2) යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ. ලිපි එවන විට ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ විරෝධකරු ලෙස සඳහන් කර සභාපති, තුම්පනේ ප්‍රාදේශීය සභාව, ගලගෙදර වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය	*සමාජ ශාලාවේ සභාපති ද ලේකම්ද, කළමනාකරු ද යන වග*	*සමාජ ශාලාවේ නම*	*සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තුවන ස්ථානය*
ජෙරම් කෙනන් ප්‍රනාන්දු මයා රොස්වුඩ්වත්ත, රත්කරවිව.	සභාපති	මවුන්ට් වීව් සමාජශාලාව	අංක 33, කුරුණෑගල පාර, ගලගෙදර.

12 - 35/12

කෑගල්ල නගර සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

255 අධිකාරිය යටතේ නගර සභා ආඥාපනතේ 160(1) වන වගන්තියට අනුව පසුගිය වසරේ පැවැත්වෙමින් තිබුණ අන්දමට 2019 වර්ෂය සඳහා කෑගල්ල නගර සභා සීමාව තුළ පිහිටි සියලුම නිශ්චල දේපළවලින් පහත සඳහන් වරිපනම් බද්දක් පනවා අය කිරීමටත්, එම බදු පිළිවෙළින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 න් අවසන් වන කාර්තුවලදී ගෙවිය හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. එකී බදු මුදල් පහත සඳහන් පරිදි ගෙවූ විට මෙහි පහත දැක්වෙන වට්ටම් මුදල් ගෙවනු ලැබේ.

(අ) 2019.01.31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බදු ගෙවනු ලැබුවහොත් එම මුදලින් (10%) ක්

(ආ) එම මුදල් කාර්තු වශයෙන් ගෙවන විට වරිපනම් බදු ගෙවිය යුතු කාල සීමාවේ පළමුවන මාසය තුළ ගෙවනු ලැබුවහොත් එම මුදලින් (5%)

03. ඉහත පළමුවන ඡේදයේ පරිදි ගෙවිය යුතු බදු මුදල් නොගෙවන අයගේ සෑම ව්‍යාපාරික දේපළක් වෙනුවෙන් 20%ක් ද, අනෙකුත් සෑම දේපළක් වෙනුවෙන් 15% බැගින් වූ වරෙන්තු ගාස්තුවක් ද අය කරනු ලැබේ.

04. (අ) මෙහි උපලේඛනයේ සඳහන් ප්‍රදේශයෙන් පිටස්තරව පිහිටි (වෙළෙඳ හා වාණිජ කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් නොවන) සෑම වර්ෂයකම සියලුම ගේ දොර, සියලුම ගොඩනැගිලිවලට ද, ඉඩ කඩම් හා ගෙපත් වලට ද වාර්ෂික වටිනාකමින් 5% ක වරිපනම් බද්දක්,

(ආ) මෙහි උපලේඛනයේ සඳහන් ප්‍රදේශ තුළ පිහිටි (වෙළඳ හා වාණිජ කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් නොවන) සෑම වර්ෂයකම සියලුම ගේ දොර සියලුම ගොඩනැගිලිවලට ද ඉඩ කඩම් හා ගෙපත්වලට ද වාර්ෂික වටිනාකමින් 3% ක වරිපනම් බද්දක්,

(ඇ) කෑගල්ල නගර සීමාව තුළ පිහිටි වෙළඳ හා වාණිජ කටයුතු සඳහා භාවිතා කරන සියලු ස්ථානවල වාර්ෂික වටිනාකමින් 10% ක වරිපනම් බද්දක්,

ජී. කේ. සමරසිංහ,
සභාපති,
කෑගල්ල නගර සභාව.

2018 ක් වූ ඔක්තෝබර් මස 03 වැනි දින,
කෑගල්ල නගර සභාව.

උපලේඛනය

අංක දෙක (2) දරන ඡන්ද කොට්ඨාසය

* පල්ලාදෙනිය පාරේ වරිපනම් අංක 101 - 123 දක්වා, ද
* වරිපනම් අංක 98 - 112/1 දක්වා දී ඇති දේපළ,

අංක තුන (3) දරන ඡන්ද කොට්ඨාස :

* උතුරු රවුම් පාර වරිපනම් අංක 127 සිට 127 1/4 දක්වා දරන දේපළ.

අංක හතර (4) දරන කොට්ඨාසය :

* මිරිහැල්ල අඩි පාරේ වරිපනම් අංක 47 සිට 51 දක්වා සහ වරිපනම් අංක 02 සිට 50 දක්වා දරන දේපළ.

12-136/1

කෑගල්ල නගර සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2019

නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 1979 අංක 42 දරන මහ නගර සභා (සංශෝධිත) පනතින් සංශෝධිත නගර සභා ආඥාපනතේ 164 (1), 164 (2), 165(අ), 165(ආ), 165(ඇ), 165(ඈ) යටතේ කෑගල්ල නගර සභාවට පහත අංක 1, 2, 3, 4, 5, 6, 7, 8 දරන උපලේඛනවල දක්වා ඇති පරිදි බලපත්‍ර ගාස්තු 2019.03.31 හෝ එදිනට පෙර ගෙවිය යුතු බවට නියම කර ඇති බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ. එහි පනවා ඇති බලපත්‍ර ගාස්තුව හා බදු මුදලට වැට බද්ද අය කරනු ලැබේ.

බලපත්‍ර ගාස්තු ලේඛනය - 2019 වර්ෂය

අනු. අංකය	*බලපත්‍රයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත*
01.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත
05.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	අයිස්ක්‍රීම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
10.	කිරි පට්ටි හා කිරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	රූපලාවන්‍ය හා කොණ්ඩා කපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
13.	මස් විකිණීම	500 0	750 0	1,000 0
14.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

ජී. කේ. සමරසිංහ,
සභාපති,
කෑගල්ල නගර සභාව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

කර්මාන්ත විෂයයෙහි බදු ලේඛනය 2019 වර්ෂය

අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත
01.	විදුලි උපකරණ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
02.	සිමෙන්ති භාණ්ඩ සෑදීම	500 0	750 0	1,000 0
03.	කිරුම් මිණුම් භාණ්ඩ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
04.	ගල් වැඩපලක් පවත්වාගෙන යාම (මැෂින් මගින්)	500 0	750 0	1,000 0
05.	කොසු නිපදවීම	500 0	750 0	1,000 0
06.	හම් පදම් කිරීම	500 0	750 0	1,000 0
07.	ලෝහ වාත්තු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ටයර් ටියුබ් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	වළං සෑදීම	500 0	750 0	1,000 0
12.	ගුවන් විදුලි යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර, රූපවාහිනි, කැසට් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
13.	අඟුරු නිපදවීම හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සුරුට්ටු එතීම, බීඩි එතීම	500 0	750 0	1,000 0
15.	සිසිල් බීම හෝ ආහාර නිෂ්පාදනය හා ඇසිරීම	500 0	750 0	1,000 0
16.	රෙදි මුද්‍රණය කරන ස්ථානයක් හෝ පාට කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	රස කැවිලි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	සීනිබෝල හෝ ටොෆී නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත
19.	කොසු, බුරුසු, ඉදල් හෝ වේවැල් කූඩා හෝ වෙනත් එවැනි දේ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
20.	සපත්තු හෝ සම් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
21.	ඇඳුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ත්‍රීවීල් සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	වාහන අමතර කොටස් හා උපාංග නිපදවීම හා අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	රෙකෝඩ් බාර් (ශබ්ද පටිගත කරන) ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	විදුලිබලයෙන් රන්, රිදී ක්‍රෝමියම් ආලේප කිරීම	500 0	750 0	1,000 0
26.	පින්තූර රාමු කිරීමේ හෝ වීදුරු කැපීම, වීදුරු භාණ්ඩ නිෂ්පාදන	500 0	750 0	1,000 0
27.	කළු ගල් කැඩීමේ ගල් වලක් පවත්වාගන යාම	500 0	750 0	1,000 0
28.	රබර් ආශ්‍රිත භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
29.	මැණික් කැපීමේ සහ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ශීතකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගනෙ යාම	500 0	750 0	1,000 0
31.	ප්ලාස්ටික් අකුරු කැපීම සඳහා	500 0	750 0	1,000 0
32.	කලාත්මක රෙදි නිෂ්පාදනය කිරීම සඳහා	500 0	750 0	1,000 0
33.	වානේ ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
34.	කිරි ආහාර ද්‍රව්‍ය වෙළෙඳාම සඳහා	500 0	750 0	1,000 0
35.	කුෂන් වැඩපලක් සඳහා	500 0	750 0	1,000 0
36.	පරිගණක යන්ත්‍ර අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
37.	ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
38.	කෘෂි බෝග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
39.	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	පරිගණක මගින් ඡායාරූප සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	ගල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	ලියවන පට්ටලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	සතුන්ගේ ලේ සහ අතුණු බහන් උණු කිරීම	500 0	750 0	1,000 0
46.	මේද සහ තෙල් නිපදවීම	500 0	750 0	1,000 0
47.	කොහු සායම් කිරීම	500 0	750 0	1,000 0
48.	පොල් තෙල් නිපදවීම	500 0	750 0	1,000 0
49.	හුණු පිළිස්සීම	500 0	750 0	1,000 0
50.	ලී මෝලක් පවත්වාගෙන යාම (යන්ත්‍රානුසාරයෙන්)	500 0	750 0	1,000 0
51.	කිරි හා මස් පිණිස සතුන් ඇති කිරීම	500 0	750 0	1,000 0
52.	මැණික් හා ස්වර්ණාභරණ කැපීම හා ඔප දැමීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	බතික් කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

ජී. කේ. සමරසිංහ,
සභාපති,
කෑගල්ල නගර සභාව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

ඇතැම් වෙළෙඳ ව්‍යාපාර විෂයයෙහි බදු - 2019 වර්ෂය

255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 165(අ) වගන්තිය යටතේ බද්දක් ගෙවීමට යටත් නොවන්නා වූ (කර්මාන්ත) වෙළඳ ව්‍යාපාර කරගෙන යන්නාවූ සෑම තැනැත්තෙකුම පහත පළමුවන තීරුවේ දැක්වෙන පරිදි එකී ව්‍යාපාර සම්බන්ධයෙන් බද්ද ගෙවිය යුතු වර්ෂය ඉහතින් ලැබීම අනුව නියම කරන දෙවන තීරුවේ දැක්වෙන බද්ද ගෙවිය යුතුය. මීට අමතරව වැට් බද්ද ගෙවිය යුතුය.

ඉහත කී උපලේඛනය

I තීරුව	*II තීරුව*
2018 වර්ෂයේදී ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන නමුත්, රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත්, රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත්, රු. 75,000 නොඉක්මවන විට	360 0
රු. 75,000 ඉක්මවන නමුත්, රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

IV උපලේඛනය

164(2) වගන්තිය - ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ආපන ශාලා හෝ නවාතැන්පල වලින් 2019 වර්ෂයට බදු අය කිරීම

සභාවේ පාලන කාල සීමාව තුළ හෝටලයක් ආපන ශාලාවක් හෝ නවාතැන්පළක් වශයෙන් පාවිච්චි කරන ලබන්නාවූද ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පල (1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සංග්‍රහය) ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබූ ඇත්තාවූද අවස්ථාවක එම හෝටලයේ ආපන ශාලාවේ හෝ නවාතැන්පලේ එම වර්ෂයට පෙරාතුව වූ වර්ෂය සඳහා වූ ලැබීම්වලට අනුකූලව එම ලැබීම්වලින් 1%ක බලපත්‍ර ගාස්තුවක් එම හෝටලය ආපන ශාලාව හෝ නවාතැන්පල පවත්වාගෙන යන අය විසින් ගෙවිය යුතුය.

V උපලේඛනය

165(ඇ) වගන්තිය - සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු අය කිරීම - 2019 වර්ෂය

සභාවේ පාලන කාලය තුළ සංවර්ධනය නොකළ සියලුම ඉඩම්වලින් අදළ ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් 2%ක් වූ බද්දක් ඉඩමේ අයිතිකරු විසින් ගෙවිය යුතුය.

VI උපලේඛනය

රථ වාහන හා සත්ව බදු - 2019 වර්ෂය

1979 අංක 42 දරන මහ නගර සභා සංශෝධිත පනතේ සංශෝධිත නගර සභා ආඥාපනතේ 255 අධිකාරිය 162(1) (අ) වැනි වගන්තිය යටතේ කෑගල්ල නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් වාහන හා සත්ව බදු පනවා ඇති බවද එකී බදු එම පනතේ (3 වන වගන්තිය ප්‍රකර) 2019 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවට නියම කර ඇති බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ කාර්යය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	04 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

VII උප ලේඛනය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි පරිච්ඡේදය)

477 වැනි පරිච්ඡේදයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර කෑගල්ල නගර සභා සීමාව තුළ තබාගෙන සිටින බල්ලෙකු වෙනුවෙන් රු. 3 බැගින්ද, සෑම බැල්ලියක වෙනුවෙන් රු. 3 බැගින් වූ ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී ගාස්තු 2019 වර්ෂයේ මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවටත් නිවේදනය කරනු ලැබේ.

12-136/2

කෑගල්ල නගර සභාව

විනෝද බදු ආඥාපනතට අනුව විනෝද බදු අය කිරීම - 2019 වර්ෂය

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනත යටතේ කෑගල්ල නගර සභා සීමාව තුළ විනෝද බදු පනවා අය කිරීමට අංක 10449 දරන 1952 සැප්තැම්බර් 19 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා අනුමත කළ බැවින් නගර සභා සීමාව තුළ වූ සිනමා ශාලාවල ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා අලෙවි කරනු ලබන ටිකට් පත් වල මුළු වටිනාකමින් 7.5% ක විනෝද බද්දක් අයවිය යුතු බවටත්, ප්‍රදර්ශනය කරනු ලබන ආධාර චිත්‍රපට දර්ශන, මැජික් දර්ශන, සර්කස් දර්ශන, සැණකෙළි දර්ශන හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම මුද්‍රා තබන ලද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 25%ක විනෝද බද්දක් කෑගල්ල නගර සභාව වෙත අයවිය යුතු බවද ප්‍රසිද්ධ රඟ දැක්වීම් බලපත්‍රයක් සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අයකරන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ බලපත්‍රයක් සඳහා ගාස්තුව :

	එක් දිනකට	*එක් මසකට*	*එක් අවුරුද්දකට (දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වේ)*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 කට නොවැඩි විට	500 0	1,000 0	1,000 0
ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 කට වැඩි නමුත් 399 නොවැඩි විට	1,000 0	1,500 0	2,000 0
ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 399 කට වැඩි වන විට	1,500 0	2,500 0	3,000 0

12 - 134/3

කෑගල්ල නගර සභාව

2019 වර්ෂය සඳහා දැන්වීම් පුවරු ගාස්තු

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 157(7) වන උප වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල අනුව හා 2010 ජනවාරි මස 22 වැනි දින අංක 1,638 දරන ගැසට් පත්‍රයේ සබරගමුව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති 4 (අ) වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/ප්‍රදර්ශනය කිරීමේ හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර කෑගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් තැනැත්තකු විසින් යම් වීදියකට, පාරකට, ඇලකට, මුහුදකට හෝ අහසකට පෙනෙන කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සඳහා බලපත්‍රයක් ලබාගත යුතු වන අතර ඒ සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2019 වර්ෂයට ද අයකිරීම ප්‍රකාශයට පත් කරමි.

ජී. කේ. සමරසිංහ,
සභාපති,
කෑගල්ල නගර සභාව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

01 වැනි උපලේඛනය

පහත දැක්වෙන ප්‍රචාරක දැන්වීම් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව අදාළ නොවන්නේ ය.

(i) ආගමික හා පූජ්‍ය ස්ථානවලට අයත් දැන්වීම්
(ii) ආරක්ෂක සේවාවන්ට සම්බන්ධ දැන්වීම්
(iii) පොදු කටයුතු සඳහා රජයේ මැදිහත්වීම් යටතේ සියලුම දැන්වීම්
(iv) අවමංගල්‍ය දැන්වීම්, දේශපාලන හෝ මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක්
(v) තමාගේ වෙළෙඳපළ තුළ/මත තිබෙන නාම පුවරු/ගෘහ නාම පුවරු
(vi) "කුළියට දීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක් - වර්ග අඩි 4 ක් නොඉක්මවන නාම පුවරු
(vii) "විකිණීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක් - වර්ග අඩි 4 චක් නොඉක්මවන නාම පුවරු
(viii) වෘත්තීය කටයුතු සඳහා යොදාගනු ලබන වර්ග ප්‍රමාණය වර්ග අඩි 04ක් නොඉක්මවන නාම පුවරුවක්

02 වැනි උපලේඛනය

		මාසයක් ප්‍රදර්ශනය සඳහා වර්ග අඩියකට	*වර්ෂයක් ප්‍රදර්ශනය සඳහා වර්ග අඩියකට*
		ස්ථානයේ වාර්ෂික වටිනාකම මත	*ස්ථානයේ වාර්ෂික වටිනාකම මත*
		රු. ශත	*රු. ශත*
01.	දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම තාවකාලික දැන්වීම් (රෙදි හා කැන්වස්වලින් සෑදූ) රාමු රහිත	50 0	
02.	දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම තාවකාලික දැන්වීම් (රෙදි හා කැන්වස්වලින් සෑදූ) රාමු සහිත	80 0	
03.	ස්ථිර දැන්වීම් ප්‍රදර්ශනය කිරීම		80 0

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදළව කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1. ii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන්ම එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750ට වැඩි රු. 1,500ට අඩු*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු.ශත*	*රු. ශත*
01.	තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	පහන්තිර පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	පෑස්සීමේ හෝ අම්ලකර පෑස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	පාවහන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	මිනී පෙට්ටි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	වීදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	රත්‍රන්, රිදී ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	හඳුන්කුරු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	පොලිතීන් නිෂ්පාදන හා ඒ ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	කුෂන් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	මෙට්ට නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	රබර් මුද්‍රා අංක තහඩු හෝ නාම පුවරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන විට රු. ශත	රු. 750ට වැඩි රු. 1,500ට අඩු රු.ශත	රු. 1,500 ට වැඩි රු. ශත
17.	සපත්තු අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පපඩම් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	උළු, ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	බීඩි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ගමන් මළු, ජර්කින්, වැහි කබා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	දම්වැල් කියත් භාවිත කර ලී ඉරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-81/1

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1 iii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමඟ කියවිය යුතු 147 වන වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා බුලත්සිංහල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවටද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2018 ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

01 උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750ට වැඩි රු. 1,500ට අඩු*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු.ශත*	*රු. ශත*
01.	පොහොර හෝ රසායනික පොහොර හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
02.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
03.	සම් විකිණීම	500 0	750 0	1,000 0
04.	සත්ත්ව පාලනය (මස් කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
05.	ඖෂධාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
06.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
08.	කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබාගැනීම	500 0	750 0	1,000 0
09.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14.	සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21.	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
23.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
24.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
25.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
26.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
27.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
28.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
29.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
30.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
31.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග මාංශ හෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
32.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
33.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
34.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
35.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750ට වැඩි රු. 1,500ට අඩු*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු.ශත*	*රු. ශත*
36.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
38.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
39.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
40.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
41.	ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
42.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
43.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
44.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
45.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
46.	පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
47.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
48.	ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝ ග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
49.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
50.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
51.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
52.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
53.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
54.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
55.	කළු ගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
56.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
57.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
58.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
59.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
60.	ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
61.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
62.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
63.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
64.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
65.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
66.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
67.	පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
68.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
69.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
71.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
72.	ශීතකළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750ට වැඩි රු. 1,500ට අඩු*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු.ශත*	*රු. ශත*
73.	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
74.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
75.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
76.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
77.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
78.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
79.	බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
80.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
81.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
82.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගන යාම	500 0	750 0	1,000 0
84.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
85.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
86.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
87.	කිලෝ ග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
88.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
89.	ලියවන පට්ටලකයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
90.	පැට්‍රොල් ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
92.	වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
93.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
95.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	පොල්ලෙලි පෙඟවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
97.	හෝටල් හෝ ලැඟුම්හල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	සංචාරක වෙළඳාමක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
101.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
103.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105.	මාළු විකිණීම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
106.	කොණ්ඩ කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750ට වැඩි රු. 1,500ට අඩු*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු.ශත*	*රු. ශත*
107.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
108.	නරක් වන සුළු ආහාර විකිණීම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
109.	පොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
110.	රසකැවිලි අලෙවිය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
111.	රබර් රොටි වියළීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
112.	ධාන්‍ය වර්ග හා කුළුබඩු අලෙවියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
113.	තේ කුඩු නිෂ්පාදනය හෝ අලෙවිය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-81/2

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදළව ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1. iv යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බුලත්සිංහල, ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

ඉහත කී උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරය*
2018 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*ගෙවිය යුතු වාර්ෂික බද්ද රු. ශත*
1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
2. රු. 6,001 සිට රු. 12,000 දක්වා	90 0
3. රු. 12,001 සිට රු. 18,750 දක්වා	180 0
4. රු. 18,751 සිට රු. 75,000 දක්වා	360 0
5. රු. 75,001 සිට රු. 1,50,000 දක්වා	1,200 0
6. රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12-81/3

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1.v යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2014 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යාක්ෂණය පිළිගැනීමටත් පිළිගත යුතු එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී අති බලතල ප්‍රකාරව, එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට 4ක (4%)ක වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවටත්,

තව ද, 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද බුලත්සිංහල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුවට ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල බුලත්සිංහල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම්, එකී කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද, බුලත්සිංහල ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	මාර්තු 31 වැනි දිනට පෙර	2019.01.31
දෙවන කාර්තුව	ජූනි 30 වැනි දිනට පෙර	2019.04.30
තුන්වන කාර්තුව	සැප්තැම්බර් 30 වැනි දිනට පෙර	2019.07.31
හතරවන කාර්තුව	දෙසැම්බර් 31 වැනි දිනට පෙර	2019.10.31

12-81/4

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1.vi යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 3 වැනි උපවගන්තියෙන් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බල ප්‍රදේශයේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැති වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වන සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාර් එකක් මත රු. 10 0 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, එම ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත්, හෙක්ටයාර් එකකට නොඅඩු අවස්ථාවක රු. 50.00ක් අයකළ යුතු බවට යෝජනා කරමි.

තව ද, 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර වාර්ෂික අක්කර බද්ද බුලත්සිංහල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුවට ඉදිරියේ තුන් වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ අක්කර බදු මුදල බුලත්සිංහල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම්, එකී කාර්තුවට අදළ මුදලින් 5%ක වට්ටමක් ද, බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට ලබා දිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	මාර්තු 31 වැනි දිනට පෙර	2019.01.31
දෙවන කාර්තුව	ජූනි 30 වැනි දිනට පෙර	2019.04.30
තුන්වන කාර්තුව	සැප්තැම්බර් 30 වැනි දිනට පෙර	2019.07.31
හතරවන කාර්තුව	දෙසැම්බර් 31 වැනි දිනට පෙර	2019.10.31

12-81/5

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1.vii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතකු තමා සන්තකයෙහි තබාගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II වැනි තීරුවේ නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
(1)	(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
		(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
		(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
	(iii)	කරත්තයක් සඳහා	20 0
	(iv)	අත් කරත්තයක් සඳහා	10 0
	(v)	රික්ෂෝවක් සඳහා	7 50
	(vi)	අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	(vii)	ඇතෙකු සඳහා	50 0

(2) විශ්කම්භය 26" නොඉක්මවන රෝද රහිත ළමා වාහන, වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

(3) ඉහත සඳහන් වන "වෙළෙඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන් ආකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-81/6

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1.viii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් මත පහත දැක්වෙන ආකාරයේ වාර්ෂික බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරමි.

ඒ අනුව ගෙවිය යුතු වාර්ෂික බද්දේ ප්‍රමාණය එකී සංවර්ධනය නොකළ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට එකක් (1%) විය යුතු ය. මේ බද්ද අයකිරීම සඳහා එකී පනතේ 153 (1) (ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" යන්නෙන් යම් ඉඩමක සම්පූර්ණ ඉඩමේ බිම් ප්‍රමාණය, එම ඉඩමේ ගොඩනැගිලිවලින් හෝ *ස්ථිර නැනහොන්* නිරන්තර වගාවකින් ආවරණය වූ බිම් ප්‍රමාණය අතර අනුපාතය 2:1 විය යුතු බවට හා ඊට අඩු සමානුපාතය සහිත යම් ඉඩමක් සංවර්ධනය නොකළ ඉඩමක් යනුවෙන් ද සළකනු ලැබේ.

12-81/7

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් (දෘශ්‍ය පරිසරය) බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වන වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1.ix යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වන වගන්තිය හා 1989 අංක 12 දරන පළාත් සභා පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වැනි වගන්තියේ 3 වන උපවගන්තිය අනුව 2016.11.18 වන දින අංක 1994 *ගැසට් පත්‍රයේ* පළ කළ 2016ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 1162 යටතේ ගත් තීරණය අනුව 2015 දෙසැම්බර් මස 28 වැනි දින අංක 1947/6 යටතේ පළ කළ සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ 10 වන අතුරු ව්‍යවස්ථාවේ 8 වගන්තියේ සඳහන් පරිදි ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි පහත අංක 02 උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අයකළ යුතු බව යෝජනා කරමි.

02 උපලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග අඩි ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	එකට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
02	රෙදි ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250 0	350 0	500 0
		3 ට වැඩි	3 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	එකට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	එකට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	එකට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	එකට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750 0	850 0	1,000 0
		1 ට වැඩි	එකට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500.00 බැගින්		

12-81/8

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 වැනි වගන්තියේ (1), 2(1), (3) වැනි උපවගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද

බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1.x යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 වැනි වගන්තියේ (1), (2) 1, (3) වැනි උපවගන්ති ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රසිද්ධ මංමාවත්වල අයාලේ යන ගවයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමටත් ඒ සඳහා අංක 01 උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමටත් යෝජනා කරමි.

උපලේඛනය අංක 01

		රු. ශත
(අ)	අයාලේ යන එක් ගවයෙකු සඳහා එක් දිනකට	500 0
(ආ)	වැඩි වන සෑම දිනකටම	100 0 බැගින්
(ඇ)	අල්ලන ගවයෙකු දින 10ක් ඇතුළත අයිතිකරු විසින් නිදහස් කරගනු නොලැබුවහොත් සභාව මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදල් සභා අරමුදලට යොදවනු ලැබේ.	

12-81/9

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා මෝටර් වාහන නැවතුම්පල බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 122 වැනි වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1.xi යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 122 වැනි වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලනය, පළාත් පරිපාලනය, අධ්‍යාපන, ප්‍රවාහන, රැකී රක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍යතුමන් විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව අනුව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් එම බල ප්‍රදේශයේ අනුමත

කරන ලද මෝටර් වාහන නැවතුම්පලවල, ස්ථානවල මෝටර් වාහන නවතා තැබීම වෙනුවෙන් පහත 01 වැනි උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

01 උපලේඛනය

		රු. ශත
(අ)	ලොරියක් හෝ පුද්ගලික බස් රථයක් හෝ මෝටර් කෝච් රථයක් සඳහා	500 0
(ආ)	ටැක්සි රථයක් හෝ වෙනත් මෝටර් රථයක් සඳහා	300 0
(ඇ)	ත්‍රිරෝද රථයක් සඳහා	250 0
(ඈ)	මෝටර් බයිසිකලයක් සඳහා	100 0

12-81/10

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සේවා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. 1 xii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවාගේ ඉන්දක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා සේවාවන් සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2019 වර්ෂය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

1. *අයදුම්පත්‍ර ගාස්තු :*	*රු. ශත*
1. දේපල හිමිකම් සහතික නිකුත් කිරීම (අධිකරණ කටයුතු සඳහා)	100 0 (වර්ෂයකට)
2. පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු	10 0
3. පුස්තකාල සාමාජික ගාස්තු	75 0
4. පුස්තකාල සාමාජික ගාස්තු අළුත් කිරීම	25 0
5. ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ අයදුම්පත්	800 0
6. ඉඩම් අනුබෙදුම් සඳහා සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය	250 0
7. අනතුරුදායක ගස් කපා ඉවත් කිරීමේ අයදුම්පත්‍රය	250 0
8. නොපවරාගැනීමේ සහතික ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍රය	50 0
9. වීථිරේඛා සහතික ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍රය	50 0
10. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍ර	300 0
11. ක්‍රීඩාපිටිය වෙන් කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර	50 0

2. *සහතික ගාස්තු :*	*රු. ශත*
1. දේපල හිමිකම් සහතික ගාස්තු	250 0
2. තක්සේරු දැන්වීමේ පිටපතක් නැවත නිකුත් කිරීමේ ගාස්තු	100 0
3. වීථිරේඛා සහතික ගාස්තු	250 0
4. නොපවරාගැනීමේ සහතික	250 0
3. *කොඩි කණු ගාස්තු :*	
කොඩි කණු එකක් සඳහා ගාස්තු	25 0
ඒ සඳහා ආරක්ෂිත ඇප තැන්පතු	25 0
කොඩි එකක් සඳහා ගාස්තු	10 0
ඒ සඳහා ආරක්ෂිත ඇප තැන්පතු	10 0
4. *ගලිබවුසරයේ සේවා සැපයීමේ ගාස්තු :*	
ලීටර් 4000 ගලි බවුසරයේ සේවා සැපයීම බලප්‍රදේශය ඇතුළත (එක් ගමන් වාරයක් සඳහා)	6,000 0
ප්‍රවාහනය කි. මී. 1ක් සඳහා	550 0
වැඩිවන කි. මී. 1ක් සඳහා	110 0
5. *ආදාහනාගාර සඳහා ගාස්තු :*	
බල ප්‍රදේශය තුළ ආදාහනාගාර ගාස්තු	6,000 0
බල ප්‍රදේශයෙන් පිටත අයෙකු සඳහා ආදාහනාගාර ගාස්තු	7,000 0
6. *JCB යන්ත්‍ර කුලියට දීම සඳහා ගාස්තු :*	
මීටර් පැයක් සඳහා	2,300 0

7. *ක්‍රීඩාපිටිය වෙන් කිරීම සඳහා ගාස්තු :*

කාර්යය	*අය කිරීම රු.*	*තැන්පතු රු.*
ප්‍රවේශ පත්‍ර අලෙවිකර පවත්වන සංගීත සංදර්ශනය	20,000.00+ සේවා ගාස්තු රු. 5,000.00	10,000.00
විවිධ වැඩසටහන් (ආදායම් උපදවන්නේ නැති)	5,000.00+ සේවා ගාස්තු රු. 2,000.00	5,000.00
ව්‍යාපාරික ප්‍රදර්ශන	15,000.00+ සේවා ගාස්තු රු. 5,000.00	10,000.00 වැඩිවන දිනකට රු. 5,000.00
ප්‍රවේශ පත්‍ර අලෙවි නොකර පවත්වන සංගීත සංදර්ශනය	5,000.00+ සේවා ගාස්තු රු. 5,000.00	10,000.00
වේදිකාව සඳහා	10,000.00	5,000.00
මුදල් අයකර පවත්වනු ලබන ක්‍රීඩා තරඟ	2,000.00+ සේවා ගාස්තු රු. 2,000.00	5,000.00
මුදල් අය නොකර පවත්වනු ලබන ක්‍රීඩා තරඟ	1,000.00+ සේවා ගාස්තු රු. 2,000.00	5,000.00

වැඩිවන දිනකට ගාස්තු රු. 1,000 0

08. *ශ්‍රවනාගාරය වෙන් කිරීම සඳහා ගාස්තු :*

කාර්යය	*අය කිරීම රු.*	*තැන්පතු රු.*	*සේවා ගාස්තු*
මංගල උත්සව පිටතින් ආහාර පිසගෙන එන පදනම මත	දිනකට රු. 10,000.00	5,000.00	2,000.00
ව්‍යාපාරික ප්‍රදර්ශනය	දිනකට රු. 8,000.00	5,000.00	2,000.00
චිත්‍රපට/නාට්‍ය/දේශන/සම්මන්ත්‍රණ (මුදල් අය නොකර සිදු කරන)	දිනකට රු. 3,500.00	3,000.00	2,000.00
චිත්‍රපට/නාට්‍ය/දේශන/සම්මන්ත්‍රණ (මුදල් අය කර සිදු කරන)	දිනකට රු. 5,000.00	3,000.00	2,000.00
ආගමික හා අධ්‍යාපනික වැඩසටහන්	මුදල් අය නොකෙරේ.	5,000.00	2,000.00
වෙනත්	දිනකට රු. 5,000.00	3,000.00	2,000.00
රාජ්‍ය ආයතන සඳහා රු. 3,500 0			

වැඩිවන දිනකට තැන්පත් මුදල රු. 1,000.00
විදුලි ඒකකයකට රු. 100.00
වේදිකාව ආලෝකකරණ පද්ධතිය දිනකට රු. 5,000.00

ශාලාව වෙන් කිරීම රාත්‍රී 8.00 දක්වා පමණි.

9. *ජල නළ එලීම :*

තැන්පත් රු. 5,000.00
සේවා ගාස්තු රු. 2,000.00

12-81/11

තංගල්ල නගර සභාව

වරිපනම් බදු පැනවීම

2019 වර්ෂය

තංගල්ල නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04/03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන්,
සභාපති,
තංගල්ල නගර සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 160 (1) වගන්තියෙන් තංගල්ල නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිශ්චල දේපල සඳහා වරිපනම් බද්දක් පනවා අය කළ හැකි ය. එකී පනතේ 166 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2013 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්, එකී වාර්ෂික වටිනාකමින්,

* නේවාසික ස්ථානවලට සියයට දහයක (10%) ප්‍රතිශතයක් වන වරිපනම් බද්දක් ද,
* වෙළඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානවලට සියයට පහළොවක (15%) ප්‍රතිශතයක් වන වරිපනම් බද්දක් ද,

2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් ඒ වරිපනම් බදු නගර සභා ආඥාපනතේ 170 වන වගන්තිය සමඟ කියවිය යුතු මහනගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත්,

2019 වර්ෂයට අවශ්‍ය මුළු වරිපනම් බද්ද වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර ගෙවනු ලැබුව හොත් සියයට දහයක (10%) ක වට්ටමක් ද කාර්තුවක් තුළ පලමු මාසයේ අවසන් දිනට පෙර ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද, ගෙවනු ලබන බවටත් නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 170 වන වගන්තිය සමඟ කියවිය යුතු මහ නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරයේ) 255 (අ) වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන බලපත්‍රයක් යටතේ, ඉහත වරිපනම් බද්ද නියමිත කාර්තුව තුළ නොගෙවනු ලැබුවහොත් එම ගෙවනු ලැබිය යුතු කාර්තුවට අදාළ වරිපනම් බදු මුදලෙන් මුඩු ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් සියයට පහළොවක් (15%) සහ මුඩු ඉඩම් හා වාසස්ථාන නොවන දේපළ වෙනුවෙන් සියයට විස්සක (20%) ගාස්තුවක් අය කිරීමටත් තංගල්ල නගර සභාව යෝජනා කරන්නී ය.

12-80/1

තංගල්ල නගර සභාව

ජනතා පොළ වෙළඳුන්ගෙන් බදු අය කිරීම

2019 වර්ෂය

තංගල්ල නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04/03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන්,
සභාපති,
තංගල්ල නගර සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය වන නගර සභා ආඥාපනත යටතේ සහ 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල උපනීති පනත මගින් තංගල්ල නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2019 වර්ෂය ඇතුලත තංගල්ල ජනතා පොළ, වෙළඳාම් කරනු ලබන වෙළෙඳුන්ගෙන් භාණ්ඩ විකුණුම් මිලෙන් සියයට තුනක (3%) ක ගාස්තුවක් සහ අමතර බදු වශයෙන් සංචාරක හා තාවකාලික ලෙස පොදු වෙළඳපොල වෙළඳාම් කරනු ලබන වෙළඳුන්ගෙන් භාණ්ඩ විකුණුම් මිලෙන් සියයට තුනක (3%) ක මුදලක් පනවා අය කිරීමටත් තංගල්ල නගර සභාව මගින් යෝජනා කරන්නීය.

මෙහි ජනතා පොල (සති පොළ) පැවැත්වෙන භූමිය යනු තංගල්ල නගර සභාව විසින් භුක්ති විඳින සහ පරිපාලන කටයුතු කරගෙන යනු ලබන තංගල්ල ප්‍රාදේශීය ලේකම් හාරයේ ඇති ජයසිංහවත්ත නමැති ඉඩමේ පිහිටි ප්‍රදේශය මහජන පොළ ගොඩනැගිල්ල හා ඒ අවට ඇති එහි හිස් භූමි කොටස් වන අතර මීට ප්‍රවේශ මාර්ගයන් අයත් නොවේ.

මෙහි පොදු වෙළඳ පොල ලෙස තංගල්ල නගර සභාව විසින් අවසර ලබා දී ඇති තංගල්ල නගර සභා බල ප්‍රදේශයේ ඕනෑම මාර්ගයක හා/හෝ ඕනෑම පොදු ඉඩමක හා/හෝ නගර සභාවට අයත් පොදු වෙළඳ පොල (මාර්කට් එක) ඇතුලත නගර සභාව මඟින් බදු දී නැති තංගල්ල නගර සභාවේ අවසරය ලබා ගත් වෙළඳාම් කරන ස්ථාන අමතර බදු එකතු කරන ප්‍රදේශයක් බවට තීරණය කරනු ලැබේ.

12-80/2

තංගල්ල නගර සභාව

රථ වාහන හා සත්ව බද්ද පැනවීම

2019 වර්ෂය

තංගල්ල නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04/03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන්,
සභාපති,
තංගල්ල නගර සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 163 වන වගන්තියේ සඳහන් විධිවිධාන වලින් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂය තුළදී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහන හෝ සතුන් තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II වන තීරුවේ නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී වාහන හෝ සතුන් තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2019 වර්ෂය සඳහා මෙම බද්ද පනවා අය කිරීමටත් තංගල්ල නගර සභාව විසින් යෝජනා කරන්නීය.

උපලේඛනය

	I වන තීරුව	*II වන තීරුව* *රු. ශත*
1.	මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත්කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
02. (i)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	10 0
	(ආ) එය වෙළඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම්	5 0
(ii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iii)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(iv)	සෑම රික්ෂෝවක්ම සඳහා	7 50
(v)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	20 0
(vi)	සෑම අලියෙකුම සඳහා	50 0

12-80/3

තංගල්ල නගර සභාව

කර්මාන්ත බදු පැනවීම

2019 වර්ෂය

තංගල්ල නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04/03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන්,
සභාපති,
තංගල්ල නගර සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 අ (1) වන වගන්තියෙන් තංගල්ල නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධානයට හෝ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ මෙහි පහත උපලේඛනයේ I කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් තංගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේදී කරගෙන යනු ලබන අවස්ථාවක එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ 2 කොටසේ I තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක II වන තීරයේ අනුරූප සටහනේ නිරූපිත මුදල් ප්‍රමාණය අනුව කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී කර්මාන්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර තංගල්ල නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට තංගල්ල නගර සභාවට යෝජනා කරන්නීය.

I උපලේඛනය

1 කොටස

1. ඇඳුම් මැසීමේ ස්ථානයක් (ටේලර් සාප්පුවක්) මැෂින් 03කට නොවැඩි ස්ථානයක් පවත්වාගෙන යාම
2. ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3. ශීතකරණ අළුත්වැඩියා කිරීම
4. විදුලි උපකරණ අළුත්වැඩියාව
5. මල් පැල තවාන් කිරීම හා විකිණීම
6. සුරතල් මසුන් ඇතිකිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

2 වන කොටස

	I *වන තීරුව* *වාර්ෂික වටිනාකම*	*II* *වන තීරුව* *බලපත්‍ර ගාස්තුව* රු. ශත
1.	රු. 750 නොඉක්මවන අවස්ථා	500 0
2.	රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට	750 0
3.	රු. 1,500 ඉක්මවන විට	1,000 0

තංගල්ල නගර සභාව

ව්‍යාපාර බදු පැනවීම

2019 වර්ෂය

තංගල්ල නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04/03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන්,
සභාපති,
තංගල්ල නගර සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ විධි විධාන යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන හා/හෝ නගර සභා ආඥාපනතේ 165 ආ වගන්ති ප්‍රකාරව තංගල්ල නගර සභාව විසින් කිසිම බද්දකට යටත් කර ප්‍රකාශයට පත් කර නොමැති පහත I වන උපලේඛණයේ I කොටසේ සඳහන් වෙළඳ ව්‍යාපාර ඇතුළු වෙළඳ ව්‍යාපාරයක් තංගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වා ගෙනු යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ''ලැබීම්'' (පිරිවැටුම්) වලින් පහත I උපලේඛනයේ 2 වන කොටසේ සඳහන් පරිදි I වන තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි II වන තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර තංගල්ල නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට තංගල්ල නගර සභාව යෝජනා කරන්නීය.

I උපලේඛනය

1 කොටස

01.	පෞද්ගලික බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම (ඩිස්පැන්සරියක්)
02.	පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් (රජයේ ආධාර නොලබන) පවත්වාගෙන යාම (ළදරු පාසල් හැර)
03.	ගණකාධිකරණ විගණන ආයතනයක් පවත්වාගෙන යාම
04.	ගෘහ නිර්මාණ ශිල්ප ආයතනයක් පවත්වාගෙන යාම
05.	රේස් වැඩපළක් පවත්වාගෙන යාම
06.	ඒජන්සි වැඩපළක් පවත්වාගෙන යාම
07.	පුවත්පත් නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
08.	උත්සව සඳහා පුටු, වෙනත් භාණ්ඩ කුළියට දෙන ස්ථානයක්
09.	සිනමා ශාලාවක් පැවැත්වීම
10.	දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
11.	රූපවාහිනී විස්තර ප්‍රකාශ සහිත රේස් ඔට්ටු තබන ස්ථානයක් පැවැත්වීම
12.	ලොතරැයි අලෙවි නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
13.	විදේශ රැකියා ඒජන්සිකරුවකු ලෙස ස්ථානයක් පවත්වාගෙන යාම
14.	රියදුරු පුහුණු පාසලක් පැවැත්වීම
15.	උත්සව කටයුතු වීඩියෝ කිරීම හා ඡායාරූප ගත කිරීමේ සේවය
16.	කොමිස් නියෝජිතයන් විසින් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
17.	වෙන්දේසිකරුවන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
18.	බ්‍රෝකර්වරුන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
19.	කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
20.	උකස් බඩු ගන්නවුන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
21.	ගණකාධිකරුවන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
22.	ප්‍රවාහන නියෝජිතයන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම

23. ආනයන හා අපනයන ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
24. ඉංජිනේරුවරුන් (පෞද්ගලික) ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
25. මිනින්දෝරුවන් (පෞද්ගලික) ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
26. රක්ෂණ නියෝජිතයන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
27. මුදල් සපයන්නන්/මුදල් ණයට දෙන්නන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
28. බැංකු රක්ෂණ හා මූල්‍ය ආයතන
29. 1988 අංක 30 දරන පනත යටතේ බැංකු සේවාවක් පවත්වාගෙන යාම
30. 1942 අංක 13 දරන උකස් ගන්නන් පිළිබඳ ආඥාපනත යටතේ උකස් තැබීම
31. 2006 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත යටතේ කල්බදු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
32. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ මුදල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
33. විද්‍යුත් මූල්‍ය ගණුදෙනු පවත්වාගෙන යාම (Teller Machine)
34. විදේශ රැකියා නියෝජිත ආයතන
35. චන්ද්‍රිකා තාක්ෂණය මගින් රේස් ඔට්ටු පොළක් පැවැත්වීම
36. වෙළඳ ද්‍රව්‍ය අපනයනය සඳහා ස්ථාන පවත්වාගෙන යාම
37. දුරකථන කුටි පවත්වාගෙන යාම
38. දුරකථන විකිණීම හා සේවා සැපයීමේ ස්ථාන
39. නියෝජිත තැපැල් හලක් (පුද්ගලික)
40. (මුද්‍රණාලයක් නොවන) නවීන තාක්ෂණික හා උපකරණ මගින් මුද්‍රණ කටයුතු සිදුකරන ස්ථානයක්
41. අන්තර්ජාල පහසුකම් භාවිතා කිරීමේ ස්ථානයක්
42. පුවත්පත් හෝ පොත් පත් විකිණීමේ ස්ථානයක්
43. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක්
44. අරක්කු, බියර්, රටබීම ආදිය ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. රාජ්‍ය නොවන සංවිධානයක් පවත්වාගෙන යාම
46. මෝටර් රථ වාහන විකිණීමේ ස්ථානයක්
47. වීදුරු විකිණීමේ ස්ථානයක්
48. ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක්
49. පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක්
50. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක්
51. පිඟන්, පිඟන් ගඩොල් හෝ නාන කාමර උපකරණ විකිණීමේ ස්ථානයක්
52. සිල්ලර වෙළඳ ස්ථාන
53. සාප්පු බඩු සහිත සිල්ලර වෙළඳ ස්ථාන
54. යකඩ බඩු, තීන්ත වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හෝ විකිණීම
55. තේ. කි. ග්‍රෑ. 250 ට වඩා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. ඉංග්‍රීසි බෙහෙත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ෆාමසි)
57. සිංහල බෙහෙත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. මෝටර් සයිකල් ගබඩා කිරීම හා විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
59. ක්ෂණික ඡායා පිටපත් ලබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. සිසිල් බීම ග්‍රෝස් පහකට වඩා ගබඩා කරන හෝ විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
61. ගීත පටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම
62. සිරප්, හකුරු, හෝ බීම වර්ග විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
63. ටයර් විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
64. පයිබර් ග්ලාස් ද්‍රව්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
65. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
66. කෘෂි රසායන ද්‍රව්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
67. ටයර්, ටියුබ් බැටරි විකිණීම
68. තොග හා සිල්ලර සහල් විකිණීම
69. ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ හා අමතර කොටස් විකිණීමේ ස්ථානයක්
70. පරිගණක යන්ත්‍ර උපාංග (අමතර කොටස්)
71. පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ හා අමතර කොටස් විකිණීමේ ස්ථානයක්

72. සෙවිලි තහඩු සේවා සහ අමතර කොටස් විකිණීම
73. කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
74. සාප්පු බඩු, රෙදිපිළි, මැසූ ඇඳුම් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
75. සාප්පු බඩු, සුවඳ විලවුන් හා මණිබඩු විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
76. සාප්පු බඩු, සුවඳ විලවුන් හා මණිබඩු සහිත දුම්කොළ, සුරුට්ටු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77. ධීවර ආම්පන්න විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
78. පොත්පත් සඟරා ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. රෙදිපිළි, මැසූ ඇඳුම් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
80. විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81. බෝට්ටු එන්ජින් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. සිගරැට් තොග ගබඩා කිරීමේ හා/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. මහන මැෂින් වෙළඳ සැලක් පවත්වාගෙන යාම
84. පිඟන් භාණ්ඩ හා වීදුරු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85. ගොඩනැගිළි ද්‍රව්‍ය සහ සිමෙන්තියෙන් සාදන ලද ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86. පාවහන් වෙළඳ සැලක් පවත්වාගෙන යාම
87. ඉංග්‍රීසි බෙහෙත් වර්ග සහ ග්‍රොසරියක් පවත්වාගෙන යාම
88. වෙළඳ සමාගමකට අයත් බඩු බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. ඇස් කණ්නාඩි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90. පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91. ජංගම දුරකතන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
92. රෙදි කැබලි වශයෙන් හා කිරා තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
93. ඉටිරෙදි, පොලිතීන් වර්ග, බෑග් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
94. මෝටර් රථ හෝ ත්‍රී රෝද රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
95. පරණ යකඩ, පිත්තල බෝතල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
96. බහාළුම් ප්‍රවාහන ස්ථානයක් පවත්වාගෙන යාම
97. ස්වර්ණාභරණ වෙළඳ සැලක් පවත්වාගෙන යාම
98. විදුලි සැපයුම් කාර්යාලයක් පවත්වාගෙන යාම
99. ජල සැපයුම් කාර්යාලයක් පවත්වාගෙන යාම
100. දුරකතන සැපයුම් කාර්යාලයක් පවත්වාගෙන යාම
101. පෙර පාසලක් පවත්වාගෙන යාම
102. මංගල උත්සව භාණ්ඩ බදුදීමට හා සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
103. විදුලි සංදේශ (දුරකතන) සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යාම

2 කොටස

	I වන තීරයේ	*II වන තීරයේ*
	බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02.	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0 (අනූවයි)
03.	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0 (එකසිය අසූවයි)
04.	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0 (තුන්සිය හැටයි)
05.	රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන විට	1,200 0 (එක්දහස් දෙසීයයි)
06.	රු. 150,000 ඉක්මවන විට	3,000 0 (තුන්දහසයි)

තංගල්ල නගර සභාව

ව්‍යාපාර/කර්මාන්ත/බලපත්‍ර නිකුත් කිරීම හා බලපත්‍ර ගාස්තු පනවා අය කිරීම - 2019 වර්ෂය

තංගල්ල නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04/03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන්,
සභාපති,
තංගල්ල නගර සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරිය වන නගර සභා ආඥාපනත ප්‍රකාරව තංගල්ල නගර සභාව විසින් සම්පාදනය කර ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හා/හෝ 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල (ආදර්ශ උපනීති පිළිබඳ) පනත ප්‍රකාරව සම්පාදනය කර ප්‍රකාශයට පත් කරන ලද උපනීති යටතේ තංගල්ල නගර සභාව විසින් 2019 වර්ෂය තුළ නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමඟ කියවිය යුතු 164 වන වගන්තියෙන් නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මෙහි පහත I උපලේඛනයේ 1 වන කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් 2019 වර්ෂයේදී කරගෙන යනු ලබන අවස්ථාවක එම කර්මාන්තය හෝ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා තංගල්ල නගර සභාවේ බලපත්‍රයක් ලබා ගත යුතු බවත්, එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන් ම එකී කර්මාන්තය හෝ ව්‍යාපාරයක් කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම I උපලේඛනයේ 3 වන කොටසේ 1 වන තීරුවේ ඇතුළත් වාර්ෂික වටිනාකම් ප්‍රමාණයන් අතර, පවත්නා අවස්ථාවක එහි 2 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 164 (අ) වන වගන්තියේ බලතල ප්‍රකාරව පනවා අය කිරීමට සුදුසු බවටත්,

එම කර්මාන්තයේ හෝ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගත යුතු බවට අණ පනත් වලින් කර ඇති නියමයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් පහත දැක්වෙන I වන උපලේඛනයේ 2 වන කොටසේ සඳහන් සියලුම ව්‍යාපාර සහ කර්මාන්ත සඳහා බලපත්‍ර නිකුත් කිරීමට 1952 හය (06) වැනි අංකය දරන පළාත් පාලන මණ්ඩල උප නීති පනත පිළිගැනීමටත් එකී උප නීති පනතේ VIII වැනි කාණ්ඩයේ උප නීති යටතේ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර අප්‍රිය වූ ද අන්තරායදයක වූද කර්මාන්ත ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවටත් එකී බලපත්‍ර ලබා ගැනීමට යටත් සෑම තැනැත්තෙකු ම එකී බලපත්‍ර ගාස්තුව 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර තංගල්ල නගර සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරන්නීය.

I උපලේඛනය

1 වන කොටස

බලපත්‍ර ගාස්තුවක් ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්ත හෝ ව්‍යාපාර (නගර සභා සම්මත පොදු අතුරු ව්‍යවස්ථාව වන 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල උපනීති පනත මගින් නම් කර ඇති කර්මාන්ත හෝ ව්‍යාපාර)

1. බේකරියක් පවත්වාගෙන යාම
2. බත්කඩ, තේ, කෝපි කඩ
3. භෝජනාගාර
4. භෝජන ශාලා
5. ලැගුම්හල්
6. සිසිල් බීම කර්මාන්ත ශාලා
7. අයිස් කර්මාන්ත ශාලා
8. කිරි පට්ටි හා කිරි විකිණීම
9. කරණවැමී මැදිරි හා බාබර් සාප්පු
10. මාළු විකිණීම
11. මස් විකිණීම
12. හරක් ගාල්
13. පොදු මාර්කට්
14. පුද්ගලික මාර්කට් හා බලයලත් වෙනත් ස්ථාන

2 වන කොටස

බලපත්‍ර ගාස්තුවක් ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්ත හෝ ව්‍යාපාර (නගර සභා සම්මත පොදු අතුරු ව්‍යවස්ථාව වන 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල උප නීති පනතේ VIII වැනි කාණ්ඩයේ උපනීති හා විධිවිධාන අනුව නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද අප්‍රිය වූ ද අන්තරායදායක වූ ද කර්මාන්ත හෝ ව්‍යාපාර)

01. ගැලුම් 50 ට වැඩියෙන් පොල්තෙල් ගබඩා කිරීම
02. සුරුට්ටු නිපදවීම
03. තලතෙල් නිපදවීම
04. ගිනිකුරු නිපදවීම
05. ගෝනි ගබඩා කිරීම
06. විදුලිය වැඩපලක් පවත්වාගෙන යාම
07. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
08. එළවළු පළතුරු ව්‍යාපාර බදුවලට විකුණන කඩයක් පවත්වාගෙන යාම
09. සුන්බුන් ලෝහ ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා/හෝ සැකසීමේ මධ්‍යස්ථානයක්
10. ස්වර්ණාභරණ නිපදවීමේ වැඩපළක්
11. යකඩ වැඩපොළක් පවත්වාගෙන යාම
12. ලුණු දැමූ මාළු සකස් කිරීමේ හා/හෝ ගබඩා කිරීමේ ස්ථානයක්
13. කරවල සකස් කිරීමේ හා/හෝ ගබඩා කිරීමේ ස්ථානයක්
14. යන්ත්‍රානුසාරයෙන් මිරිස් කුඩු කිරීම
15. බුරුසු සැකසීම
16. අඟුරු සඳහා දර හෝ පොල්කටු පිළිස්සීම
17. දහ දෙනෙකුට වැඩි එළු පට්ටියක් පවත්වා ගෙන යාම හා/හෝ විකිණීම
18. රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19. පශු වෛද්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම
20. බීඩි නිපදවීම
21. සිගරට් නිපදවීම
22. අඟුරු ගබඩා කිරීම
23. ගිනියම් කර පෑස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. ටයර් හා ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. මෝටර් රථ වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26. දර සකස් කර විකිණීම හා/හෝ ගබඩා කිරීම
27. දැව සකස් කර විකිණීම හා/හෝ ගබඩා කිරීම
28. ඇසිටික් ඇසිඩ් ගබඩා කිරීම
29. ගල්, උළු, ගඩොල් හෝ කබුක් ගබඩා කිරීම
30. බෝර ගසා ගල් කැඩීම
31. ඉලෙක්ට්‍රෝ ප්ලේට් කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම
32. බෝට්ටු සාදන ස්ථානයක් පවත්වාගෙන යාම
33. කෘතිම පොහොර වර්ග ඇසුරුම් කර ගබඩා කර තබා ගැනීම
34. කෘතිම පොහොර වර්ග නිපදවීම
35. හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
36. පුවක් වියළීම
37. සබන් නිපදවීම
38. කෙඳිවර්ග නිපදවීම
39. කෙඳිවර්ග ගබඩා කිරීම
40. කෙඳිවර්ග සායම් කිරීම
41. හුණු හම් හෝ ඇටකටු හෝ කෘතිම පොහොර සෑදීම පිණිස පාවිච්චි කරනු ලබන 500 ගෝනි එකකට වඩා ගබඩා කිරීම
42. කොප්පරා වේළීම
43. පොල්තෙල් නිපදවීම
44. කපාපු පොල් නිපදවීම
45. හුණු පෝරණුවක් පවත්වාගෙන යාම
46. ලී ඉරීම

47. සිසිල් බීම නිපදවීම
48. අයිස් නිපදවීමේ කර්මාන්ත ශාලාවක්
49. අයිස් හා සිසිල් බීම නිපදවීම
50. පැඟිරිතෙල් නිපදවීම හා ගබඩා කිරීම
51. පුළුන් හෝ පිදුරු ගබඩා කිරීම
52. සිමෙන්ති ගබඩා කිරීම
53. කොප්පරා ගබඩා කිරීම
54. අයිස්ක්‍රීම් සෑදීම
55. රසකැවිලි හෝ පිසූ ආහාර නිෂ්පාදනය කරන ස්ථානයක්
56. රස කැවිලි හෝ දොදොල් නිපදවීමේ හා/හෝ විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
57. මැණික් ගල් මිලදී ගැනීම, නිපදවීම හා /හෝ කැණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
59. කම්මල් ලිපක් හා/හෝ වෑල්ඩිං යන්ත්‍ර සහිත වැඩපළක් පවත්වාගෙන යාම
60. ලියවන පට්ටලයක් හා/හෝ වෑල්ඩිං යන්ත්‍ර සහිත වැඩ පළක් පවත්වාගෙන යාම
61. බලවේග යන්ත්‍රානුසාරයෙන් රෙදි වියන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
62. අත් යන්ත්‍රානුසාරයෙන් (මැෂින් 01 ක් හෝ ඊට වැඩි) රෙදි විවීම හා සායම් දැමීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
63. සම් භාණ්ඩ නිෂ්පාදනය, අළුත් වැඩියාව හා/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
65. ගෘහ භාණ්ඩ සෑදීම හා/හෝ විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
66. පොකිරිස්සන්, ඉස්සන් තැම්බීම හා/හෝ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
67. කුෂන් වැඩපොළක් පවත්වාගෙන යාම
68. මෝර වරල් සකස් කිරීම හා/හෝ ගබඩා කර තබා ගැනීම
69. කුකුලන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. මිරිස්, තුනපහ, ධාන්‍ය පැකට් කිරීම හා/හෝ විකිණීම කරන ස්ථානයක්
71. පානීය ජලය බෝතල්ගත කර බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72. ඇඳුම් නිෂ්පාදනය කිරීමේ මැෂින් 03 කට වැඩි ස්ථානයක් පවත්වාගෙන යාම
73. මීනී පෙට්ටි සෑදීම හා/හෝ අවමංගල්‍ය භාණ්ඩ සෑදීම හා/හෝ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
74. රසායනාගාර සේවය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
75. මනාලියන් හැඩගැන්වීමේ උපකරණ සැකසීමේ හා/හෝ හැඩ ගැන්වීම කරන ආයතනයක් පවත්වාගෙන යාම
76. දත් බැඳීම හා/හෝ පිරිසිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77. පෞද්ගලික ආරෝග්‍ය ශාලාවක් පවත්වාගෙන යාම
78 පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. කොන්ක්‍රීට් (පෙර නිමි ද්‍රව්‍ය) වැඩපලක් පවත්වාගෙන යාම
80. ගෑස් විකිණීමේ නියෝජිත ආයතනයක්
81. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. බුලත්, පුවක් සැපයීම හා ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. ස්නැක්බාර් එකක් පවත්වාගෙන යාම
84. තේ කුඩු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85. පොල් තෙල් ගබඩා කිරීමේ හෝ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
86. ලිහිසි තෙල් බෙදහැරීමේ හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක්
87. ඉස්සන් මිළදීගෙන සකස් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. දේශීය හා විදේශීය මත්පැන් අලෙවිසැලක් පවත්වාගෙන යාම (නියෝජිත අලෙවිසැල්)
89. පා පැදි අළුත්වැඩියා කරන ස්ථානයක්
90. යතුරු පැදි අළුත්වැඩියා කරන ස්ථානයක්
91. ඩීසල් වාහනවල ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියා කිරීම
92. බණිජ තෙල් සේවා කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම
93. ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම
94. සත්ව සායන පවත්වාගෙන යාම
95. හෙද විදුහලක් පවත්වාගෙන යාම
96. ටයර් නැවත පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
97. පැණි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98. ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

99.	සම් නිෂ්පාදන ආයතනයක් මඟින් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය, උපකරණ හෝ බඩු විකිණීම සඳහා නියෝජිත ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම (අලෙවි නියෝජිත)
100.	මස් හා මාළු සකස් කිරීම හෝ වේලීම
101.	රබර් වියලා සකස් කිරීම
102.	දහ දෙනෙකුට වැඩි එළු පට්ටියක් පවත්වාගෙන යාම
103.	වී කොටන මෝලක් මඟින් සහල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
104.	විසිතුරු භාණ්ඩ හෝ සෙල්ලම් බඩු නිපදවන හා/හෝ විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
105.	ඡායාරූප ශාලාවක් හා/හෝ පිංතූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106.	කාර්මික යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ හා විකිණීමේ ස්ථානයක්
107.	ප්‍රචාරක කටයුතු සඳහා බැනර් කටවුට් ඇඳීම හා/හෝ පාවිච්චි කිරීම
108.	අවමංගල සේවා කටයුතු පවත්වාගෙන යන ස්ථානයක් පවත්වාගෙන යාම
109.	උම්බලකඩ හොන්ඩර් 05 ට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කර ගබඩා කිරීම
110.	සමාජ ශාලාවක් පවත්වාගෙන යාම (නිෂ්පාදනය හා විකිණීම සහිත)
111.	පෞද්ගලික වෛද්‍ය සායන පවත්වන ස්ථානයක්
112.	වෙළඳ ද්‍රව්‍ය පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
113.	උපස්ථායක ස්ථානයක් පවත්වාගෙන යාම
114.	ජලය පිරිපහදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

3 වන කොටස

I වන නීරුව	*II වන නීරුව*	
වාර්ෂික වටිනාකම	*බලපත්‍ර ගාස්තුව*	
	රු. ශ.	
1. රු. 750 නොඉක්මවන අවස්ථාවක	500.00	(පන්සියයක්)
2. රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට	750.00	(හත්සිය පනහක්)
3. රු. 750 ඉක්මවන විට	1,000.00	(දහසක්)

ඉහත උපලේඛනයේ 1 වන කොටසේ සඳහන් කර්මාන්ත අතරින් අංක 3 යටතේ සඳහන් කිසියම් හෝටලයක් හෝ අංක 4 යටතේ සඳහන් කිසියම් ආපනශාලාවක් හෝ අංක 5 යටතේ සඳහන් කිසියම් නවාතැන් පොළක් හෝ ඒ හෝටලය ආපනශාලාව හෝ නවාතැන් පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක ඉහත උපලේඛනයේ 3 වන කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි හෝ 2018 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතුය.

12-80/6

තංගල්ල නගර සභාව

ආදාහනාගාරය සහ සුසාන භූමිය ගාස්තු අය කිරීම

2019 වර්ෂය

තංගල්ල නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04/03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන්,
සභාපති,
තංගල්ල නගර සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වැනි අධිකාරිය වන නගර සභා ආඥාපනතෙහි 154 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් 2013.05.17 දිනැති අංක 1811 *ගැසට් පත්‍රයේ* IV (ඇ) වැනි කොටසේ පළකර ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථා යටතේ හා/හෝ තංගල්ල නගර සභාව විසින් 2017.11.10 දිනැති අංක 2045 දරන *ගැසට් පත්‍රයෙන්* පිළිගෙන ප්‍රකාශයට පත්කර ඇති සම්මත පොදු අතුරු ව්‍යවස්ථාව යටතේ හා/හෝ තංගල්ල නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයට තංගල්ල නගර සභාවට අයත් ආදාහනාගාරය සහ සුසාන භූමිය ගාස්තු පනවා අය කිරීමට තංගල්ල නගර සභාව විසින් යෝජනා කරන්නී ය.

උපලේඛනය

ආදාහනාගාරය වෙන් කිරීම :

01. නගර සභා බල ප්‍රදේශය තුළ	රු. 6,000 0
02. නගර සභා බල ප්‍රදේශයෙන් පිටත	රු. 8,000 0

සුසාන භූමිය වෙන් කිරීම :

01. සුසාන භූමිය තුළ වල නොබැඳ මිහිදන් කිරීමේ ගාස්තු	රු. 750 0
02. භෂ්මාවශේෂ තැන්පත් කිරීමේ ගාස්තු (වර්ග අඩි 01)	රු 1,000 0
03. වල බැඳ මිහිදන් කිරීම (නියමයන් අනුව පමණි)	රු. 8,000 0

12-80/7

තංගල්ල නගර සභාව

ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අය කිරීම

2019 වර්ෂය

තංගල්ල නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04/03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන්,
සභාපති,
තංගල්ල නගර සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරිය වන නගර සභා ආඥාපනතෙහි 153 වගන්තිය 157 වන වගන්ති වලින් තංගල්ල නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභාව විසින් සාදන ලද, ඉහත කී පනතේ 154 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් 1967/08/19 වැනි දින අනුමත කළ 1967/09/22 දිනැති අංක 14767 දරන *ගැසට් පත්‍රයේ* පලකර ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථා යටතේ හා/හෝ නගර සභා ආඥාපනත යටතේ හා/හෝ තංගල්ල නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත පොදු අතුරු ව්‍යවස්ථාවන් යටතේ යම් අයෙකු විසින් තංගල්ල නගර සභා සීමාව තුළ කිනම් ආකාරයකින් හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 164 වන වගන්තියෙන් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂය සඳහා පහත උපලේඛනයේ පරිදි ගාස්තු පනවා අය කිරීමටත් තංගල්ල නගර සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

01. බැනර් වර්ග අඩියකට මාසයකට හෝ ඉන් කොටසකට	රු. 25.00
02. ප්‍රචාරක දැන්වීමක් හෝ පුවරුවක් සඳහා වර්ග අඩියකට මාසයකට හෝ වැඩි කාලයක් ප්‍රදර්ශනය කරනු ලබන විට	රු. 75.00

12-80/8

තංගල්ල නගර සභාව

ව්‍යාපාර හා කර්මාන්ත සඳහා නගර සභා අතුරු ව්‍යවස්ථා යටතේ හා නගර සභා ආඥාපනත යටතේ බලපත්‍ර ලබාගත යුතුවීම

2019 වර්ෂය

තංගල්ල නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04/03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන්,
සභාපති,
තංගල්ල නගර සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වැනි අධිකාරිය වන නගර සභා ආඥාපනත මගින් මහජනතාව වෙත දැනුම් දී ඇති පරිදි හා නගර සභා සම්මත පොදු අතුරු ව්‍යවස්ථා (1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල පනතේ උපනීති) වලින් මහජනතාව දැනුවත් කර ඇති පරිදි එම උපනීති අනුව නගර සභාව මගින් ප්‍රකාශයට පත් කර ඇති හා/හෝ තංගල්ල නගර සභාව විසින් සම්පාදනය කරන ලද අතුරු ව්‍යවස්ථා යටතේ යම් යම් ව්‍යාපාර හා කර්මාන්ත තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යාම වෙනුවෙන් තංගල්ල නගර සභාවේ සභාපතිවරයාගෙන් ලබාගත යුතු සියලු බලපත්‍ර ලබාගෙන එම ව්‍යාපාර කටයුතු කළ යුතු බව තංගල්ල නගර සභාව විසින් යෝජනා කරන්නීය.

12-80/9

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 (I) සහ (II) වගන්ති යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ඔක්තෝබර් මස 15 දින පවත්වන ලද හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ අංක 05- (I) - (x) යටතේ පහත සඳහන් යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

2018 ඔක්තෝබර් මස 15 වැනි දින,
හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (1) සහ (2) වන උපවගන්ති සහ 149 වැනි වගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යක් සඳහා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්. ආපනශාලාවක්, නවාතැන්පලක් වන විටදී ඊට අදාළ බලපත්‍ර ලබා දීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2018 වර්ෂයේ ලැබීම්වලින් (පිරිවැටුමෙන්) 01%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
අ.අ.	*බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය*	*රු. 750 නොඉක්මවන* *රු. ශත*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
1.	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	බත් කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	ආපනශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	කිරි විකිණීම	500 0	750 0	1,000 0
10.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
11.	මස් විකිණීම	500 0	750 0	1,000 0
12.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පෞද්ගලික වෙළඳපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	රූපලාවන්‍ය ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	බාබර් සැප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-131/1

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ඔක්තෝබර් 15 දින පවත්වන ලද හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ අංක 05- (I) - (x) යටතේ පහත සඳහන් යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

2018 ඔක්තෝබර් මස 15 වැනි දින,
හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන්ම එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන විට	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
අ.අ.	*රු. ශ.*	*රු. ශ.*	*රු. ශ.*
01. රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
02. කඩල, මුරුක්කු, රටකජු, බයිට්ස් වර්ග පැකට් කිරීම	500 0	750 0	1,000 0
03. පපඩම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04. බිම්මල් වගා කිරීම	500 0	750 0	1,000 0
05. පොරි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
06. දියලුණු පැකට් කිරීම	500 0	750 0	1,000 0
07. සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08. සම් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09. ගිනිකුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10. කාබනික පොහොර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11. හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12. ගඩොල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14. කෘෂි උපකරණ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
15. පහන්තිර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16. කොහු ආශ්‍රිත නිෂ්පාදනය	500 0	750 0	1,000 0
17. බ්ලොක් ගල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18. කුළු බඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19. මල් පෝච්චි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20. පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21. අත් යන්ත්‍ර මගින් ක්‍රියාකරන රෙදි විවීමේ මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. යාන්ත්‍රික නොවන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23. රෙදිපිළි මෝස්තර කිරීමේ හා පින්තාරු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25. පින්තූර රාමු කිරීමේ ස්ථානය	500 0	750 0	1,000 0
26. පොල්තෙල් සිඳීමේ මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27. මිරිස්, ධාන්‍ය වර්ග ඇඹරීමේ මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28. වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29. වාහන ටින්කරින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30. බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31. ටයර්, ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32. බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
අ.අ.		*රු. ශ.*	*රු. ශ.*	*රු. ශ.*
33.	විදුලි උපකරණ, ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	ටී බෝරින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	පානීය ජලය නිෂ්පාදනය	500 0	750 0	1,000 0
38.	කළුගල් පිපිරවීමේ වැඩපලක් සඳහා	500 0	750 0	1,000 0
39.	කළුගල් ඇඹරවීමේ වැඩපලක් සඳහා	500 0	750 0	1,000 0
40.	වාහනවල දුණු සැකසීම	500 0	750 0	1,000 0
41.	ඇඳුම් මැසීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
42.	ජංගම පරිගණක, දුරකතන අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
43.	දැව ඉරුම් හලක්	500 0	750 0	1,000 0

12-131/2

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ඔක්තෝබර් 15 දින පවත්වන ලද හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ අංක 05- (I) - (x) යටතේ පහත සඳහන් යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

2018 ඔක්තෝබර් මස 15 වැනි දින,
හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
පෙර වර්ෂයේ ආදායම	*රු. ශ.*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන	180 0
රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන	300 0
රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12-131/3

